# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ

**විදේශ විනිමය ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතීමත්, විදේශ විනිමය ගෙවීම් ඉහළ යෑමත් හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මත වූ පීඩනය 2016 වසරේ දී තවදුරටත් පැවතුණි.** විදේශීය අංශයේ පැවති පීඩනය තුළින් ගෝලීය ආර්ථිකයේ මෙන්ම දේශීය ආර්ථිකයේ ඇති වූ වෙනස්කම්වල බලපෑම පිළිබිඹු විය. ගෝලීය කරුණු සැලකීමේ දී, ඇමෙරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම, යුරෝපා සංගමය සහ ජපානය වැනි දියුණු ආර්ථිකවල මන්දගාමී ආර්ථික වර්ධනයක් පැවතීම සහ මැදපෙරදිග රටවල භූ-දේශපාලනික අස්ථාවරභාවයක් පැවතීම ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය වෙත අහිතකර බලපෑමක් ඇති කළේය. දේශීය වශයෙන් සැලකීමේ දී, ප්‍රමාණවත් තරම් විදේශීය ආයෝජන නොලැබීම, ආනයන ඉල්ලුම ඉහළ යෑම, ණය සේවාකරණ ගෙවීම් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් වූ ආපසු ගෙවීම් වසර තුළ දී විදේශීය අංශයේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සම්බන්ධයෙන් පැවති අභියෝගයන් විය.

**ජංගම ගිණුමේ හිඟය වැඩි වීමත්, මූල්‍ය ගිණුමේ ගනුදෙනු මධ්‍යස්ථ මට්ටමක පැවතීමත් හේතුවෙන් විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම 2016 වසරේ ගෙවුම් තුලනය මගින් පිළිබිඹු විය.** 2015 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 2.3 ක් වූ ජංගම ගිණුමේ හිඟය, 2016 වසරේ දී සියයට 2.4 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. විශේෂයෙන්ම, ආයෝජන භාණ්ඩ සඳහා වූ දේශීය ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් ආනයන වියදම් ඉහළ යෑමත්, ජාත්‍යන්තර වෙළඳපොළ තුළ භාණ්ඩ මිල ගණන් මෙන්ම අපනයන පරිමාව ද අඩු වීම හේතුවෙන් අපනයන ආදායම් පහළ යෑමත් සමඟ වසර තුළ දී වෙළඳ හිඟය පුළුල් විය. සංචිත වත්කම් ආයෝජනය තුළින් ලැබූ ආදායම අඩු වීම සහ පොලී ගෙවීම් ද සමඟ ප්‍රතිආයෝජනය කළ ඉපැයීම් සහ ලාභාංශ ගෙවීම් හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ද වැඩි විය. කෙසේ වෙතත්, වෙළඳ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල වූ හිඟයන්ගෙන් ඇති වූ අහිතකර බලපෑම, සේවා සහ ද්විතීයික ආදායම් ගිණුම්වල අතිරික්තයන් මගින් යම් පමණකට පියවා ගත හැකි විය. විශේෂයෙන්ම, සංචාරක ඉපැයීම් ඉහළ යෑම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය අඛණ්ඩව ඉහළ ගිය අතර, 2016 වසරේ දී මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුම ශක්තිමත් විය. මේ අතර, ණය නොවන මූලාශ්‍රවලින් වූ ලැබීම් මන්දගාමී වීම මධ්‍යයේ මූල්‍ය ගිණුම හා සම්බන්ධ ගෙවීම් ඉහළ මට්ටමක පැවතුණි. විශේෂයෙන්ම, විදේශීය සෘජු ආයෝජන අඩු මට්ටමක පැවතීම සහ විදේශීය ආයෝජකයින් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සිය ආයෝජන ඉවත් කර ගැනීම හා අඛණ්ඩ ණය වාරික සහ පොලී ගෙවීම් හේතුවෙන් වූ ප්‍රාග්ධන ගෙවීම්, 2016 වසරේ දී මූල්‍ය ගිණුම වෙත අහිතකර බලපෑමක් ඇති කළේය. ණය නොවන මූලාශ්‍රවලින් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු මට්ටමක පැවතීම සහ ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම නිසා වෙනත් විදේශ මූලාශ්‍රවලින් අරමුදල් රැස් කිරීම අවශ්‍ය විය. ඒ අනුව, ගෙවුම් තුලනයේ මූල්‍යයන අවශ්‍යතාවන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ ඒකාබද්ධ ණය පහසුකම් තුළින් සපුරා ගත් අතර, විදේශීය අංශය ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය (ජා.මූ.) අරමුදල වෙතින් තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකමක් ද ලබා ගන්නා ලදී. 2016 වසරේ පැවති මෙම ප්‍රවණතා හේතුවෙන් ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය එ.ජ. ඩොලර් මිලියන 500 ක

හිඟයක් වාර්තා කළේය. දළ නිල සංචිත ද 2016 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 6.0 ක් දක්වා පහළ ගිය අතර, එය මාස 3.7 ක ආනයනවලට සමාන විය.


**2016 වසරේ දී විදේශීය අංශයේ ගිණුම්වල සිදු වූ වෙනස්කම්, විනිමය අනුපාතිකය මත වූ දැඩි පීඩනය මගින් පිළිබිඹු විය.** දේශීය විදේශ විනිමය වෙළඳපොළට විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම මගින් 2016 වසරේ පළමු භාගයේ දී සාපේක්ෂව ස්ථාවර මට්ටමක පවත්වා ගත් විනිමය අනුපාතිකය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය සැපයීම ක්‍රමිකව සීමා කිරීමත් සමග වසරේ දෙවන භාගයේ දී ඉහළ අගයකින් අවප්‍රමාණය විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යෑමත් සමග විදේශීය ආයෝජකයින් විසින් සිය ආයෝජන ඉවත් කර ගැනීම නිසා රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වාර්තා වූ ප්‍රාග්ධන ගෙවීම් හේතුවෙන් විනිමය අනුපාතිකය වෙත වූ පීඩනය යම් ප්‍රමාණයකට ලිහිල් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසරේ දෙවන භාගයේ දී සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් සපයන ලදී. 2015 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 9.03 කින් අවප්‍රමාණය වූ රුපියල 2016 වසර තුළ දී සමස්තයක් ලෙස තවදුරටත් සියයට 3.83 කින් අවප්‍රමාණය විය. කෙසේ වෙතත්, ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරගකාරී වීම සඳහා විනිමය අනුපාතිකය තවදුරටත් අවප්‍රමාණය විය යුතුව ඇති බව පිළිබිඹු කරමින් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් 100 ට වඩා ඉහළ මට්ටමක පැවතුණි.



**විදේශ විනිමය සඳහා වන ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන්හි ඇති නොගැලපීම මගින්, විදේශීය අංශයේ පවතින අසමතුලිතතාවය වැළැක්වීම සඳහා කඩිනම් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.** අභියෝගාත්මක පරිසරයක් තුළ විදේශීය අංශයේ ස්ථායීතාව නැවත ඇති කිරීමේ දී, අනෙකුත් අංශයන්ගේ අහිතකර වර්ධනයන් තුළින් විදේශීය අංශය වෙත ඇති වන බලපෑම් අවම කිරීම සඳහා වූ ප්‍රතිපත්ති ද සමග බාහිර කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කර ගැනීම අවශ්‍ය වේ. එබැවින්, මූර්ත සඵල විනිමය අනුපාතිකයේ වෙනස්වීම්වලට අනුව විනිමය අනුපාතිකය අනුගත කිරීම හරහා වෙළඳපොළ බලවේගයන්ට අනුව රුපියලේ බාහිර අගය තීරණය වීමට ඉඩ හැරීමට අමතරව, ජාත්‍යන්තර සංචිත මට්ටම ශක්තිමත් කිරීම සඳහා කෙටිකාලීන සහ මැදිකාලීන පියවර ගැනීම අවශ්‍ය වේ. සංචිත මට්ටම ඉහළ නැංවීම සඳහා ගත හැකි කෙටිකාලීන ක්‍රියාමාර්ග වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සහ විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට එළඹීම වැනි ණය ආශ්‍රිත මූලාශ්‍ර දැක්විය හැකිය. කෙසේ වුවත්, තිරසාර පදනමක් මත විදේශීය අංශයේ ස්ථායීතාවය තහවුරු කිරීම සඳහා, ණය මූලාශ්‍ර වෙනුවට භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් සහ විදේශීය සෘජු ආයෝජන ඉහළ නැංවීම වැනි මූලාශ්‍ර තුළින් විදේශ සංචිත ඉහළ නැංවීම සඳහා වූ ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. ඒ සඳහා අපනයන පදනම විවිධාංගීකරණය කිරීම සහ ගෝලීය නිෂ්පාදන හුවමාරු දාම සමග සම්බන්ධ වීම ඉලක්ක කර ගත් පුළුල් අපනයන උපායමාර්ගයක් සකස් කිරීම අවශ්‍ය වන අතර වරණීය වෙළඳ ගිවිසුම් හරහා ගෝලීය වෙළඳපොළ වෙත පිවිසීමට ඇති හැකියාව වැඩිදියුණු කර ගත යුතුය. රටෙහි තරගකාරිත්වය වැඩිදියුණු කිරීම, ප්‍රතිපත්ති නොවෙනස්ව පවත්වා ගැනීම, ආයතනික සැකැස්ම වැඩිදියුණු කිරීම සහ සංවර්ධන න්‍යාය පත්‍රය තුළ අපනයන ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛතාවයක් ලබා දීම, අපනයන සඳහා වඩා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඉතා වැදගත් වේ. එමෙන්ම, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, දැනුම පදනම් කරගත් ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, සංචාරක කර්මාන්තය සහ නාවික සේවා වැනි අංශ හරහා සේවා අපනයනය කරන රටක් වශයෙන් පවතින ශක්‍යතාවයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා ප්‍රතිපත්ති හඳුන්වා දීම, ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ අපනයන දායකත්වය වර්ධනය කර ගැනීම සඳහා ඉතා වැදගත් වේ. එමෙන්ම, තවත් ණය නොවන විදේශ විනිමය මූලාශ්‍රයක් වන විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම දිරිමත් කිරීම සඳහා බහුවිධ ප්‍රතිපත්ති රාමුවක් ඇති කර ගැනීමට ප්‍රමුඛතාවයක් ලබා දීම ද දශක කිහිපයක් පුරා ආර්ථිකය මුහුණදෙනු ලබන ගෙවුම් තුලන අර්බුදයට පිළියම් යෙදීම සඳහා අත්‍යවශ්‍ය වේ.

**5.1 රූප සටහන**

**ගෙවුම් තුලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.1 සංඛ්‍යා සටහන**

**ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2015 (අ) | 2016 (ආ) | 2015 (අ) | 2016 (ආ) |
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **-1,883** | **-1,942** | **-257,524** | **-279,712** |
| **වෙළඳ ගිණුම** | **-8,388** | **-9,090** | **-1,141,035** | **-1,325,495** |
| අපනයන | 10,546 | 10,310 | 1,431,431 | 1,500,766 |
| ආනයන | 18,935 | 19,400 | 2,572,467 | 2,826,260 |
| **සේවා (ශුද්ධ)** | **2,325** | **2,879** | **316,170** | **423,053** |
| ලැබීම් | 6,397 | 7,138 | 869,634 | 1,039,283 |
| ගෙවීම් | 4,072 | 4,259 | 553,464 | 616,230 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,013** | **-2,184** | **-274,740** | **-317,053** |
| ලැබීම් | 127 | 120 | 17,253 | 17,530 |
| ගෙවීම් | 2,140 | 2,304 | 291,994 | 334,583 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **6,193** | **6,453** | **842,082** | **939,782** |
| ද්විතීයික ආදායම් : ලැබීම් | 7,007 | 7,260 | 952,568 | 1,057,281 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 6,980 | 7,242 | 948,957 | 1,054,489 |
| රජයේ සංක්‍රාම | 27 | 19 | 3,610 | 2,792 |
| ද්විතීයික ආදායම් : ගෙවීම් | 814 | 807 | 110,486 | 117,498 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **46** | **26** | **6,256** | **3,782** |
| ප්‍රාග්ධන ගිණුම : ලැබීම් | 71 | 46 | 9,562 | 6,795 |
| ප්‍රාග්ධන ගිණුම : ගෙවීම් | 24 | 21 | 3,306 | 3,013 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-1,836** | **-1,917** | **-251,268** | **-275,930** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,312** | **-2,117** | **-346,198** | **-307,793** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **53** | **237** | **7,199** | **34,476** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **680** | **898** | **93,528** | **131,992** |
| **විවිධ ආයෝජන : වත්කම්** | **...** | **...** | **3** | **-1** |
| ණය සුරැකුම්පත් | ... | ... | 3 | -1 |
| **විවිධ ආයෝජන : වගකීම්** | **686** | **993** | **101,935** | **144,688** |
| හිමිකම් | -60 | 24 | -8,185 | 3,684 |
| ණය සුරැකුම්පත් | 747 | 969 | 110,121 | 141,005 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **503** | **317** | **70,962** | **45,682** |
| මුදල් සහ තැන්පතු | 143 | 5 | 21,127 | 538 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 116 | -67 | 15,807 | -9,678 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 244 | 379 | 34,028 | 54,821 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **1,857** | **308** | **271,788** | **45,677** |
| මුදල් සහ තැන්පතු | 1,457 | -609 | 209,324 | -87,671 |
| ණය | 759 | 753 | 105,244 | 108,636 |
| මහ බැංකුව | -507 | -123 | -68,775 | -17,234 |
| තැන්පතු භාරගන්නා ආයතන | 787 | -507 | 107,301 | -75,495 |
| රජය | 470 | 1,287 | 66,126 | 188,365 |
| අනෙකුත් අංශ | 9 | 96 | 592 | 13,000 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -401 | 109 | -54,437 | 16,120 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 41 | 55 | 11,657 | 8,592 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **354** | **-472** | **42,890** | **-65,593** |
| මූල්‍ය රත්‍රන් | -39 | - | -5,156 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | -2 | -5 | -302 | -685 |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | 395 | -467 | 48,348 | -64,907 |
| මුදල් සහ තැන්පතු | 116 | -1,267 | 12,566 | -183,495 |
| සුරැකුම්පත් | 279 | 800 | 35,755 | 118,582 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **-476** | **-201** | **-94,930** | **-31,862** |
| **සමස්ත ශේෂය (ඇ)** | **-1,489** | **-500** | **-129,654** | **-46,013** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස** | | | | |
| වෙළඳ ගිණුම | -10.4 | -11.2 | | |
| භාණ්ඩ හා සේවා | -7.5 | -7.6 | | |
| ජංගම ගිණුම | -2.3 | -2.4 | | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -2.3 | -2.4 | | |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.11 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5.2 විදේශ වෙළඳ ප්‍රතිපත්ති, වර්ධනයන් සහ ආයතනික සහාය

**ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය, විදේශ වෙළඳාම සහ විදේශ ආයෝජන අතර සබැඳියාව ධෛර්යවත් කිරීම මගින් ගෝලීය වෙළඳපොළ සමඟ ඇති බැඳීම ඉහළ නංවා ගැනීම කෙරෙහි යොමුව පැවතිණ.** විවිධ වෙළඳ හවුල්කරුවන් සමඟ වරණීය වෙළඳ ගිවිසුම් සහ නිදහස් වෙළඳ ගිවිසුම්වලට ඇතුළත් වීම, උපායමාර්ගික වෙළඳ ප්‍රවර්ධන කටයුතු සහ යෝග්‍ය ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් හඳුන්වා දීම තුළින් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වෙළඳ ප්‍රවේශය ඉහළ නංවා ගැනීම මගින් මෙම අරමුණ ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරෙයි. වෙළඳපොළ ප්‍රසාරණය, වෙළඳාම සහ තීරුබදු තාර්කීකරණය, වෙළඳාම සඳහා පහසුකම් සැලසීම සහ අපනයනය කෙරෙහි යොමු වූ විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම මගින් අපනයන පදනම පුළුල් කිරීම සහ අපනයන සහ විදේශීය සෘජු ආයෝජන සම්බන්ධව ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය ඉහළ නංවා ගැනීම යනාදිය කෙරෙහි ජාතික වෙළඳ ප්‍රතිපත්තිය යොමු විය යුතුය. වෙළඳ පහසුකම් සැලසීම සඳහා ගනු ලබන ප්‍රතිසංස්කරණ සහ ක්‍රියාමාර්ග තුළින් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ අපනයන ප්‍රතිශතය ඉහළ නංවා ගැනීමට අපේක්ෂිත අතර, එය ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව පවත්වා ගැනීම සඳහා හේතුවනු ඇත.

**අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශ වෙළඳාම කෙරෙහි පවතින බාධක ඉවත් කිරීමේ වැදගත්කම රජය විසින් හඳුනා ගෙන ඇත.** ඒ අනුව, 2010 අගෝස්තු මාසයේ දී අත්හිටුවනු ලැබූ යුරෝපා සංගමය මගින් ලබා දෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස් සහනය) නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර, යුරෝපා වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය සම්බන්ධයෙන් යුරෝපා කොමිසම මගින් පනවන ලද තහනම ඉවත් කර ගැනීමේ අරමුණින් ජාත්‍යන්තර නීතිරීතිවලට අනුකූලව ධීවර කටයුතු සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. වාණිජ දෙපාර්තමේන්තුව විසින් යුරෝපා සංගමය, අදාළ දේශීය පාර්ශ්වකරුවන් මෙන්ම යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබා ගැනීම සඳහා පත් කළ අන්තර් අමාත්‍යාංශ අනුකාරක සභාව සමඟ තොරතුරු විමසීම් සහ සමාලෝචන රැස්වීම් මාලාවක් පවත්වන ලදී. ඒ අනුව, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් රෙගුලාසි යටතේ දක්වා ඇති ජාත්‍යන්තර සම්මුතීන් 27 ට ඇති අනුකූලතාවයත්, මෙතෙක් ලබා ඇති ප්‍රගතියත් ඇතුළත්ව සියලු අදාළ තොරතුරු ආවරණය වන පරිදි පුළුල් වාර්තාවක් සකස් කරන ලදී. මෙම පුළුල් වාර්තාව

5

සහ යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබා ගැනීමේ අයදුම්පත, ඊට අදාළ සියලුම සහායක ඇමුණුම් ද සමඟ 2016 ජූලි මාසයේ දී යුරෝපා කොමිසම වෙත භාර දෙන ලදී. යුරෝපා කොමිසම පූර්ණ සමාලෝචන ක්‍රියාවලියකින් අනතුරුව 2017 ජනවාරි මාසයේ දී යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබා දීම සඳහා යෝජනා කළ අතර, එය මානව හිමිකම්, කම්කරු අයිතීන්, පරිසර සංරක්ෂණ සහ යහපාලනයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන් 27 අනුගමනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම මත තීරණය විය. තවද, මේ සඳහා විරෝධතා ඇත්නම් ඒවා ඉදිරිපත් කිරීම සඳහා මාස 4 ක කාලයක් යුරෝපා පාර්ලිමේන්තුව වෙත ලබා දෙන ලදී. මීට අමතරව, නීතිමය නොවන, වාර්තා නොවන හා නියාමනය නොවන ධීවර කටයුතු පිළිබඳ රෙගුලාසි යටතේ යුරෝපා සංගමය වෙත කරනු ලබන ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයන සඳහා 2015 ජනවාරි සිට ක්‍රියාත්මක වන ලෙස 2014 ඔක්තෝබර් මස පැන වූ තහනම ඉවත් කර ගැනීමට රජය මගින් ගත් දැඩි උත්සාහයක ප්‍රතිඵලයක් ලෙස 2016 ජූනි මාසයේ දී එය ඉවත් කරන ලදී. යුරෝපා සංගමයේ වෙළඳපොළ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම මත්ස්‍ය අපනයන ගමනාන්තයක් වන බැවින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගන්නා ලද සුවිශේෂී පියවරක් ලෙස මෙය දැක්විය හැකිය. තහනම ඉවත් කිරීමෙන් පසුව 2016 දෙවන භාගයේ දී යුරෝපා සංගමය වෙත සිදු කළ මත්ස්‍ය අපනයනය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 110 කින් වර්ධනය වී ඇත.

**ප්‍රධාන වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය විසින් ලබා දෙනු ලබන වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයන් (ජී.එස්.පී.), 2016 වසරේ දී තවදුරටත් ක්‍රියාත්මක විය.** ශ්‍රී ලංකාව ඇතුළු ප්‍රතිලාභ ලබන රටවල් 122 ක් සඳහා භාණ්ඩ 5,000 කට ආසන්න ප්‍රමාණයකට ඇමෙරිකා එක්සත් ජනපදය වෙත තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දෙන ඇමෙරිකා එක්සත් ජනපද ජී.එස්.පී. සහනය 2015 ජූනි මාසයේ දී නැවත බලාත්මක කරන ලද අතර, එය 2017 දෙසැම්බර් 31 දක්වා වලංගු වනු ඇත. ශ්‍රී ලංකාව ඇතුළු ප්‍රතිලාභ ලබන අනෙකුත් රටවල් විසින් සියලුම ජී.එස්.පී. ප්‍රතිලාභ ලබන රටවලට බලපාන පරිදි සංචාරක භාණ්ඩ සඳහා වන තීරුබදු නිදහස් කර ගැනීම තුළින් එක්සත් ජනපද ජී.එස්.පී. සහනය තවදුරටත් පුළුල් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළ අතර, 2017 වර්ෂය තුළ දී එම අවසරය ලැබෙනු ඇතැයි අපේක්ෂිතය. තවද, යුරෝපා සංගමය වෙතින් ලබා දෙනු ලබන සාමාන්‍ය ජී.එස්.පී. සහනය ශ්‍රී ලංකාව වෙත තවදුරටත් ලැබෙන අතර, මෙමගින් ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට භාණ්ඩ 7,200 කට පමණ සහනශීලී තීරුබදු ප්‍රවේශයක් ලැබේ. මේ අතර, දියුණු වෙමින් පවතින රටවල් අතර ඇති කරගත් ගිවිසුමක් වන "ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය"[1] (Global System of Trade Preference) යටතේ ශ්‍රී ලංකාව සිදු කළ අපනයන 2015 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 49 ට සාපේක්ෂව 2016 දී එ.ජ. ඩොලර් මිලියන 45 දක්වා සුළු වශයෙන් පහළ ගොස් ඇත. ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව විසින් ප්‍රධාන අපනයනය ලෙස කුරුඳු, විශේෂයෙන් මෙක්සිකෝව සහ පේරු යන රටවලට අපනයනය කර ඇත. ජපානය සහ නෝර්වේ ද ඇතුළුව වෙනත් රටවල් කිහිපයක් මගින් පිරිනමනු ලැබූ ජී.එස්.පී. සහන ක්‍රම මගින් ද ශ්‍රී ලංකාව ප්‍රතිලාභ ලබයි. 2016 වසරේ දී සියලුම ජී.එස්.පී. සහන ක්‍රම යටතේ ලද අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 3,394 ක් දක්වා සියයට 9.0 කින් වර්ධනය විය. විවිධ ජී.එස්.පී. සහන ක්‍රම තුළින් ඉහළ ආදායම් ලබන රටවල් සඳහා වරණීය ප්‍රවේශ ලැබී තිබුණ ද, විශාල වශයෙන් සීමා වී ඇති අපනයන පදනම, මෙම සහන ක්‍රම හරහා ශ්‍රී ලංකාවට ලබා ගත හැකි සම්පූර්ණ ප්‍රතිලාභය අත්කර ගැනීමට බාධා පමුණුවයි.

**ගෝලීය අගය දාමය හා සම්බන්ධ වීමට ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින්, අගය එකතු කිරීම ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශය ඉහළ නැංවීම සහ නවෝත්පාදනය යනාදිය ඉදිරි දැක්ම කර ගනිමින්, සිංගප්පූරුව, චීනය, ජපානය, දකුණු කොරියාව, බංගලාදේශය සහ අප්‍රිකාවේ නැගී එන වෙළඳපොළවල් ඇතුළු ප්‍රධාන වශයෙන් විභවතාවන් පවතින වෙළඳපොළවල් සමඟ වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමෙහිලා රජය දූරදර්ශී ලෙස කටයුතු කර ඇත.** චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම 2014 සැප්තැම්බර් මාසයේ දී අත්සන් කරනු ලැබීය. චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ භාණ්ඩ සහ සේවා වෙළඳාම, ආයෝජන සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාව යන කරුණු ආවරණය වේ. තවද, ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව විසින් විස්තීර්ණ නිදහස් වෙළඳ ගිවිසුමකට එළැඹීමේ අවශ්‍යතාවය දෙරට විසින්ම 2016 ජූනි මාසයේ දී නිවේදනය කරන ලදී. මෙම විස්තීර්ණ නිදහස් වෙළඳ ගිවිසුම මගින් අපනයන හරහා ආර්ථික වර්ධනය ළඟා කර ගැනීම, රැකියා උත්පාදනය, තාක්ෂණික දැනුම හා ප්‍රවීණතාව සහිත ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වෙළඳපොළ ප්‍රසාරණය කිරීම සහ දෙරටේ සැපයුම් දාම

1 ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය දියුණු වෙමින් පවතින රටවල් අතර ඇති කරගත් ගිවිසුමක් වන අතර, එය 1989 දී ක්‍රියාත්මක කරන ලදී. එය දකුණ - දකුණ අතර වෙළඳාම සඳහා ආර්ථික සහයෝගීතාව වර්ධනය කර ගැනීමේ අරමුණ ඇතිව වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණයේ අනුග්‍රහය යටතේ ගිවිසගත් තීරු බදු වරණීය ක්‍රමයකි.

සම්බන්ධතාවය භාවිත කිරීම අරමුණු කොට ඇත. දෙපාර්ශවය මගින් ම කරනු ලැබූ ශක්‍යතා අධ්‍යයනවලින් පසුව යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමෙහි විෂය පථය සහ ආවරණය පිළිබඳව අදාළ ආයතන සමඟ මූලික සාකච්ඡා සිදු කිරීම සඳහා, සිංගප්පූරුව 2016 ජූලි මාසයේ දී විෂය පථය නිර්ණය කිරීමේ දූත මෙහෙවරක නිරත විය. ප්‍රථම සාකච්ඡා වට තුන 2016 වසර තුළ දී පැවැත්විණි. චීනය සහ සිංගප්පූරුව සමඟ වන නිදහස් වෙළඳ ගිවිසුම් දෙකෙහිම කටයුතු 2017 වසර තුළ දී අවසන් කිරීමට අපේක්ෂිතය. මේ අතර, වෙළඳ හා ආයෝජන රාමුව පිළිබඳ ගිවිසුමෙහි (TIFA) 12 වැනි මණ්ඩල රැස්වීම 2016 අප්‍රේල් මාසයේ දී ඇමෙරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර ඇමෙරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් නුවර දී පැවැත්විණි. ලෝක ප්‍රමිතීන්ට ගැළපෙන ආකාරයට ශ්‍රී ලංකාවේ වෙළඳ හා ආයෝජන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම, ශ්‍රී ලංකාවේ වර්තමාන අපනයනවල තරගකාරිත්වය ඉහළ නැංවීම සහ වසර පහක කාලයක් තුළ දී ශ්‍රී ලංකාව හා ඇමෙරිකා එක්සත් ජනපදය අතර වෙළඳාම හා ආයෝජන වේගවත් කිරීම සඳහා නව වෙළඳපොළ වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගනිමින් මෙම හමුවේ දී අදාළ රජයන් දෙක එක්සත් ජනපද-ශ්‍රී ලංකා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් (US - Sri Lanka Joint Action Plan) සකස් කරන ලදී. 2016 සැප්තැම්බර් මාසයේ දී වෙළඳ හා ආයෝජන රාමුවට අදාළ අන්තර් සැසි මණ්ඩල රැස්වීමක් කොළඹ දී පැවැත්වුණු අතර, මෙහිදී කලාපයේ සේවා මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමේ ශ්‍රී ලංකාවේ ඉලක්කය සපුරා ගැනීම සඳහා සහාය දැක්වීම මූලික කර ගත් පුළුල් පරාසයක විහිදුණු ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සඳහා එකඟත්වයකට පැමිණියේය.

**නව වෙළඳ ගිවිසුම් සඳහා ඇතුළත් වීමට අදාළ මූලික කටයුතු සිදු කරන අතරතුර, පවතින ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම්වල උපයෝජනය කාර්යක්ෂම ලෙස ඉහළ නැංවීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇත.** සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය එක්ව ශ්‍රී ලංකාවේ වෙළඳාම සඳහා බලපෑමක් පවතින රටවල් සමඟ පවත්වාගෙන යනු ලබන නිදහස් වෙළඳ ගිවිසුම්, වරණීය වෙළඳ ගිවිසුම් සහ විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම්වල වර්ධනයන් පිළිබඳව අඛණ්ඩව ඇගයීම් සිදු කරනු ලැබීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස නිදහස් වෙළඳ ගිවිසුම්, වරණීය වෙළඳ ගිවිසුම් සහ විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම් පිළිබඳ පැනනගින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා සමාලෝචන රැස්වීම් ගණනාවක් පවත්වා ඇති අතර රුසියාව, ඉරානය, බෙලාරුස්, තුර්කිය සහ බංගලාදේශය වැනි රටවල් සමඟ ද්විපාර්ශ්වික වෙළඳ සම්බන්ධතා වැඩිදියුණු කර ගැනීම සඳහා ඒකාබද්ධ කොමිසම් පවත්වන ලදී. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාව වෙත සිදු කරන ලද අපනයන වටිනාකම 2015 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 407 හා සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 375 ක් විය. සේවා අංශය ඇතුළත් කිරීමෙන් සහ යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම යටතේ වැඩි ආයෝජන අවස්ථා උපදවා ගැනීම මගින් ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. වාණිජ දෙපාර්තමේන්තුව සහ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය 2016 අගෝස්තු මාසයේ දී මූලික නිල මට්ටමේ සාකච්ඡා ආරම්භ කිරීමට පෙර අදාළ පාර්ශ්වකරුවන් සමඟ තොරතුරු විමසීම් සිදු කළ අතර, නිල සාකච්ඡාවල දී දෙපාර්ශවය විසින් ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුමෙහි පුළුල් විෂය පථය පිළිබඳව සහ රාමුව යටතට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන ක්ෂේත්‍ර පිළිබඳව පමණක් සොයා බලන ලදී. දෙවන වටයේ සාකච්ඡා 2016 සැප්තැම්බර් මාසයේ දී පැවති අතර, එහිදී භාණ්ඩ සහ සේවා වෙළඳාම සඳහා අන්‍යෝන්‍ය හඳුනා ගැනීමේ ගිවිසුම්වල (Mutual Recognition Agreements) වැදගත්කම පිළිබඳව දෙපාර්ශවය එකඟතාවයකට පැමිනුණි. ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම පිළිබඳ සාකච්ඡාවල දී භාණ්ඩ, තාක්ෂණ සහයෝගිතාව, ආර්ථික සහයෝගිතාව, සේවා සහ ආයෝජන ලිහිල්කරණය මගින් ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂිතය. මෙම ගිවිසුමේ කටයුතු 2017 වසර තුළ දී අවසන් කිරීමට අපේක්ෂිතය. මේ අතර පාකිස්ථානු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමට අදාළව 6 වන තාක්ෂණික මට්ටමේ රැස්වීම 2016 ජනවාරි මාසයේ දී කොළඹ දී පැවති අතර, එහිදී මෙම ගිවිසුම මගින් තවදුරටත් වෙළඳ බාධක ලිහිල් කිරීම අරමුණු කර ගනිමින් තීරුබදු සහන ලබා දෙන භාණ්ඩ ලැයිස්තුව නැවත සලකා බැලීම සඳහා දෙපාර්ශවයම සාකච්ඡා කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස අසමාන ලෙස ආනයන තක්සේරුකරණය නිසා සිදුවන වෙළඳ බාධක කිහිපයක් ඉවත් කර ඇත. කෙසේ වුව ද, පාකිස්ථානු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් පාකිස්ථානය වෙත සිදු කරන ලද අපනයන තවදුරටත් පහළ අගයක් ගත් අතර, එය 2015 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 59 ට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 52 ක් විය. භාණ්ඩ විවිධාංගීකරණය ප්‍රමාණවත් නොවීම සහ රේගුව හා සම්බන්ධ ගැටලු මේ සඳහා බලපෑ ප්‍රධාන කරුණු ලෙස සැලකිය හැකිය.

**කලාපීය සහ බහුපාර්ශ්වීය වෙළඳ ගිවිසුම්වල ඇති අවශ්‍යතාවය විශාල වශයෙන් ඉස්මතු කරමින් ගෝලීය අගයදාම යටතේ වන ජාත්‍යන්තර වෙළඳාමේ සහ කොටස් වශයෙන් භාණ්ඩ විවිධ රටවල නිෂ්පාදනය කිරීමේ ජාලවල (Product Sharing Networks) වැදගත්කම ඉහළ යමින් පවතී.** කලාපීය වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් සැලකීමේ දී ශ්‍රී ලංකාව විසින් දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණයෙහි (SAFTA) නිදහස් වෙළඳ වැඩසටහන (Trade Liberalisation Programme) යටතේ වූ පළමු අදියර 2015 වසරේ නොවැම්බර් මාසය වන විට සම්පූර්ණ කරන ලදී. නිදහස් වෙළඳ වැඩසටහනෙහි දෙවැනි පියවර යටතේ 2020 වසර වන විට එම ගිවිසුමට අදාළ සාමාජිකයින් සිය මූලික සංවේදී භාණ්ඩ ලැයිස්තුව සියයට 20 කින් වත් පහළ දමනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2018 වන විට දී ශ්‍රී ලංකාව එම ඉලක්කය සපුරා ගැනීමට සැලසුම් කර ඇත. දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය යටතේ ශ්‍රී ලංකාව විසින් 2016 වසරේ දී සිදු කළ අපනයන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 8 දක්වා සියයට 67.4 කින් පහළ ගිය අතර, ගිවිසුම යටතේ ලැබුණු මුළු අපනයන ආදායමෙන් සියයට 60 ක් ඉන්දියාවෙන් වූ අතර, කළු ගම්මිරිස් සහ ඇලුමිනියම් නිෂ්පාදිත ප්‍රධාන අපනයන භාණ්ඩ විය. කලාපීය සේවා වෙළඳාම පුළුල් කිරීමේ තවත් පියවරක් ලෙස සේවා වෙළඳාම පිළිබඳ සාක් ගිවිසුමෙහි (SATIS) බැඳීම් පිළිබඳ ජාතික උපලේඛන සකස් කොට අවසන් කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතින අතර, 2016 ජුනි මාසයේ දී සේවා වෙළඳාම පිළිබඳ සාක් ගිවිසුම යටතේ ඇති බැඳීම් පිළිබඳ ශ්‍රී ලංකාවට විශේෂිත උපලේඛනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි (APTA) 49 වැනි ස්ථාවර කමිටු සැසිවාරය 2016 වසරේ සැප්තැම්බර් මාසයේ දී තායිලන්තයේ පැවති අතර, එහිදී වෙළඳාම සඳහා පහසුකම් සැලසීම, ආයෝජන සහ සේවා සඳහා වන එකඟතා රාමුව ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා කරන ලදී. ආසියා-ශාන්තිකර කලාපයේ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර වරණීය වෙළඳාම වෙනුවෙන් ඇති කරගත් පැරණිතම වෙළඳ ගිවිසුම වනුයේ 1975 දී අත්සන් තබන ලද, එවකට "බැංකොක් ගිවිසුම" ලෙස හැඳින් වූ ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුම වන අතර, බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, දකුණු කොරියාව, මොංගෝලියාව සහ ශ්‍රී ලංකාව මෙහි සාමාජිකත්වය දරනු ලබයි. 2016 වසරේ දී ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ අපනයනවල වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 126 ක් දක්වා සියයට 5.9 කින් ඉහළ ගිය අතර, ප්‍රධාන අපනයන භාණ්ඩ වූයේ කළු තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ තෝරා ගත් ඇඟලුම් අයිතමයන්ය. ආසියා-ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි සාමාජිකයින් අතරින් චීනය සහ දකුණු කොරියාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳපොළ වූ අතර එම රටවල් සඳහා කළ අපනයන, ගිවිසුම යටතේ සිදු කළ මුළු අපනයනවලින් පිළිවෙළින් සියයට 72 ක් සහ සියයට 25 ක් විය. ඉන්දියානු සාගර වළල්ලේ රටවල් අතර පවත්වන කලාපීය සමුළුවක් වන ඉන්දියානු සාගර වළල්ලේ සංගමයේ (IORA) අමාත්‍ය මණ්ඩල මට්ටමේ දෙවැනි ආර්ථික සහ ව්‍යාපාර සමුළුව 2016 අප්‍රේල් මාසයේ දී ඩුබායි හි දී පැවැත්වුණු අතර, 16 වන අමාත්‍යවරුන්ගේ සභාව සහ හවුල් රැස්වීම් 2016 වසරේ ඔක්තෝබර් මාසයේ දී ඉන්දුනීසියාවේ දී පැවැත්විණි. බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාව උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC) යටතේ ශ්‍රී ලංකාවට අදාළ නිදහස් වෙළඳ වැඩසටහන සඳහා 2016 වසරේ පෙබරවාරි මාසයේ දී කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලැබී ඇත.

**ශ්‍රී ලංකාව ලෝක වෙළඳ සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන බහුපාර්ශ්වීය ක්‍රියාමාර්ග සඳහා අඛණ්ඩව සම්බන්ධ විය.** "ලෝක වෙළඳ සංවිධානයේ නයිරෝබි පැකේජය" ලෙස හැඳින් වූ යෝජනාවලිය සැලකිල්ලට ගනිමින් 2015 දෙසැම්බර් මාසයේ දී කෙන්යාවේ දී ලෝක වෙළඳ සංවිධානයේ 10 වන අමාත්‍ය මණ්ඩල මට්ටමේ සමුළුව පැවැත් වූ අතර, සමුළුව අවසානයේ දී ලෝක වෙළඳ සංවිධානයේ අනාගත සැලැස්ම ද සම්මත කර ගන්නා ලදී. ලෝක වෙළඳ සංවිධානය සමඟ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම (TFA) ස්ථිර කරගත් 81 වන සාමාජිකයා බවට ශ්‍රී ලංකාව 2016 වසරේ මැයි මාසයේ දී පත් වූ අතර, එමගින් ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වර්ධනය කරගැනීමට හැකිවනු ඇත. ලෝක වෙළඳ සංවිධානයේ වත්මන් සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක් සිය නීත්‍යානුකූල පිළිගැනීම ස්ථිර කළ විට ගිවිසුම ක්‍රියාත්මක වනු ඇත. වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම, ගෝලීය වෙළඳාමට විශාල වශයෙන් ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින සහ ඌන සංවර්ධිත රටවලට සහාය වනු ඇත. වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් ගෝලීය ආර්ථික වර්ධනය වැඩි දියුණු කරන අතරතුර වෙළඳ පිරිවැය අඩු කර ගැනීමට අපේක්ෂා කෙරේ. තවද, වාණිජ දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද උපදේශන මාලාවකින් පසුව 2016 නොවැම්බර් මාසයේ දී ජිනීවාහි ලෝක වෙළඳ සංවිධාන ප්‍රධාන කාර්යාලයේ දී ශ්‍රී ලංකාවේ 4 වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය සාර්ථකව අවසන් විය. වෙළඳ ප්‍රතිපත්තිවල විනිවිදභාවය වැඩිදියුණු කිරීම මගින් බහුපාර්ශ්වීය වෙළඳ පද්ධතියේ ක්‍රියාකාරිත්වය සුමටව සිදු වීම පහසු කරවීම සඳහා

ශ්‍රී ලංකාව සෑම වසර හයකට වරක් ම සිය වෙළඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කළ යුතුය. මේ අතර, ශ්‍රී ලංකාවේ ප්‍රපාතනය වැළැක්වීම (Anti-Dumping), ප්‍රතියෝජනය (Countervailing), සහ ආරක්ෂණ නීති පද්ධතිය (Safeguard Legislation) ක්‍රියාත්මක කිරීම දිගු කාලයක සිට ප්‍රමාද වෙමින් පවතී. මේ සම්බන්ධයෙන් වූ නව කැබිනට් පත්‍රිකාවක් සඳහා 2016 ඔක්තෝබර් මාසයේ දී අනුමැතිය ලැබී ඇත.

**අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ආයතනික සහාය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව රජය විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භ කළ අතර, නව ක්‍රියාමාර්ග ද යෝජනා කර ඇත.** අලුතින් ආරම්භ කළ සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය සහ සංවර්ධනය සඳහා වන නියෝජිතායතනය පිහිටුවන ලදී. ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා වගකිව යුතු ඉහළ පෙළේ සංසදයක් ලෙස ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර වෙළඳාම සංවර්ධනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වගකීම දරමින් වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා කේන්ද්‍රස්ථානය බවට ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවට උපායමාර්ගික වෙළඳ ප්‍රතිපත්ති රාමුවක් සකස් කර දීම සඳහා එම නියෝජිතායතනය ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටියි. සංවර්ධනය සඳහා වන නියෝජිතායතනය නූතන වෙළඳ න්‍යාය, නව ගෝලීය වෙළඳ පරිසරය සහ වෙළඳාම ආර්ථික වර්ධනයේ යාන්ත්‍රණය ලෙස භාවිත කරන රටවල අත්දැකීම් වෙත අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ අපනයන සහ තරගකාරිත්වය වැඩිදියුණු කිරීමට නව විසඳුම් සොයා ගැනීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ හාවර්ඩ් මධ්‍යස්ථානය, සහශ්‍ර අභියෝගිතා සහයෝගිතාව, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය සහ ලෝක ආර්ථික සමුළුව සමඟ එක්ව ක්‍රියා කරයි. ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ විසඳුම් අතර අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ජාතික අපනයන උපායමාර්ගය සඳහා මුලපිරීම සහ ආයතන 15 කට වැඩි ප්‍රමාණයක සහභාගිත්වයෙන් යුතුව ආයෝජන මණ්ඩලයෙහි කාර්යයන් ඉටු කර ගැනීම සඳහා එක් ස්ථානයක් (one-stop-shop) පිහිටුවීම දැක්විය හැකිය. තවද, ශ්‍රී ලංකා රේගුව විසින් එහි වරාය භාණ්ඩ නිදහස් කිරීමේ ක්‍රියාපටිපාටිය පරිගණකගත තේරීමේ ක්‍රියාවලියක් ඔස්සේ විවිධ චැනලයන් හඳුන්වා දීම මගින් සම්පූර්ණයෙන් ම ස්වයංක්‍රීය කරන ලදී. මේ අනුව, අවශ්‍ය පරීක්ෂණ මට්ටමෙහි වෙනස්කම් සමඟ කොළ, කහ සහ රතු යනුවෙන් චැනල තුනක් හඳුන්වා දෙන ලදී. මෙම ස්වයංක්‍රීය පද්ධතිය මගින් වරාය භාණ්ඩ නිදහස් කිරීමේ දී වැය වන කාලය සැලකිය යුතු ලෙස අඩු කර ඇත. තවද, කොළඹ හා තදාසන්න ප්‍රදේශ සහ රටෙහි අනෙකුත් ප්‍රදේශ අතර පවතින ආර්ථික සංවර්ධනයේ අසමානතාවය අවම කිරීමට නුවර, කොළඹ, හම්බන්තොට සහ කොළඹ හා ත්‍රිකුණාමලය වැනි ආර්ථික කොරිඩෝ ඇති කිරීම හරහා සංවර්ධන කටයුතු ව්‍යාප්ත කිරීමට වැඩසටහන් කිහිපයක් සැලසුම් කර ඇති අතර, බණ්ඩාරගම, ඇඹිලිපිටිය, වවුනියාව, කුලියාපිටිය හා එරාවූර් ප්‍රදේශවල ආර්ථික කලාප පිහිටුවනු ඇති අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ආයෝජන පරිසරය සහ අපනයන තරගකාරිත්වය වැඩිදියුණු කරනු ඇත.

**2016 වසරේ දී විදේශීය වෙළඳාමේ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික සහාය තවදුරටත් ලබා දෙන ලදී.** අපනයන සංවර්ධන මණ්ඩලය යාවත්කාලීන කරන ලද සිය 2016-2020 උපායමාර්ගික සැලැස්මට සමගාමීව 2020 වන විට එ.ජ. ඩොලර් බිලියන 20 ක් වූ අපනයන ඉලක්කයක් වෙත ළඟා වීමේ අභියෝගාත්මක අරමුණ සහිතව අපනයන ප්‍රවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර ඇත. තවද, ඔවුන්ගේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අපනයන විවිධාංගීකරණය හා අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම, ඉලක්කගත සන්නාම නාම ප්‍රවර්ධනය, නව තාක්ෂණය හඳුන්වා දීම, පර්යේෂණ හා සංවර්ධන සහාය සැපයීම සහ පුහුණු කිරීමේ හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ඇතුළු අපනයන වර්ධනය කිරීමට අවශ්‍ය විවිධ ක්‍රියාකාරකම් හඳුනා ගෙන ඇත. මේ අනුව, ප්‍රධාන අපනයන වෙළඳපොළවල පවතින හඳුනාගත් ගැටලු නිරාකරණය කිරීම සඳහා සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම මගින් ප්‍රායෝගික ප්‍රවේශයක් ලබා ගැනීම, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තරය තුළ ගොඩනැගීම සඳහා අපනයනකරුවන් වෙළඳ සල්පිල්වලට සහභාගි කරවීම සහ වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම, ඔවුන්ගේ උපායමාර්ගික සැලසුමේ සඳහන් අපනයන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු උපායමාර්ග වේ. 2016 වසර තුළ දී අපනයන සංවර්ධන මණ්ඩලය විදේශ රටවල ජාත්‍යන්තර වෙළඳ සල්පිල්වලට සහභාගි වන අතරම වෙළඳ සල්පිල් කිහිපයක් පවත්වන ලදී. ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ විශේෂිත අංගයක් වන 16 වන ලෝක අපනයන සංවර්ධන සමුළුව 2016 ඔක්තෝබර් මාසයේ දී දේශීය හා විදේශීය නියෝජිතයින් 600 කගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ දී පවත්වන ලදී. මීට අමතරව, 2016 වසරේ දී අපනයන සංවර්ධන මණ්ඩලය

5

විසින් අපනයන සම්බන්ධව පවතින ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ජාතික අපනයනකරුවන්ගේ සමුළු, ජනාධිපති අපනයන සම්මාන උළෙල පැවැත් වූ අතර එහි විද්‍යුත් වෙළඳපොළ භාවිත කරමින් විද්‍යුත් අලෙවිකරණ කටයුතු බොහොමයක් ද සිදුකරන ලදී. තව ද, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයේ ද සහාය ඇතිව ජාතික අපනයන උපායමාර්ගය සකස් කිරීම ආරම්භ කරන ලදී. ජාතික අපනයන උපායමාර්ගය යනු රජය සහ පෞද්ගලික අංශය විසින් වෙළඳාම සහ තරගකාරිත්වය වර්ධනය කිරීම සඳහා වසර පහක ක්‍රියාකාරිත්වය මුල් කරගත් සවිස්තරාත්මක ප්‍රමුඛත්ව රාමුවක් සැපයීමට ගත් සාමූහික ප්‍රයත්නයකි. ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා අපනයන මගින් තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට අවශ්‍ය පැහැදිලි මඟ පෙන්වීමක් ජාතික අපනයන උපායමාර්ගය තුළින් ලබා දෙනු ඇත. මීට අමතරව, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙළඳ සහ වාණිජ ගිවිසුම් නිසි ලෙස නීතිගත කිරීම තහවුරු කිරීමේ වගකීම සහිත ජාතික වෙළඳ පැමිණිලි මෙහෙයවන්නෙකු (National Trade Prosecutor) පත් කිරීමට 2017 අයවැය මගින් යෝජනා කර ඇත.

**2016 වසරේ දී වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති තුළින්, සාධාරණ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා බදු ක්‍රමය තාර්කිකරණය කිරීම සහ සරල කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.** ඒ අනුව, තේ කර්මාන්තයට සහය දීමට තේ සඳහා වූ ආනයන හා අපනයන පාලන ගාස්තු, තේ ඇසුරුම් කිරීම සහ ලාංඡන ලියාපදිංචිය මත පනවා තිබූ ගාස්තු අහෝසි කිරීමට 2017 වසර සඳහා වූ අයවැය මගින් යෝජනා කර ඇත. එසේම, ප්‍රති-අපනයනය කිරීම සඳහා ඇතැම් තේ වර්ග ආනයනය කිරීම මත පනවා තිබූ රෙගුලාසි ලිහිල් කිරීමට යෝජනා කරන ලදී. විදේශ ආයෝජන කෙරෙහි ශ්‍රී ලංකාව උනන්දු කිරීමේ අරමුණින් යුතුව, බදුකරණයේ පවත්නා රේගු බදු හැර පනවා ඇති අනෙකුත් බදු (Para-tariff) ක්‍රමයෙන් අඩු කිරීමට ද රජය අපේක්ෂා කරයි. මීට සමගාමීව, ලෝක වෙළඳ සංවිධානය හා එකඟ වී ඇති පරිදි තීරු බදු අයිතම 96 ක බදු අනුපාත සංශෝධනය කර ඇත. තවද, කර්මාන්ත සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් කාර්මික අමුද්‍රව්‍ය සඳහා වූ තීරු බදු අඩු කර ඇත.

**මන්දගාමී ගෝලීය ඉල්ලුම හේතුවෙන් අපනයනකරුවන්ට මුහුණ දීමට සිදු විය හැකි අභියෝගවලට පිළියම් වශයෙන් රජය විසින් අපනයනකරුවන්ට පහසුකම් සලසා දීමට පියවර කිහිපයක් යෝජනා කර ඇත.** මේ අනුව, වෙළඳ පහසුකම් සැලසීම සඳහා 2017 අයවැය මගින් අපනයනකරුවන්ට බදු ප්‍රතිලාභ ලබා දීමට සහ අපනයන ආනයන බැංකුවක් පිහිටුවීමට යෝජනා කර ඇත. තවද, විශේෂයෙන් රබර් ආශ්‍රිත නිෂ්පාදිත, ඖෂධ, රෙදිපිළි, ඛනිජ ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය හා මෝටර් රථ කර්මාන්ත ඉලක්ක කරගත් නිදහස් වෙළඳ කලාප සහ මූලික වශයෙන් තොරතුරු තාක්ෂණය, රොබෝ තාක්ෂණය, විලාසිතා නිර්මාණය, ඉහළ තත්ත්වයේ ඇඟලුම් සහ බෝට්ටු නිෂ්පාදනය ඉලක්ක කරගත් අපනයන ගම්මාන පිහිටුවීම මෙන්ම විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ අමුද්‍රව්‍ය මෙරට තුළම නිෂ්පාදනය කිරීමට රජයේ සහයෝගය ලබා දීම යනාදිය සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.

**ජාත්‍යන්තර වෙළඳාම මත වූ ගෝලීය සහ දේශීය අභියෝග, රටට පැහැදිලි හා දූරදර්ශී වෙළඳ ප්‍රතිපත්තියක ඇති අවශ්‍යතාවය ඉස්මතු කර ඇත.** එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත් වීමෙන් ඇති විය හැකි බලපෑම සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ නව රජය විසින් විදේශ වෙළඳාම් ප්‍රතිපත්තිය වෙනස් කිරීමෙන් ඇති විය හැකි බලපෑම සලකා බලමින් වෙළඳ ප්‍රතිපත්තිය මනාව සැලසුම් කළ යුතුය. ශ්‍රී ලංකාව යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටිය ද, ශ්‍රී ලංකාව ඉහළ ඒක පුද්ගල ආදායමක් සහිත ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වෙමින් පවතින නිසා බොහෝ වෙළඳපොළ සඳහා සහනදායී ප්‍රවේශය සීමා වනු ඇත. එම නිසා, පවතින වෙළඳපොළ තරගකාරිත්වය රැක ගනිමින්, ඉහළ යන ගෝලීය තරගකාරිත්වයට මුහුණ දීමට සහ නව වෙළඳපොළ හා තාක්ෂණික ප්‍රවේශ ලබා ගැනීමට අපනයනකරුවන්ට හැකියාව සැලසීම සඳහා ආයතනික සහාය ලබා දීම ඉතා වැදගත් වේ. එබැවින්, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික වෙළඳ ප්‍රතිපත්තිය සහ ජාතික අපනයන උපායමාර්ගය, අපනයන තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සහ සාම්ප්‍රදායික භාණ්ඩවලින් සමන්විත අපනයන පැස විවිධාංගීකරණය කිරීම සඳහා නව අපනයන නිෂ්පාදිත හඳුන්වා දීම සහ ශ්‍රී ලංකාවේ අපනයන ගමනාන්ත විවිධාංගීකරණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. ඉහළ අගය එකතු කිරීම් සහිත, වඩාත් තාක්ෂණය මත පදනම් වූ නිෂ්පාදිත වෙත යොමු කිරීම සඳහා නිෂ්පාදන අංශය නව මානයක් වෙත යොමු කිරීම මගින් මෙරට කාර්මික ප්‍රතිපත්තිය අපනයන ප්‍රවර්ධනය කෙරෙහි අනුගත කිරීම, ගෝලීය නිෂ්පාදිත අගය දාමයට ඇතුළත් වීම පහසු කරවීමට සහ එමගින් භාණ්ඩ අපනයන වර්ධනය කිරීමට අත්‍යවශ්‍ය වේ. කාර්යක්ෂම සහ ඒකමතික අපනයන උපායමාර්ගයක් සකස් කිරීම සඳහා අපනයන ප්‍රවර්ධනය අධීක්ෂණය කරනු ලබන විවිධ ආයතනවල ක්‍රියාකාරිත්වය නව්‍යකරණය කිරීම ද ඉතා වැදගත් වේ. තව ද, ආනයන බදු නිදහස් කිරීම මත වූ ආනයන

5

ප්‍රතිපත්තියක් ඇති කිරීම තුළින් ආනයනය කරනු ලබන රටවලින් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට උපකාරී වේ. ශ්‍රී ලංකාවට ගෝලීය අගය දාමය තුළ වඩාත් යහපත් ස්ථානගත වීමකට සහ රටෙහි නිෂ්පාදිත කොටස් වශයෙන් විවිධ රටවල නිපදවන ජාලය පුළුල් කර ගැනීමට ද මෙමගින් හැකි වේ.

## 5.3 භාණ්ඩ වෙළඳාම, වෙළඳ ශේෂය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

### 5.3.1 අපනයන ක්‍රියාකාරිත්වය

**ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන්වල පහළ යෑම සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තවල ආර්ථික වර්ධනය මධ්‍යස්ථ මට්ටමක පැවතීම හේතුවෙන් 2016 වසරේ දී අපනයන ආදායම අඛණ්ඩව දෙවැනි වසරටත් පහළ ගියේය.** 2016 වසරේ අග භාගයේ දී අපනයන ආදායම හිතකර ලෙස වර්ධනය වුව ද, වසරේ පළමු මාස හත තුළ දී කෘෂිකාර්මික සහ කාර්මික අපනයන ආදායම් සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් 2016 වසරේ අපනයන ආදායම, 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,546 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 10,310 ක් දක්වා සියයට 2.2 කින් පහළ ගියේය.


**ප්‍රධාන වශයෙන් මුළු අපනයන ආදායමෙන් හතරෙන් එකක් පමණ වන කෘෂිකාර්මික අපනයන ආදායම අඩු වීම සමස්ත අපනයන ආදායම පහළ යෑමට හේතු විය.** කෘෂිකාර්මික නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති බොහෝ කාණ්ඩවල අපනයන ආදායමේ අඩු වීමක් පිළිබිඹු කරමින් 2016 වසරේ කෘෂිකාර්මික අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 2,326 ක් දක්වා සියයට 6.3 කින් පහළ ගියේය. 2015 දී සියයට 17.7 කින් පහළ ගිය තේ අපනයන ආදායම, 2016 වසරේ දී තවදුරටත් එ.ජ. ඩොලර් මිලියන 1,269 ක් දක්වා සියයට 5.3 කින් පහළ ගිය අතර, එය 2009 වසරෙන් පසුව තේ අපනයන ආදායම සඳහා වාර්තා වූ අඩුම අගය වේ. තේ නිෂ්පාදනය මෙන්ම ඉල්ලුම අඩු වීම හේතුවෙන් මුළු තේ අපනයන පරිමාව කිලෝග්‍රෑම් මිලියන 289 ක් දක්වා සියයට 5.9 කින් පහළ ගියේය. 2016 වසරේ දී තේ නිෂ්පාදනය අඩු වීම සඳහා අයහපත් කාලගුණික තත්ත්වයන් සහ වැවිලි අංශයේ පැවති වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතු විය. තේ සඳහා වූ ඉල්ලුම අඩු වීමට ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන ගැණුම්කරුවන් වන මැදපෙරදිග රටවල් සහ රුසියාව වෙතින් පැවති ඉල්ලුම අඩු වීම මූලික වශයෙන් බලපෑ අතර, සාපේක්ෂ වශයෙන් අඩු බනිජ තෙල් මිල ගණන් නිසා මෙම රටවල ආදායම් මට්ටම් පහළ යෑම සහ භූ-දේශපාලනික අවිනිශ්චිතතාවන් ඉහළ යෑම මේ සඳහා හේතු විය. කෙසේ වුවද, 2016 වසරේ මුල් භාගයේ දී තේ කිලෝග්‍රෑමයක් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල පෙර වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 6.3 කින් අඩු වුව ද, 2016 වසර සඳහා එම අගය තේ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 4.39 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. කුළුබඩු සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම් අඩු වීම ද කෘෂිකාර්මික අපනයන ආදායම පහළ යෑම සඳහා සැලකිය යුතු ලෙස දායක විය. 2015 වසරේ දී සියයට 42.7 ක වර්ධනයක් වාර්තා කළ කුළුබඩු අපනයන ආදායම 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 317 ක් දක්වා සියයට 16.0 කින් පහළ ගිය අතර, ගම්මිරිස් සහ කරාබු නැටි අපනයන පරිමාවන් පිළිවෙළින් සියයට 50.8 කින් සහ සියයට 66.6 කින් සැලකිය යුතු ලෙස පහළ යෑම ඒ සඳහා හේතු විය. කෙසේ වුව ද, මෙම වසර තුළ දී කුරුඳු, සහ සාදික්කා හා වසාවාසි අපනයන පරිමා සහ අපනයන මිල ගණන් යන දෙකම ඉහළ ගියේය. පුවක් සහ සහල් අපනයන පරිමාවන් පිළිවෙළින් සියයට 54.4 කින් සහ සියයට 54.2 කින් සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 114 ක් දක්වා සියයට 28.9 කින් පහළ ගියේය.

**වසර තුළ දී පොල්, රබර්, සහ මුහුදු ආහාර අපනයන ආදායම ඉහළ ගිය අතර එමගින් කෘෂිකාර්මික අපනයන ආදායම අඩු වීමෙන් වූ බලපෑම යම් ප්‍රමාණයකින් සමනය විය.** අපනයන මිල ගණන්වල පහළ යෑම නිසා පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති පොල්තෙල් අපනයන ආදායමේ සැලකිය යුතු අඩුවීමක් සිදු වුවද, පොල් ගෙඩි, පොල් කෙඳි සහ පොල් කටු හා ඉරටු වැනි පොල්

5

**5.2 රූප සටහන**

**අපනයන සංයුතිය - 2016**




මූලය: ශ්‍රී ලංකා රේගුව

මඳ ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන ඉහළ යෑම හේතුවෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 366 ක් දක්වා සියයට 4.0 කින් ඉහළ ගියේය. රබර් අපනයන මිල ගණන්වල අඩුවීමක් සිදු වුව ද, 2012 වසරේ සිට අඛණ්ඩව අඩුවීමක් පෙන්නුම් කළ රබර් අපනයන ආදායම, 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 33 ක් දක්වා සියයට 25.0 කින් ඉහළ ගිය අතර, රබර් අපනයන පරිමාව කිලෝග්‍රෑම් මිලියන 16 ක් දක්වා සියයට 55.8 කින් ඉහළ යෑම මීට හේතු විය. 2015 වසරේ ජනවාරි මාසයේ සිට යුරෝපා වෙළඳපොළ වෙත ප්‍රවේශ වීම සීමා කිරීමත් සමඟ 2015 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු වූ මුහුදු ආහාර අපනයන ආදායම, යුරෝපා සංගමය වෙත ශ්‍රී ලංකාවෙන් මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම 2016 වසරේ ජුනි මාසයේ දී ඉවත් කිරීමෙන් පසුව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 170 ක් දක්වා සියයට 4.0 කින් ඉහළ ගියේය.

**මුළු අපනයන ආදායමෙන් හතරෙන් තුනක් පමණ වූ කාර්මික අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,940 ක් දක්වා සියයට 1.0 කින් පහළ ගියේය.** මෙම අඩුවීම සඳහා ප්‍රවාහන උපකරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම පහළ යෑම විශාල වශයෙන් දායක විය. ප්‍රධාන වශයෙන් ම කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2013 සහ 2014 වසරවල දී ආනයනය කරන ලද කැණීම් කටයුතු සඳහා භාවිතා කරන යාත්‍රා දෙකක් 2015 වසරේ දී අපනයනය කිරීම හේතුවෙන් එම වසරේ දී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගැනීම නිසා 2016 වසරේ ප්‍රවාහන උපකරණ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 131 ක් දක්වා සියයට 46.0 කින් පහළ ගියේය. ප්‍රධාන වශයෙන් නැව් සහ ගුවන් යානා සඳහා භාවිතා කරන ඉන්ධන ඇතුළත් ඛනිජ තෙල්

**5.2 සංඛ්‍යා සටහන**
**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2015 (අ) | | 2016 (ආ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,481.5** | **23.5** | **2,326.1** | **22.6** | **-155.4** | **-6.3** | **65.6** |
| තේ | 1,340.5 | 12.7 | 1,269.0 | 12.3 | -71.5 | -5.3 | 30.2 |
| රබර් | 26.1 | 0.2 | 32.7 | 0.3 | 6.5 | 25.0 | -2.8 |
| පොල් | 351.7 | 3.3 | 366.0 | 3.5 | 14.2 | 4.0 | -6.0 |
| කුළුබඩු | 377.4 | 3.6 | 317.1 | 3.1 | -60.3 | -16.0 | 25.5 |
| එළවළු | 30.5 | 0.3 | 26.5 | 0.3 | -4.0 | -13.0 | 1.7 |
| සකස් නොකළ දුම්කොළ | 31.8 | 0.3 | 31.2 | 0.3 | -0.6 | -2.0 | 0.3 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 160.4 | 1.5 | 114.1 | 1.1 | -46.3 | -28.9 | 19.6 |
| මුහුදු ආහාර | 163.1 | 1.5 | 169.6 | 1.6 | 6.5 | 4.0 | -2.8 |
| **කාර්මික අපනයන** | **8,017.1** | **76.0** | **7,940.1** | **77.0** | **-77.0** | **-1.0** | **32.5** |
| රෙදිපිළි හා ඇඟලුම් | 4,820.2 | 45.7 | 4,884.1 | 47.4 | 63.9 | 1.3 | -27.0 |
| රබර් නිෂ්පාදිත | 761.2 | 7.2 | 767.9 | 7.4 | 6.7 | 0.9 | -2.8 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 373.9 | 3.5 | 286.9 | 2.8 | -87.1 | -23.3 | 36.8 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 331.7 | 3.1 | 273.9 | 2.7 | -57.8 | -17.4 | 24.4 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 306.8 | 2.9 | 323.7 | 3.1 | 16.9 | 5.5 | -7.1 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 293.8 | 2.8 | 317.6 | 3.1 | 23.8 | 8.1 | -10.1 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 45.7 | 0.4 | 42.4 | 0.4 | -3.3 | -7.2 | 1.4 |
| ප්‍රවාහන උපකරණ | 243.7 | 2.3 | 131.5 | 1.3 | -112.2 | -46.0 | 47.4 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 135.7 | 1.3 | 165.6 | 1.6 | 29.9 | 22.0 | -12.6 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 35.2 | 0.3 | 34.4 | 0.3 | -0.8 | -2.2 | 0.3 |
| අනෙකුත් කාර්මික අපනයන | 669.4 | 6.3 | 712.2 | 6.9 | 42.8 | 6.4 | -18.1 |
| **ඛනිජමය අපනයන** | **28.4** | **0.3** | **29.0** | **0.3** | **0.6** | **2.1** | **-0.3** |
| **වර්ග නොකළ අපනයන** | **19.5** | **0.2** | **14.5** | **0.1** | **-5.0** | **-25.5** | **2.1** |
| **මුළු අපනයන (ඇ)** | **10,546.5** | **100.0** | **10,309.7** | **100.0** | **-236.8** | **-2.2** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)** | **135.94** | | **145.60** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ.
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජතෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 7**

## අපනයන ප්‍රවර්ධනය උදෙසා ජාතික උපායමාර්ගය

### හැඳින්වීම


අපනයන වර්ධනය සහ ආර්ථික වර්ධනය අතර සම්බන්ධය ආර්ථික විද්‍යාව තුළ පුළුල් ලෙස විවාදයට ලක් වූ කරුණකි. අපනයන වර්ධනය සහ ආර්ථික වර්ධනය අතර අන්තර් සම්බන්ධයක් ඇති බවට පොදු මතයක් තිබුණ ද, ශ්‍රී ලංකාව පිළිබඳ සැලකීමේ දී එවැනි සම්බන්ධතාවයක් දක්නට නොලැබේ. මෙම තත්ත්වය 2000 - 2016 අතර කාලයේ දී පැහැදිලිව දක්නට ලැබුණු අතර, එම කාලය තුළදී දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) සියයට 10.4 ක සංයුක්ත වාර්ෂික වර්ධන වේගයකින් වර්ධනය වුව ද, අපනයන සියයට 4.0 කින් පමණක් සංයුක්ත වශයෙන් වර්ධනය විය. මෑතකාලීනව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ප්‍රධාන වශයෙන් දේශීය ඉල්ලුම පුළුල් වීම තුළින් සිදුව ඇති අතර, ආර්ථික වර්ධනය සඳහා අපනයන වෙතින් ඉහළ දායකත්වයක් ලැබී නොමැත.

ප්‍රධාන වශයෙන් ම දේශීය ඉල්ලුම පුළුල් වීම හේතුවෙන් 2005 - 2012 කාලපරිච්ඡේදයේ දී ආර්ථිකයේ ඉහළ මට්ටමක වර්ධනයක් වාර්තා වූ අතර, එය 2013 වසරේ සිට සියයට 4-5 ක මට්ටමකට සීමා විය. ශ්‍රී ලංකාව වැනි කුඩා ආර්ථිකයක තිරසාර වර්ධනයක් සඳහා බාහිර ඉල්ලුම අත්‍යවශ්‍ය සාධකයක් බව මින් පෙන්නුම් කරයි. වෙළඳ හා ජංගම ගිණුම්වල හිඟය ප්‍රසාරණය වීම සහ තිරසාර නොවන මට්ටමක පවතින විදේශ ණය මත රඳා පැවතීම ඉහළ යෑම, වෙළඳාම් කළ නොහැකි භාණ්ඩ හා දේශීය ඉල්ලුම මත රඳා පැවති වර්ධනයේ අහිතකර ප්‍රතිවිපාකයක් විය. විදේශීය ජංගම ගිණුමේ ශේෂය සහ ආර්ථික වර්ධනය තිරසාර මට්ටමකට ළඟා කර ගැනීම සඳහා ඉහළ අගයක් සහිත අපනයන ප්‍රවර්ධනය අරමුණු කරගත් පුළුල් උපායමාර්ග අත්‍යවශ්‍ය බවට කදිම සාක්ෂි මෙමගින් සපයයි. මේ අනුව, අපනයන ආදායම් උත්පාදනය ඉහළ නැංවීම මැදිකාලීන හා කෙටිකාලීන විදේශීය වගකීම්වලට ආරක්ෂණයක් ලෙස කටයුතු කරනු ඇති අතර, විනිමය අනුපාතික ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ද යොදා ගැනීමෙන් රටෙහි ආර්ථිකයට කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය වන ලෙස සංචිත මට්ටම තිරසාර මට්ටමකට ඉහළ නංවා ගැනීමට දායක වනු ඇත. තවද, අපනයන වෙත යළි අවධානය යොමු කිරීම මගින් වඩාත් කාර්යක්ෂම අංශවලට ආයෝජන යෙදවීමට උපකාරී වනු ඇති අතර, එමගින් ඵලදායිතාව ඉහළ නංවාගත හැකිය. අපනයන වර්ධනය මගින් නව තාක්ෂණය ගලා ඒම, රැකියා උත්පාදනය, මහා පරිමාණානුකූල පිරිමැසුම් සහ ආර්ථිකයේ ඵලදායී සම්පත් පදනම පුළුල් වීම වැනි අනෙකුත් ප්‍රතිලාභ අත්පත් කරගත හැකිය.

ශ්‍රී ලංකාව 1977 වසරේ දී නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමේ දී සිය කලාපයේ අනෙකුත් රටවලට වඩා ඉදිරියෙන් සිටියේය. පෞද්ගලික අංශය මූලික කරගත් සංවර්ධනය, අපනයන මූලික වූ ආර්ථික වර්ධනය සහ විදේශීය සෘජු ආයෝජන දිරිමත් කිරීම වැනි ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් විදේශීය වෙළඳාම සහ ආර්ථිකය ජාත්‍යන්තර වෙළඳාමට විවෘතවීමේ මට්ටම[1] සම්බන්ධව ප්‍රබල දියුණුවක් කඩිනමින් අත්පත් කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. මේ අනුව, 1977 දී සියයට 36.4 ක් වූ ආර්ථිකය ජාත්‍යන්තර වෙළඳාමට ඇති විවෘතභාවය 1979 වන විට ආසන්න වශයෙන් දෙගුණයකින් ඉහළ යමින් සියයට 72.2 ක් බවට පත් වූ අතර, 1977 දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 18.7 ක් වූ අපනයන 1979 දී සියයට 29.2 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රතිපත්ති දිශානතියේ ඇති වූ මෙම වෙනස් වීම අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට හේතු විය. 1977 දී එ.ජ. ඩොලර් මිලියන 767 ක් වූ අපනයන ආදායම, 2000 දී එ.ජ. ඩොලර් මිලියන 5,522 දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, 2000 වසරේ සිට අපනයන වර්ධනය සතුටුදායක මට්ටමක නොපැවතුණි. 2016 වසරේ දී අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 10,310 ක් දක්වා ඉහළ ගිය අතර ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 19,400 ක් දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් මිලියන 9,090 ක් දක්වා පුළුල් විය. ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ විගස ආර්ථිකයට විශාල වශයෙන් ප්‍රතිලාභ අත්වුවද, මේ වන විට ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමෙහි ක්‍රියාකාරිත්වය ආර්ථිකය ලිහිල්කරණය කිරීමට පෙර පැවති මට්ටම දක්වා පිරිහී ඇති බව පෙනී යයි. 2016 වසරේ දී ආර්ථිකය වෙළඳාමට ඇති විවෘතභාවය සියයට 36.5 ක් වූ අතර, අපනයන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.7 ක්

**රූප සටහන වි.ස. 7.1**

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය වෙළඳාමට ඇති විවෘතභාවය සහ ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස අපනයන**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


1 ආර්ථිකය වෙළඳාමට ඇති විවෘතභාවය, භාණ්ඩ අපනයනය සහ භාණ්ඩ ආනයනවල එකතුව ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ගණනය කරනු ලබයි.

දක්වා පහළ ගොස් ඇත. 2015 වසරේදී මැලේසියාවේ අපනයන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 67.5 ක් වූ අතර, එය තායිලන්තයේ සියයට 54.2 ක්ද, වියට්නාමයේ සියයට 83.7 ක්ද විය.

ආර්ථිකය ලිහිල් කිරීමෙන් පසු කාලයේ දී ශ්‍රී ලංකාවේ අපනයන සංයුතිය පෙර පැවති ප්‍රාථමික කෘෂිකාර්මික නිෂ්පාදිත ව්‍යුහයක සිට එකතු කළ අගය සහිත, ශ්‍රම සූක්ෂ්ම කාර්මික නිෂ්පාදිත ව්‍යුහයක් දක්වා වෙනස් විය. අපනයන සංයුතියෙහි වෙනසක් සිදු වුව ද, අපනයන භාණ්ඩ පැස ඉන් අඩකට වඩා ආයකත්වය ලබාදෙන ඇඟලුම් සහ තේ යන සාම්ප්‍රදායික නිෂ්පාදිත දෙකක් මත අඛණ්ඩව කේන්ද්‍රගත වී ඇති අතර එමගින් අපනයන අංශයේ විවිධාංගීකරණයේ පවතින සීමා පෙන්නුම් කරයි. යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය ආසන්න වශයෙන් මුළු අපනයනවලින් තුනෙන් දෙකකට පමණ අඛණ්ඩව ආයකත්වය ලබා දෙයි. එමගින් වෙළඳපොළ විවිධාංගීකරණයේ සීමාකම් ද පෙන්නුම් කෙරෙයි. තව ද, මුළු තේ අපනයනවලින් සියයට 70 ක් පමණ මැද පෙරදිග හා ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වෙත සිදු කෙරෙන අතර මෙම රටවලින් තේ සඳහා පවතින ඉල්ලුම ඛනිජ තෙල් අපනයනයෙන් එම රටවල් උපයන ආදායම් හා බැඳී පවතී. අපනයන නිෂ්පාදිතවල සහ වෙළඳපොළවල විවිධාංගීකරණය අඩු වීම මගින් අපනයන අංශය මුහුණ පා ඇති අවදානම් සහගත බව පෙන්නුම් කෙරෙයි.

ශ්‍රී ලංකාවේ කලාපීය තරගකරුවන් සිය විදේශ වෙළඳාම වේගයෙන් ප්‍රසාරණය කරගෙන ඇති අතර, අපනයන තුළින් ආර්ථික වර්ධනයක් අත්පත් කරගත් රටවල් ලෙස ආදර්ශමත් ආකෘති බවට පත්ව ඇත. ලෝක බැංකුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති අපනයන වටිනාකම් දර්ශකය[2] (රූප සටහන වි.ස. 7.2) මගින් 2000 සිට 2015 කාලපරිච්ඡේදය තුළ කලාපයේ අනෙකුත් සාමාජික රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ අපනයන අංශය පහළ මට්ටමක පවතින බව පිළිබිඹු කෙරෙයි. 2000 වසරට සාපේක්ෂව 2015 වසරේ අපනයන සැලකීමේ දී ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය 1.9 ගුණයකින් පමණක් සිදු වී ඇති අතර, 1990 සිට අපනයන තුළින් ආර්ථික වර්ධනය ලබාගත් වියට්නාමය හා බංගලාදේශය පිළිවෙළින් 11.2 ගුණයකින් හා 5.1 ගුණයකින් ද, දකුණු කොරියාව හා තායිලන්තය 3.1 ගුණයකින් ද වර්ධනය වී ඇත.

## රූප සටහන වි.ස. 7.2
## අපනයන වටිනාකම් දර්ශකය (2000=100) සන්සන්දනාත්මකව



මූලය: ලෝක බැංකුව

2 ලෝක බැංකුව විසින් ඉදිරිපත් කර ඇති අපනයන වටිනාකම් දර්ශකය වෙළඳාම සහ සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ සමුළුවේ දත්ත අනුව පවත්නා මිල මත පදනම්ව එ.ජ. ඩොලර්වලින් අගය කරන ලද අපනයන වටිනාකම (නැ.වි.ස.), පදනම් කාලපරිච්ඡේදයේ (2000) සාමාන්‍යයෙහි ප්‍රතිශතයක් ලෙස දක්වා ඇත.

තෝරාගත් ආසියාතික රටවල් කිහිපයක පසුගිය දශක තුන තුළ විදේශීය වෙළඳාමේ සහ ද.දේ.නි.යේ ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කරන විටදී සමාන ප්‍රවණතාවක් දැකිය හැකිය. සියලුම රටවල ක්‍රියාකාරිත්වය එකිනෙකට සමාන බවක් පෙනෙන අතර, ශ්‍රී ලංකාවේ ද.දේ.නි. සම්බන්ධයෙන්

## සංඛ්‍යා සටහන වි.ස. 7.1
## තෝරාගත් රටවල ද.දේ.නි, භාණ්ඩ අපනයන සහ ආනයන

| රට | දර්ශකය | අගයන් එ.ජ. ඩොලර් බිලියන | | | | සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතය % |
|---|---|---|---|---|---|---|
| | | 1985 | 1995 | 2005 | 2015 | 1985 - 2015 |
| බංගලාදේශය | ද.දේ.නි | 22.3 | 37.9 | 69.4 | 195.1 | 7.5 |
| | අපනයන | 1.0 | 3.5 | 9.3 | 32.4 | 12.3 |
| | ආනයන | 2.5 | 6.7 | 13.9 | 39.5 | 9.6 |
| දකුණු කොරියාව | ද.දේ.නි | 103.7 | 559.3 | 898.1 | 1,377.9 | 9.0 |
| | අපනයන | 30.3 | 125.1 | 284.4 | 526.8 | 10.0 |
| | ආනයන | 31.1 | 135.1 | 261.2 | 436.5 | 9.2 |
| තායිලන්තය | ද.දේ.නි | 38.9 | 169.3 | 189.3 | 395.2 | 8.0 |
| | අපනයන | 7.1 | 56.4 | 110.9 | 214.4 | 12.0 |
| | ආනයන | 9.2 | 70.8 | 118.2 | 202.7 | 10.8 |
| වියට්නාමය | ද.දේ.නි | 14.1 | 20.7 | 57.6 | 193.6 | 9.1 |
| | අපනයන | 0.7 | 5.4 | 32.4 | 162.1 | 19.9 |
| | ආනයන | 1.9 | 8.2 | 36.8 | 166.1 | 16.2 |
| ශ්‍රී ලංකාව | ද.දේ.නි | 6.0 | 13.0 | 24.4 | 80.6 | 9.1 |
| | අපනයන | 1.3 | 3.8 | 6.3 | 10.5 | 7.2 |
| | ආනයන | 2.0 | 5.3 | 8.9 | 18.9 | 7.7 |

සටහන: ශ්‍රී ලංකාව සඳහා දත්ත ජාතික දත්ත මත පදනම් වේ. අනෙකුත් රටවල් සඳහා දත්ත ලෝක බැංකුව වෙතින් ලබාගෙන ඇත.

5

සතුටුදායක ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළද, අපනයනවල[3] සහ ආනයනවල සංයුක්ත වාර්ෂික වර්ධන අනුපාතය අඩු වීම සමඟ ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරිත්වය පසුබෑමකට ලක් වී ඇත.

**සාර්ථකත්වය පිළිබඳ අන්තර්ජාතික අත්දැකීම්**

දකුණු කොරියාව, තායිලන්තය, වියට්නාමය සහ බංගලාදේශය වැනි රටවල අපනයන වර්ධනය පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ මෙම සියලු රටවල් අනුගමනය කළ අපනයන සංවර්ධන ප්‍රතිපත්ති බොහෝ සෙයින් සමාන බවයි. මෙම රටවල අපනයන ප්‍රවර්ධනය සඳහා අපනයන සහනාධාර, සහනදායී පොලී අනුපාතික යටතේ අපනයන ණය යෝජනා ක්‍රම සහ බදු සහනාධාර වැනි පුළුල් අපනයන ප්‍රවර්ධන වැඩසටහන් හඳුන්වා දී ඇත. අඩු හා ස්ථාවර උද්ධමනය, අඩු පොලී අනුපාතික සහ තරඟකාරී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑම සමඟ හිතකර සාර්ව ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම මගින් මෙම උපායමාර්ග සඳහා සහාය ලබා දී ඇත. අපනයන ප්‍රවර්ධනය පිළිබඳ සමස්ත උපායමාර්ගය තුළ ක්ෂේත්‍රයට සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය ද කේන්ද්‍රගත අංගයකි. ඒ අනුව රජය, කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ වෘත්තීයවේදීන්, වෙළඳාම සඳහා පහසුකම් සලසන්නන් සහ ව්‍යාපාරිකයින් ඇතුළුව විවිධ පාර්ශ්වකරුවන්ගේ ඒකමතික තීරණ කාලීනව ක්‍රියාත්මක කිරීම සඳහා අපනයන ප්‍රවර්ධන රැස්වීම් අඛණ්ඩව පවත්වන ලදි. පෞද්ගලික අංශය ආර්ථික වර්ධනයේ ප්‍රධාන යාන්ත්‍රණය බවට පත් කිරීමට අනුබල දීම සඳහා පෞද්ගලික අයිතිය පිළිගැනීම සඳහා නීති හඳුන්වා දෙමින් යෝග්‍ය නියාමන පරිසරයක් ද නිර්මාණය කෙරිණි. ප්‍රාග්ධන ගිණුම ලිහිල් කිරීම සහ විදේශීය ආයෝජන දිරිමත් කිරීමට හැකි වන ලෙස නව නීති හඳුන්වා දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස විශාල වශයෙන් විදේශීය ඍජු ආයෝජන ගලා ඒම සිදුවිය. ආර්ථික ලිහිල්කරණයේ ප්‍රතිඵලයක් ලෙස හඳුන්වා දුන් සැමට ආර්ථිකය විවෘත වූ ප්‍රතිපත්තියක් මගින් මෙම රටවලට දියුණු ආර්ථිකයන් සමඟ සබඳතා වර්ධනය කර ගැනීමට මඟ පෑදුණු අතර, ලෝක වෙළඳ සංවිධානය සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්ත සංවිධාන වෙතින් ආර්ථිකයේ විවිධ අංශ සඳහා සහයෝගය ලබා ගැනීමෙන් ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට හැකිවී ඇත.

දේශීය නිෂ්පාදනය සැලකීමේ දී දේශීය පරිභෝජන ඉල්ලුම සපුරා ගත හැකි ආකාරයෙන් ආනයන ආදේශන සඳහා පහසුකම් සලසන ක්‍රියාමාර්ගවලට ප්‍රමුඛත්වය ලබාදෙන ආකාරයට ප්‍රතිපත්ති සකස් කෙරිණි. නව තාක්ෂණික සොයාගැනීම්වලට හැඩගැසීම සහ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම මෙම ප්‍රතිපත්තිවලට ඇතුළත් විය. දේශීය කර්මාන්ත ජාත්‍යන්තර වෙළඳපොළ හා තරග කිරීමට හැකි මට්ටමට වර්ධනය වීමෙන් පසු රෙදිපිළි හා ඇඟලුම් වැනි ශ්‍රම සූක්ෂම කාර්මික නිෂ්පාදිත දිරිමත් කරන අපනයන පුළුල් කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වෙත අවධානය යොමු විය. අපනයන වර්ධනය තිරසාර මට්ටමක් වෙත ළඟා වූ විගස ඉහළ යන වේතන මට්ටම්වලට සහ සමස්ත වර්ධන ක්‍රියාවලියට ඉඩ සැලසීමට අපනයන කර්මාන්ත ශ්‍රම සූක්ෂ්ම කර්මාන්තවල සිට ඉහළ එකතු කළ අගයක් සහිත කර්මාන්ත වෙත යොමු කිරීමට මෙම රටවල කර්මාන්ත ප්‍රතිපත්ති මූලික විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස නිෂ්පාදන විවිධාංගීකරණය සමඟ එකතු කළ අගය සහිත කර්මාන්තවල දායකත්වය ඉහළ ගිය අතර, ශ්‍රම සූක්ෂම කාර්මික හා කෘෂිකාර්මික අපනයනවල දායකත්වය පහළ ගියේය. අපනයන උපායමාර්ග, ඒ ඒ රටවලට සුවිශේෂී වූ අංගවලින් ද සමන්විත විය. උදාහරණයක් ලෙස, මධ්‍යගතව සැලසුම් කළ කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආර්ථික රටාවක් සහිත රටක් වූ වියට්නාමය, 1986 වසරේ දී ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති කිහිපයක් ආරම්භ කළ අතර, එමගින් අපනයන අංශයේ හා සමස්ත ආර්ථිකයේ පරිවර්තනයක් සිදු විය. වියට්නාමය එහි විශාල කෘෂිකාර්මික අංශයට කෝපි සහ රබර් වැනි ඉහළ අගයක් සහිත කෘෂිකාර්මික නිෂ්පාදන සංවර්ධනය සහ රජයට අයත් ඉඩම් පෞද්ගලීකරණය කිරීම වැනි ක්ෂේත්‍රවලට අදාළ ප්‍රතිපත්ති සහිත ප්‍රතිසංස්කරණ කිහිපයක් හඳුන්වා දුන් නමුත්, ප්‍රතිසංස්කරණ වැඩසටහන මගින් ප්‍රමුඛතාව හිමි වූයේ කාර්මික අංශය වෙතය. මෙය කෘෂිකාර්මික අපනයනවල ප්‍රතිශතය සහ ද.දේ.නි.යට එම අංශයේ වූ දායකත්වය අඩු වීමට හේතු වුව ද, එමගින් කෘෂිකාර්මික අංශයේ කාර්යක්ෂමතාව වර්ධනය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වියට්නාමය ශුද්ධ අගය මත කෘෂිකාර්මික නිෂ්පාදිත ආනයනය කරන්නෙකුගේ තත්ත්වයේ සිට ශුද්ධ අගය මත කෘෂි නිෂ්පාදන අපනයනය කරන්නෙකු බවට පත්විය. වියට්නාමය මෙන්ම දකුණු කොරියාව සහ තායිලන්තය වැනි අනෙකුත් රටවල් ගත් විට සැලකිය යුතු මට්ටමක අපනයන වර්ධනයක් ළඟා කර ගැනීමෙන් පසුව රජයේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාගත කිරීමේ දී ආංශික ප්‍රතිපත්ති ඉලක්ක කිරීමේ (sector-oriented) සිට කාර්යයන් හා සම්බන්ධ ප්‍රතිපත්ති ඉලක්ක කිරීම (function-oriented) වෙත විතැන් විය. මෙමගින් පර්යේෂණ හා සංවර්ධනය සඳහා පුළුල් සහායක් ලැබුණු අතර, එය අවසානයේ දී තාක්ෂණය පදනම් කර ගත් නිෂ්පාදිත අපනයන වර්ධනය කර ගනිමින් තාක්ෂණික නව නිපැයුම්වල කැපී පෙනෙන දියුණුවක් ඇති කිරීමට හේතු විය. කෙසේ වුවද, වෙළඳපොළ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමට සහ එමගින්

3 කෙසේ වුව ද, මෑත කාලීනව ශ්‍රී ලංකාවේ සේවා අපනයන ආදායමෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා වී ඇති බව ද පෙනී යයි. 2009 වසරේ සිට සංචාරක සේවා, ප්‍රවාහනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලිය බාහිර මූල්‍ය වෙත පැවරීම ආදී අපනයන සැලකිය යුතු ලෙස වර්ධනය වීමත් සමඟ සේවා අපනයන ශීඝ්‍රයෙන් වර්ධනය විය. සේවා ආනයන ද එම ප්‍රවණතාව පෙන්නුම් කර ඇත. සේවා අපනයනවල ශුද්ධ වටිනාකම වසර ගණනාවක් පුරා ඉහළ ගිය ද, එම ඉහළ යෑම, භාණ්ඩ අපනයන පහළ යෑම පියවා ගැනීමට තරම් සමත් වී නොමැත.

5

දේශීය තරගකරුවන් හට තියුණු ලෙස තරග කිරීමට ඉඩ සැලසීම සඳහා දකුණු කොරියානු රජය විසින් දීර්ඝ කාලයක් පුරාවටම අපනයන අංශයට ලබා දුන් ඉලක්කගත ආධාර බොහොමයකින් පසු කාලයේදී ඉවත් විය. අනෙක් අතට, යුරෝපා සංගමය යුද උපකරණ හැර අනෙකුත් සියලු අපනයන සඳහා දෙනු ලැබූ පහසුකම්වල[4] ප්‍රතිලාභ ලබා ගනිමින් බංගලාදේශය සිය අපනයන 2000 වසරේ සිට පස් ගුණයකින් වර්ධනය කර ගත් අතර, එමගින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන සහ ආර්ථිකය වෙළඳාමට ඇති විවෘතභාවය අඛණ්ඩව වර්ධනය වුවද, මුළු අපනයනවලින් සියයට 90 කට ඇඟලුම් අපනයන දායකත්වය දැරීම හේතුවෙන් නිෂ්පාදන විවිධාංගීකරණය අඛණ්ඩව නොසලකා හැර ඇති බව පෙනී යයි. ශ්‍රී ලංකාවේ පරිදිම, ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමය බංගලාදේශයේ ප්‍රධාන අපනයන පාර්ශ්වකරුවන් වීම නිසා එම කලාපවල සිදු වන අහිතකර වර්ධනයන් කෙරෙහි වඩාත් අවදානම් සහගත තත්ත්වයකට මුහුණ පා ඇත. අපනයන අංශයට අදාළ සියලුම කොටස්කරුවන් දීර්ඝකාලීනව තිරසාර තීරණ ගැනීමට හැකි වන ආකාරයට ප්‍රතිපත්තිවල ස්ථාවරභාවයේ වැදගත්කම ද මෙම රටවල අත්දැකීම් මගින් විදහා දක්වයි. කෙසේ වුවද, මෙවැනි ප්‍රතිපත්ති දේශීය හා ගෝලීය පරිසරය තුළ වර්තමාන හා අනාගත හැඩගැස්ම සඳහා නම්‍යශීලී වීම අවශ්‍ය වේ.

**අපනයන ප්‍රවර්ධනය උදෙසා ජාතික උපයාමාර්ග**

2016 වසරේ දී Hausmann, Rodrik සහ Velasco ගේ වර්ධන නිශ්චය කිරීම් ආකෘති (growth diagnostics model) සහ Bussolo සහ Lopez - Calva (2014) ගේ වත්කම් පාදක වැඩපිළිවෙළ (asset - based framework) සම්බන්ධ කරමින් ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය නිශ්චය කිරීම සම්බන්ධව සිදු කළ ක්‍රමානුකූල ක්‍රියාවලියේ දී "දුගීබව නිමා කිරීම" (Ending Poverty) සහ "සියලු දෙනා අතර බෙදී ගිය ආර්ථික සෞභාග්‍යය" (Shared Economic Prosperity) යන එකිනෙක හා බැඳුණු ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය සඳහා පවතින බාධා සහ ආර්ථික මෙහෙයුම් සාධක සමූහයක් හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ අපනයන වර්ධන විභවතාවන් සැලකිය යුතු මට්ටමකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ වෙළඳාම ආශ්‍රිත ප්‍රතිපත්ති සංශෝධනය කිරීම, පුහුණු ශ්‍රමිකයින් ගණන වැඩි කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයට වැඩි සම්පත් ප්‍රමාණයක් සහ ගුණාත්මකභාවය වැඩිදියුණු කළ හැකි කළමනාකාරිත්වයක් සැපයීම සහ පර්යේෂණ සහ සංවර්ධන ආයතන හා ව්‍යවසායක ජාල අතර සබඳතා ඇති කිරීම හරහා නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම වැනි ක්ෂේත්‍ර වෙත කඩිනම් අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය මෙමගින් පෙන්වා දෙයි. අපනයන ප්‍රවර්ධනය සඳහා උපායමාර්ගයක් සකස් කිරීමේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

4 සියලු ඌන සංවර්ධිත රටවලට යුද උපකරණ හැර අනෙකුත් සියලු අපනයන සඳහා සම්පූර්ණ තීරුබදු නිදහස් කිරීමේ පහසුකම් ලබාදීම යුරෝපා සංගමය විසින් 2001 වසරේදී ක්‍රියාත්මක කරන ලදී.

**සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මඟින් වෙළඳාම සඳහා පහසුකම් සැලසීම**

පොලී සහ විනිමය අනුපාතික ජාත්‍යන්තර හා දේශීය වශයෙන් ආර්ථික කටයුතුවල යෙදීම සඳහා නිෂ්පාදකයින්ට සහ පාරිභෝගිකයින්ට දිරිගැන්වීම් ලබා දෙන ප්‍රධාන ආර්ථික මිලකරණ වේ. මූල්‍ය පිරිවැය, නිෂ්පාදන හා අපනයන කටයුතු සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වන බැවින් ආර්ථිකයක අඩු පොලී අනුපාතික පවත්වා ගැනීම, අපනයන වෙළඳපොළවල දී රටේ තරගකාරිත්වය ස්ථාවරව පවත්වා ගැනීමට උපකාරී වනු ඇත. අඩු හා ස්ථායී උද්ධමන වාතාවරණයක් මගින් අඩු පොලී අනුපාතික පවත්වා ගැනීම තහවුරු කරනු ඇත. තවද, අඩු හා ස්ථායී උද්ධමන වාතාවරණය, ආයෝජකයින්ට දැනුවත්ව දිගුකාලීන තීරණ ගැනීම සඳහා ද අත්‍යවශ්‍ය වේ. විදේශ විනිමය ප්‍රතිපත්තිය, වෙළඳාමේ ප්‍රතිඵල හා සමීප සම්බන්ධතාවයක් පවතින බැවින් සාර්ව ආර්ථික ප්‍රවණතා පෙන්නුම් නොකරන විනිමය අනුපාතිකයක් තුළින් අපනයන වෙළඳාමේ යහපත් කාර්යසාධනයක් අපේක්ෂා කළ නොහැක. දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික අතිප්‍රමාණය වූ තත්ත්වයක පැවතීම මගින් අපනයන කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කර ඇත. නාමික විනිමය අනුපාතිකය අතිප්‍රමාණය කිරීම මගින් විශාල ගෙවුම් ශේෂ හිඟයක් නිර්මාණය වීම සහ විදේශ සංචිත පහළ යෑම සිදු වූ අතර, එමගින් රජයට වාණිජ පොලී අනුපාතික යටතේ ණය ලබා ගැනීමට සිදු වීමෙන් විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගියේය. මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක සියයට ආසන්න තරගකාරී අගයක පවත්වා ගැනීම සඳහා නාමික විනිමය අනුපාතිකය නම්‍යශීලීව පවත්වා ගෙන යෑම සිය අරමුණ බව ශ්‍රී ලංකා මහ බැංකුව දැනටමත් නිවේදනය කර ඇත. එවැනි ප්‍රතිපත්තියක් තුළ විනිමය අනුපාතිකය බොහෝ දුරට වෙළඳපොළ බලවේග මත සාධාරණ ලෙස තීරණය වන අතර, රටේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද උපකාරී වේ. අඩු නාමික පොලී අනුපාතික සහ තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය අත්කර ගැනීම අතිශය තීරණාත්මක බව ද මෙහි ලා සඳහන් කිරීම වැදගත් ය.

**ලිහිල් කරන ලද විදේශ ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යෑම තුළින් විදේශ වෙළඳාමට පහසුකම් සැලසීම**

ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පවතින තියුණු තරගකාරිත්වය සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව දැනට පවතින ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම්වලින් උපරිම ඵල නෙලා ගත යුතු අතර, ආර්ථික සහයෝගිතා ගිවිසුම් මගින් නව වෙළඳ

5

අවස්ථාවන් සඳහා ඇති ඉඩප්‍රස්ථාවන් හඳුනා ගැනීම සඳහා ද අඛණ්ඩව කටයුතු කළ යුතුය. ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කිරීමට හා රාජ්‍ය තාන්ත්‍රික තුලනයක් පවත්වා ගැනීම සඳහා රජය විසින් ගනු ලැබූ පියවර ප්‍රශංසනීය වේ. විශේෂයෙන්ම ශීඝ්‍රයෙන් වර්ධනය වන ආසියාතික රටවල් ඇතුළු නව්‍ය වෙළඳපොළ වෙත වෙළඳ ගිවිසුම් හරහා ප්‍රවිශ්ඨ වීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීම සඳහා වෙළඳ සාකච්ඡා අඛණ්ඩව සිදු කිරීම වැදගත් වේ. ඒ සමගම, අවශ්‍ය නිෂ්පාදිතය අවශ්‍ය ස්ථානයට සැපයීම සඳහා සමීක්ෂණ පදනම් කරගත් වෙළඳපොළ තොරතුරු අපනයනකරුවන් වෙත ලබා දෙමින් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විදේශවල සිටින රාජ්‍ය තාන්ත්‍රික දූත කණ්ඩායම් තම කටයුතු වඩාත් පුළුල්ව හා ශක්තිමත්ව කරගෙන යා යුතුව ඇත.

### විදේශීය වෙළඳාමට අදාළ ප්‍රතිපත්ති සංශෝධනය

ජාත්‍යන්තර වෙළඳාම සඳහා ඉහළ විවෘතභාවය පැවතීම තුළින් ආර්ථිකයේ අපනයන වර්ධනයට හා විවිධාංගීකරණයට මගපෑදෙනු ඇත. බාහිරාභිමුඛ වෙළඳ ප්‍රතිපත්තියක් මගින් පෞද්ගලික අංශයට ආර්ථිකය තුළ වඩාත් ශක්තිමත් භූමිකාවක් ඉටු කිරීම සඳහා ඉඩ ප්‍රස්ථා සළසා දීම තුළින් වඩාත් ඉහළ ප්‍රතිලාභ අත්කර ගත හැකි අතර, එය සමස්ත ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ද හේතු වේ. දේශීය මිල ස්ථායීතාව ඇති කිරීම සඳහා වෙළඳ ක්‍රියාමාර්ග (තීරු බදු හා තීරු බදු නොවන) භාවිතා කිරීම තුළින් නිෂ්පාදන සැලසුම් අඩපණ වීමත් ආනයන ආදේශන ක්‍රියාවලියට දායක වීමත් ඔස්සේ විශාල අවිනිශ්චිතතාවයක් ඇති කෙරෙයි. රටක් වර්ධනය, සේවා නියුක්තිය සහ ආදායම් යනාදියෙහි අඩුවීමක් පිළිගැනීමට සූදානම් නොමැති නම් (1977 ආර්ථික ලිහිල්කරණ යෝජනාවලියට පෙර දක්නට ලැබුණු අඩු වර්ධනය, ඉහළ සේවා වියුක්තිය සහ මූර්ත ආදායම් ඉහළ නොයෑම) ආනයන සීමා කිරීම මගින් දිගුකාලීනව ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟයේ අසමතුලිතතාවය නිවැරදි කළ නොහැක. මීට අමතරව, ආනයන සීමාකිරීම්, අපනයන මත බද්දක් වන බැවින් ආනයන සීමාකිරීම් අපනයන අධෛර්යමත් කරමින් වෙළඳ හිඟය පුළුල් වීමට හේතු විය හැකිය. සීමා කරන ලද වෙළඳ තන්ත්‍රය මගින් ආර්ථිකයේ සියලුම අංශවල නිෂ්පාදන ධාරිතාව හා තරගකාරිත්වය පහළ යෑමට හේතු වී ඇති අතර, එමගින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සඳහා සාපේක්ෂ වාසිය අඩු වීමෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර තලය තුළ පහළ මට්ටමක පවතී.

### සැපයුම් පහසුකම් වැඩිදියුණු කිරීම

විශේෂයෙන්ම වරාය හා ගුවන් තොටුපළ වැනි සැපයුම් සේවා සංවර්ධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම, තරගකාරිත්වය සහතික කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. ගනුදෙනු පිරිවැය අඩුකිරීම සඳහා ඉදිරියේ දී ඇති කිරීමට සැලසුම් කෙරෙන සැපයුම් පහසුකම් කේන්ද්‍රස්ථාන සමග නිදහස් වෙළඳ කලාප, ආර්ථික කොරිඩෝ, ආර්ථික කලාප මෙන්ම අපනයන ගම්මාන ඇති කිරීමේ වර්තමාන ප්‍රතිපත්ති අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය. අපනයන තරගකාරිත්වය ඉහළ නැංවීමට දායක වන යටිතල පහසුකම්, නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදවුමක් වන බැවින් රජයේ ජාතික සංවර්ධන සැලසුම යටතේ යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය හා ප්‍රවේශය ඉහළ නැංවීම වෙත ඉදිරියේදී සැලසුම් කරන ප්‍රතිපත්ති මගින් අවධානය යොමු කළ යුතුව ඇත.

### අපනයන ප්‍රවර්ධනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ගේ කාර්යභාරය

සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා මෙතෙක් පත් වූ රජයන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙත දැඩි අවධානයක් යොමු කර ඇත. එමගින් නව අපනයන ප්‍රවර්ධන උපායමාර්ගයේ වාසි උකහා ගැනීමට හැකි වන සේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල පිරිවැය ඵලදායිතාවයෙන් යුතු නිමැවුම් නිශ්චිතව හඳුනා ගත් අපනයන ලෙස හෝ විශාල ගෝලීය ව්‍යාපාර ආයතන සඳහා යෙදවුම් ලෙස අලෙවි කිරීමට හා එමගින් ගෝලීය වෙළඳපොළ සමග සම්බන්ධතා ගොඩනගා ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට හැකිවනු ඇත. වර්තමාන නිෂ්පාදන ප්‍රවාහ ක්‍රියාවලියට විශාල වශයෙන් සේවා අංශය දායක වන හෙයින් සේවා අංශය නවීකරණය කිරීම ද ඉතා වැදගත්ය. විශේෂයෙන්ම, සේවා කර්මාන්ත සඳහා විශාල වශයෙන් ප්‍රාග්ධනය හෝ අමුද්‍රව්‍ය අවශ්‍ය නොවන බැවින් ඒ ආශ්‍රිත කටයුතුවල නිරතවීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කළ හැක.

### අපනයන ප්‍රවර්ධනය සඳහා විදේශීය සෘජු ආයෝජන

අඩු තාක්ෂණයක් සහිත නිෂ්පාදිත කිහිපයක් මත කේන්ද්‍රගතව ඇති ශ්‍රී ලංකාවේ වර්තමාන අපනයන පදනම උසස් තාක්ෂණයක් සහිත නිෂ්පාදිත දක්වා වැඩි දියුණු කිරීමට මෙන්ම අපනයන පැස විවිධාංගීකරණය කිරීමට ද විදේශීය සෘජු ආයෝජන හේතු වනු ඇත. විදේශීය සෘජු ආයෝජන යනු විදේශීය අරමුදල් ප්‍රභවයක් පමණක් නොව, විදේශීය තාක්ෂණික හා දැනුම් ප්‍රභවයක්ද වේ. ඉහළ නිපුණතාවයකින් යුතු සහ දැනුම් සම්භාරයකින් යුතු ශ්‍රම බලකායකින් සමන්විත වීම ශ්‍රී ලංකාවට වාසි සහගත වන අතර, එමගින් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) වැනි ව්‍යාපාර කටයුතු සඳහා ශ්‍රී ලංකාව වෙත ඇති ආකර්ෂණය තවදුරටත් ඉහළ නැංවීමට හැකි වේ. එසේම, ශ්‍රී ලංකාවට ගෝලීය අගය දාමයන්ට ඇතුළු වීමේ අවස්ථා සඳහා ද මෙම ක්‍රියාමාර්ග උපකාරී වනු ඇත. විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ දී ශ්‍රී ලංකාව සිය බාහිර තරගකාරිත්වය ඉහළ නංවා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. එසේ තරගකාරිත්වය ඉහළ නංවා ගැනීමට නම්, ශ්‍රී ලංකාව විසින් විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඇති බාධා ඉවත් කර ගැනීම සඳහා දැඩි ප්‍රතිසංස්කරණ වැඩසටහනක් දියත් කළ යුතුව ඇත.

5

5

### පර්යේෂණ හා සංවර්ධනය සහ නවෝත්පාදන දිරිමත් කිරීම

ගෝලීය වෙළඳපොළ තුළ අපනයන සඳහා දායකත්වය ඉහළ නැංවීමට රටවලට උදව් වෙමින් නිෂ්පාදන පදනම විවිධාංගීකරණය කිරීමට මෙන්ම අවසාන නිෂ්පාදිතය සඳහා වඩා වැඩි අගයක් එකතු කිරීමට සහ පිරිවැය තරගකාරිත්වය වැඩිදියුණු කිරීමටද නවෝත්පාදන හේතු වේ. පර්යේෂණ සහ සංවර්ධන වියදම්වල සහ නවෝත්පාදන ප්‍රවර්ධනයේ තිරසාර වර්ධනයන් මගින් තරගකාරිත්වය කෙරෙහි දිගුකාලීන බලපෑමක් ඇති කළ හැකිය. පර්යේෂණ හා සංවර්ධන සහ නවෝත්පාදනයන්ට පෞද්ගලික අංශය සම්බන්ධ වීම තුළින් එම පර්යේෂණවල ප්‍රතිඵල වාණිජකරණය වීම කෙරෙහි තීරණාත්මක වන බැවින් ව්‍යවසායක ජාල හා දැනට පවතින පර්යේෂණ හා සංවර්ධන පහසුකම් අතර සම්බන්ධය ගොඩනැගීමට රජය විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

### ඉදිරි දැක්ම

ආර්ථික වර්ධනය මෙහෙයවන ප්‍රධාන සාධකයක් ලෙස අපනයන අංශයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා රජයේ සමස්ත සංවර්ධන උපායමාර්ගය තුළ අපනයන අංශය සංවර්ධනය කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම වැදගත් බව පෙනී යයි. මේ සඳහා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සහ අපනයන සංවර්ධන මණ්ඩලය මූලික වී ක්‍රියාමාර්ග රැසක් මේ වන විට දියත් කර ඇත. අපනයන සංවර්ධන මණ්ඩලය මුල පුරා ඇති ජාතික අපනයන උපායමාර්ගය, රජයේ හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධ ප්‍රයත්නයක් වන අතර, එමගින් වෙළඳාම සහ තරගකාරිත්වය වර්ධනය උදෙසා පස් අවුරුදු සැලැස්මක් ඉදිරිපත් කරයි. මීට සමගාමීව, අපනයන වෙත යොමු වූ විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම, වෙළඳ සැපයුම් සේවා පහසුකම් වැඩිදියුණු කිරීම, රේගු කටයුතු වඩාත් විනිවිදභාවයකින් හා කාර්යක්ෂමව සිදු කිරීම සහ වෙනත් විවිධ ක්‍රියාමාර්ග තුළින් ව්‍යාපාර ආයතනයකට ලෝක වෙළඳපොළ තුළ තරග කිරීමේ හැකියාව ශීඝ්‍ර ලෙස ඉහළ නැංවීම ඉලක්ක කරමින් ජාතික වෙළඳ ප්‍රතිපත්තිය කෙටුම්පත් කර ඇත. පුළුල් පදනමක් සහිත ආයතනික සහායක් ලබාදීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් රජය විසින් දැනටමත් ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය සහ සංවර්ධනය සඳහා වන නියෝජිතායතනය ලෙස නියෝජිතායතන දෙකක් ස්ථාපිත කර ඇත. ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය ඉන්දියානු උප මහද්වීපයේ රටවල් සමඟ පවතින වෙළඳ ගිවිසුම්වල ඇති ගැටලු නිරාකරණය කරන අතරතුර, ශ්‍රී ලංකාවේ වැඩිදියුණු වී ඇති ආයෝජන පරිසරය ප්‍රයෝජනයට ගෙන උප මහාද්වීපයේ සියලුම වෙළඳපොළ ආවරණය වන පරිදි ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින් ඉන්දියාව සමඟ ආර්ථික සහයෝගිතා ගිවිසුමක් ඇති කර ගැනීම පිළිබඳ විමර්ශනය කරමින් සිටී. එසේම ජාත්‍යන්තර වෙළඳාම සඳහා වන නියෝජිතායතනය රජයේ නොබැඳි විදේශ ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි උප මහද්වීපයෙන් ඔබ්බට ගොස් විශේෂයෙන්ම බිලියන 3 කට ආසන්න ප්‍රමාණයක වෙළඳපොළකට සැපයුම් කළ හැකි චීනය, සිංගප්පූරුව, යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ නව ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික වෙළඳ අවස්ථා පිළිබඳව සොයා බලයි. අනෙක් අතට, සංවර්ධනය සඳහා වන නියෝජිතයාතනය පෞද්ගලික අංශය සමඟ එක්ව සංවර්ධන ක්‍රියාවලිය තුළ පවතින බාධා හඳුනා ගැනීමට සහ ඊට පිළිතුරු සැපයීම සඳහා විවිධ අංශ අතර ක්‍රියා කළ හැකි බහුක්‍රියාකාර්ය කණ්ඩායම් ගොඩනැගීම, එමගින් පෞද්ගලික අංශයේ හැකියාවන් වර්ධනය කිරීම, නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ අපනයන වර්ධනය කිරීම යන සංවර්ධන ප්‍රයත්නයන්ට දායකත්වය දැක්වීමට අපේක්ෂා කරයි. අපනයන අංශය යළි නගාසිටුවීම සඳහා ආර්ථික පරිවර්තනයක් ඇති කිරීමේ දී රජය විචක්ෂණශීලී හා දිගුකාලීන භූමිකාවක් සිදු කිරීම අවශ්‍ය වනු ඇති අතර, පෞද්ගලික අංශය ආර්ථික වර්ධනයේ ප්‍රවාහ බලවේගය බවට පත්වීමට ඉඩ සැලසිය යුතුය. අපනයන ඉහළ නැංවීම, වෙළඳ හිඟය අඩු කිරීමට හා ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය අඩු කිරීමට උපකාරී වනු ඇත. නැගෙනහිර හා අග්නිදිග ආසියාවේ සාර්ථකත්වයට පත්වූ රටවල වර්ධන ක්‍රියාවලිය ජංගම ගිණුමේ අතිරික්තයන් තුළින් අත්පත් කරගෙන ඇත. දශක ගණනාවක් පුරා ශ්‍රී ලංකාව විසින් අත්දකිනු ලබන විදේශීය අංශයේ අසමතුලිතතාවයන් තුරන් කිරීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

දූරදර්ශී සහ ප්‍රායෝගික උපායමාර්ගයන් අනුගමනය කිරීම, අපනයන අංශය යළි නඟා සිටුවීම සඳහා තීරණාත්මක වනු ඇත. මනාව සම්බන්ධීකරණය කරන ලද කාර්මික හා වෙළඳ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමේ දී අදාළ සියලුම පාර්ශ්වකරුවන් අතර පොදු එකඟතාවයක් පැවතිය යුතු අතර, එය සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සහ රජයේ සමස්ත උපායමාර්ගික දිශානතිය හා අනුගත විය යුතුය. මෙය ස්ථාවර, ප්‍රයෝගික හා අදාළ සියලු පාර්ශ්වකරුවන් විසින් පිළිගන්නා අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්තියක පදනම වශයෙන් සැලකිය හැකිය. රජය මගින් ගෙන ඇති මෙම මුලපිරීම් මගින් අවශ්‍ය ප්‍රතිපත්ති දිශානතිය ලබාදීමටත් රටේ අපනයන අංශය නැවත නඟා සිටුවීමට සහාය ලබාදීමටත් අපේක්ෂිතය.

මූලාශ්‍ර:

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ විවිධ ප්‍රකාශන

ජාතික වෙළඳ ප්‍රතිපත්ති කෙටුම්පත (2016), සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය

Huyen, N.T.N. and Tuan B.A. (2004), "Vietnams' Economic Development, Opportunities and Challenges towards the Integration Tendency", National Economics University, Hanoi, Vietnam.

Mah, J.S. (2010), "Export Promotion Policies, Export Composition and Economic Development of Korea", Law and Development Institute Inaugural Conference, Australia.

"Sri Lanka Ending Poverty and Promoting Shared Prosperity: A Systematic Country Diagnostic" (2015), World Bank.

නිෂ්පාදිත අපනයන ආදායම 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 287 ක් දක්වා සියයට 23.3 කින් පහළ ගිය අතර, ඒ සඳහා සිංගප්පූරුව සහ ඉන්දියාව වැනි කලාපයේ අනෙකුත් වෙළඳපොළවල ක්‍රියාකරුවන්ගෙන් එල්ල වූ ඉහළ තරගකාරිත්වය ද තරමක් දුරට බලපෑවේය. ගෝලීය ඉල්ලුමෙහි අඩුවීමක් පිළිබිඹු කරමින් මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම පසුගිය වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 274 ක් දක්වා සියයට 17.4 කින් පහළ ගියේය. තවද, සත්ත්ව ආහාර, මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත, පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත අපනයන ආදායම ද මෙම වසර තුළ දී පහළ ගියේය.


**කාර්මික අපනයන ආදායම අඩු වීමේ බලපෑම යම්තාක් දුරට අඩු කරමින් මුළු අපනයනවලින් සියයට 47 ක් වන රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 4,884 ක් දක්වා සියයට 1.3 කින් ඉහළ ගියේය.** අපනයන පරිමාව සහ අපනයන වටිනාකම යන දෙයාකාරයෙන් ම, ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය අඛණ්ඩව ශ්‍රී ලංකාවේ ඇඟලුම් සඳහා ප්‍රධානතම ගැණුම්කරුවන් ලෙස පැවතුණි. 2016 වසරේ දී මෙම වෙළඳපොළ දෙකෙන් උපයා ගත් අපනයන ආදායම පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 2,104 ක් සහ එ.ජ. ඩොලර් මිලියන 1,905 ක් වූ අතර එහි එකතුව මුළු ඇඟලුම් අපනයන ආදායමෙන් සියයට 87.1 ක් විය. මේ අතර, කැනඩාව, චීනය, ඕස්ට්‍රේලියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඇතුළත්ව සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත ඇඟලුම් අපනයනය කිරීමෙන් ලද ආදායම 2015 වසරේ වාර්තා කළ සියයට 4.6 ක වර්ධනය හා සැසඳීමේ දී 2016 වසරේ දී සියයට 7.9 කින් වර්ධනය විය. යකඩ හා වානේ, ඇලුමිනියම් සහ තඹ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ මූල ලෝහ සහ උපාංග අපනයන ආදායම සියයට 60.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2016 වසර තුළ ඇලුමිනියම් සහ තඹ ඇතුළු මූල ලෝහවල ගෝලීය මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පැවතුණ ද, 2015 වසරට සාපේක්ෂව ඒවායේ සාමාන්‍ය මිල මට්ටම් පහළ අගයක පැවතුණි. ප්‍රධාන වශයෙන් ම පාවහන් අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යෑම නිසා සම්භාණ්ඩ අපනයන ආදායම සියයට 22.0 කින් ඉහළ ගියේය. රබර් අත්වැසුම් සහ රබර් ටයර් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම සියයට 0.9 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ආහාර හා පාන වර්ග ඉහළ අපනයන ආදායම් වාර්තා කළ අනෙකුත් කාර්මික අපනයන වේ.

**මුළු අපනයන ආදායමට සියයට 0.3 ක පමණ දායකත්වයක් දක්වන ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම 2016 වසර තුළ දී සියයට 2.1 කින් ඉහළ ගියේය.** පාෂාණ සහ ගල් අපනයන ආදායම ඉහළ ගිය අතර ලෝපස්, ලෝබොර සහ අළු අපනයන ආදායම පහළ ගියේය.

### 5.3.2 ආනයන ක්‍රියාකාරිත්වය

**2016 වසරේ අවසාන කාර්තුවේ දී ආනයන වියදම් කැපී පෙනෙන ලෙස ඉහළ යෑම, 2016 වසරේ ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ම හේතු විය.** ආනයන වියදම ඉහළ යෑම සඳහා ආයෝජන භාණ්ඩ සහ ඉන්ධන නොවන අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතු වූ අතර, ඉන්ධන සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ වැනි අනෙකුත් කාණ්ඩවල ආනයන වියදම් අඩු වීමේ වාසි සහගත බලපෑම ඒ හේතුවෙන් මගහැරී ගියේය. 2016 වසරේ දී ආහාර හා පාන සඳහා වූ ආනයන වියදම බොහෝ දුරට 2015 වසරේ පැවති මට්ටමේ ම නොවෙනස්ව පැවතුණි. ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩවල මිල ගණන් පහළ යෑම සහ රජය හා මහ බැංකුව විසින් ආනයන වියදම පහළ දැමීම සඳහා ගනු ලැබූ විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හමුවේ වුව ද, රටෙහි ආර්ථික කටයුතු වැඩි දියුණු වීම හේතුවෙන් සමස්ත ආනයන වියදම ඉහළ ගියේය. ඒ අනුව, 2016 වසරේ දී මුළු ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 19,400 ක් දක්වා සියයට 2.5 කින් මධ්‍යස්ථ ලෙස ඉහළ ගිය අතර, ඉන්ධන නොවන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 16,919 ක් දක්වා සියයට 4.2 කින් ඉහළ ගියේය.

**5.3 රූප සටහන**
**ආනයන සංයුතිය - 2016**



මූලය: ශ්‍රී ලංකා රේගුව

5

### 5.3 සංඛ්‍යා සටහන
### ආනයන සංයුතිය

| කාණ්ඩය | 2015 | | 2016 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,713.5** | **24.9** | **4,319.0** | **22.3** | **-394.5** | **-8.4** | **-84.8** |
| ආහාර හා පාන වර්ග | 1,627.8 | 8.6 | 1,627.4 | 8.4 | -0.4 | … | -0.1 |
| සහල් | 135.1 | 0.7 | 12.8 | 0.1 | -122.3 | -90.5 | -26.3 |
| සීනි හා රසකැවිලි | 254.4 | 1.3 | 344.6 | 1.8 | 90.2 | 35.5 | 19.4 |
| කිරි නිෂ්පාදිත | 250.9 | 1.3 | 249.3 | 1.3 | -1.6 | -0.6 | -0.3 |
| පරිප්පු | 148.0 | 0.8 | 139.4 | 0.7 | -8.6 | -5.8 | -1.8 |
| වෙනත් | 839.4 | 4.4 | 881.3 | 4.5 | 41.9 | 5.0 | 9.0 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 3,085.7 | 16.3 | 2,691.5 | 13.9 | -394.1 | -12.8 | -84.7 |
| රථවාහන | 1,359.6 | 7.2 | 794.8 | 4.1 | -564.9 | -41.5 | -121.4 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 459.8 | 2.4 | 525.8 | 2.7 | 66.0 | 14.3 | 14.2 |
| ගෘහ උපකරණ | 221.0 | 1.2 | 270.7 | 1.4 | 49.7 | 22.5 | 10.7 |
| රෙදිපිළි හා උපාංග | 390.1 | 2.1 | 365.8 | 1.9 | -24.3 | -6.2 | -5.2 |
| වෙනත් | 655.0 | 3.5 | 734.4 | 3.8 | 79.3 | 12.1 | 17.0 |
| **අන්තර් භාණ්ඩ** | **9,638.2** | **50.9** | **9,870.0** | **50.9** | **231.8** | **2.4** | **49.8** |
| ඉන්ධන | 2,699.6 | 14.3 | 2,481.0 | 12.8 | -218.6 | -8.1 | -47.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,296.2 | 12.1 | 2,704.9 | 13.9 | 408.7 | 17.8 | 87.8 |
| දියමන්ති හා අගනා ගල් වර්ග හා ලෝහ | 161.5 | 0.9 | 514.4 | 2.7 | 352.9 | 218.5 | 75.8 |
| රසායනික නිෂ්පාදිත | 870.3 | 4.6 | 856.3 | 4.4 | -14.0 | -1.6 | -3.0 |
| තිරිඟු හා ඉරිඟු | 357.2 | 1.9 | 249.2 | 1.3 | -108.0 | -30.2 | -23.2 |
| පොහොර | 289.6 | 1.5 | 136.9 | 0.7 | -152.8 | -52.7 | -32.8 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 2,963.7 | 15.7 | 2,927.3 | 15.1 | -36.5 | -1.2 | -7.8 |
| **ආයෝජන භාණ්ඩ** | **4,567.0** | **24.1** | **5,198.0** | **26.8** | **631.0** | **13.8** | **135.6** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,352.0 | 7.1 | 1,568.7 | 8.1 | 216.7 | 16.0 | 46.6 |
| ප්‍රවාහන උපකරණ | 930.9 | 4.9 | 880.2 | 4.5 | -50.8 | -5.5 | -10.9 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,278.1 | 12.0 | 2,740.7 | 14.1 | 462.6 | 20.3 | 99.4 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 5.9 | … | 8.5 | … | 2.5 | 42.3 | 0.5 |
| **වර්ග නොකළ ආනයන** | **15.9** | **0.1** | **13.1** | **0.1** | **-2.9** | **-17.9** | **-0.6** |
| **මුළු ආනයන (ආ)** | **18,934.6** | **100.0** | **19,400.1** | **100.0** | **465.5** | **2.5** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඇ)** | **135.94** | | **145.60** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රති ආනයන ඇතුළත් නොවේ.
(ඇ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම, සමස්ත ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් ම දායක විය.** ප්‍රවාහන උපකරණ හැර ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති අනෙකුත් ප්‍රධාන කාණ්ඩවල ආනයන වර්ධනයන් පිළිබිඹු කරමින් 2016 වසරේ දී මුළු ආනයන වියදමෙන් සියයට 27 ක් වූ ආයෝජන භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 5,198 ක් දක්වා සියයට 13.8 කින් ඉහළ ගියේය. සියලුම උපකාණ්ඩයන්හි ආනයන වියදම්වල කැපී පෙනෙන ඉහළ යෑම් පිළිබිඹු කරමින් 2016 වසරේ දී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,741 ක් දක්වා සියයට 20.3 කින් ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ ආනයන වියදම ඉහළ යෑම සඳහා ඉලෙක්ට්‍රොනික උපකරණ, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොටස්, විදුලි සන්දේශ උපකරණ සහ කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර සඳහා වූ ආනයන වියදම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායකත්වය දක්වන ලදී. 2016 වසරේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,569 ක් දක්වා සියයට 16.0 කින් ඉහළ ගියේය. පරිවරණය කළ කම්බි සහ කේබල හැර ගොඩනැගිලි ද්‍රව්‍ය යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලුම උප කාණ්ඩවල ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම වර්ධනය සඳහා සිමෙන්ති, යකඩ හා වානේ උපාංග, පිඟන් මැටි නිෂ්පාදිත සහ දැව නිෂ්පාදිත ආනයන ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, ප්‍රධාන වශයෙන්ම ත්‍රිරෝද රථ සහ බස්රථ සඳහා වූ ආනයන වියදම් අඩු වීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 880 ක් දක්වා සියයට 5.5 කින් පහළ ගියේය.

**2016 වසරේ දී මුළු ආනයන වියදමෙන් සියයට 51 ක් වූ අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 9,870 ක් දක්වා සියයට 2.4 කින් ඉහළ ගියේය.**

2016 වසරේ දී ඉන්ධන ආනයන වියදම ඉක්මවා යමින් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ප්‍රධාන ආනයන වියදම් කාණ්ඩය බවට පත් වූ අතර, රෙදිපිළි හා ඇඟලුම් අපනයන ඉහළ යෑමට සමගාමීව එය එ.ජ. ඩොලර් මිලියන 2,705 ක් දක්වා සියයට 17.8 කින් ඉහළ ගියේය. රත්‍රන් ආනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී රත්‍රන් ආනයන වියදම 2015 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 42 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 374 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2016 වසරේ පළමු කාර්තු තුන තුළ දී ජාත්‍යන්තර භාණ්ඩ වෙළඳපොළෙහි රත්‍රන් මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද අවසාන කාර්තුවේ දී පහළ යෑමක් දක්නට ලැබිණි.

**බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන වියදම් පහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී ඉන්ධන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,481 ක් දක්වා සියයට 8.1 කින් පහළ ගිය අතර, ගල්අඟුරු ආනයන වියදම ඉහළ ගියේය.** 2016 වසරේ දී බොරතෙල් ආනයන පරිමාව සියයට 4.5 කින් පහළ ගිය අතර, බොර තෙල් බැරලයක් සඳහා ගෙවූ සාමාන්‍ය ආනයන මිල 2015 දී වාර්තා වූ එ.ජ. ඩොලර් 54.80 ට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් 46.30 ක් දක්වා අඩු විය. මෙම කාලය තුළදී පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන මිල සියයට 19.9 කින් පහළ ගිය ද රට තුළ පැවති නියං තත්ත්වය හේතුවෙන් තාප විදුලිබල උත්පාදනය ඉහළ යෑම හේතුකොටගෙන පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව සියයට 17.0 කින් ඉහළ ගියේය. 2016 වසරේ දී ප්‍රධාන වශයෙන්ම ගල්අඟුරු දහනය මගින් විදුලිබල උත්පාදනය ද සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් ගල්අඟුරු ආනයන වියදම සියයට 23.9 කින් ඉහළ ගියේය. ඒ අනුව, 2015 වසරේ දී සහ 2014 වසරේ දී මුළු ආනයන වියදමෙන් පිළිවෙළින් සියයට 14.3 ක් සහ සියයට 23.7 ක් වූ ඉන්ධන ආනයන වියදම, 2016 වසරේ දී සියයට 12.8 ක් දක්වා තවදුරටත් පහළ ගියේය. මේ අතර, ආනයන මිල සහ ආනයන පරිමාව යන දෙකෙහිම අඩු වීම හේතුවෙන් පොහොර ආනයන වියදම සියයට 52.7 කින් පහළ ගිය අතර, තිරිඟු සහ ඉරිඟු ආනයන වියදම සියයට 30.2 කින් පහළ ගියේය. ආහාර සැකසුම්, සකස් නොකළ දුම්කොළ, මූල ලෝහ, රසායනික නිෂ්පාදිත සහ ඛනිජ ද්‍රව්‍ය නිෂ්පාදිත වැනි අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයන වියදම 2016 වසරේ දී පසුගිය වසරට සාපේක්ෂව පහළ ගියේය.

**5.4 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආනයනවල පරිමාවන්**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 (අ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **36** | **23** | **600** | **286** | **30** |
| පළමු කාර්තුව | 15 | 9 | 6 | 176 | 6 |
| දෙවන කාර්තුව | 7 | 6 | 102 | 91 | 9 |
| තෙවන කාර්තුව | 10 | 4 | 145 | 9 | 6 |
| සිව්වන කාර්තුව | 4 | 4 | 348 | 9 | 8 |
| **තිරිඟු (ආ)** | **1,084** | **895** | **1,179** | **1,208** | **948** |
| පළමු කාර්තුව | 353 | 197 | 271 | 242 | 171 |
| දෙවන කාර්තුව | 235 | 326 | 324 | 342 | 326 |
| තෙවන කාර්තුව | 291 | 170 | 291 | 373 | 271 |
| සිව්වන කාර්තුව | 205 | 201 | 292 | 251 | 179 |
| **සීනි** | **569** | **548** | **520** | **624** | **651** |
| පළමු කාර්තුව | 158 | 126 | 131 | 169 | 147 |
| දෙවන කාර්තුව | 135 | 175 | 162 | 161 | 144 |
| තෙවන කාර්තුව | 114 | 118 | 152 | 156 | 179 |
| සිව්වන කාර්තුව | 162 | 129 | 75 | 137 | 181 |
| **බොරතෙල් (ආ)** | **1,486** | **1,743** | **1,824** | **1,763** | **1,685** |
| පළමු කාර්තුව | 558 | 482 | 548 | 369 | 372 |
| දෙවන කාර්තුව | 413 | 545 | 365 | 355 | 456 |
| තෙවන කාර්තුව | 137 | 315 | 462 | 472 | 384 |
| සිව්වන කාර්තුව | 379 | 401 | 449 | 567 | 473 |
| **පිරිපහදු කළ ඛනිජතෙල් (ආ)** | **3,961** | **2,907** | **3,385** | **3,321** | **3,885** |
| පළමු කාර්තුව | 1,036 | 673 | 970 | 799 | 830 |
| දෙවන කාර්තුව | 903 | 756 | 762 | 952 | 1,163 |
| තෙවන කාර්තුව | 997 | 791 | 1,006 | 744 | 749 |
| සිව්වන කාර්තුව | 1,025 | 687 | 647 | 826 | 1,142 |
| **පොහොර** | **640** | **600** | **765** | **873** | **527** |
| පළමු කාර්තුව | 129 | 61 | 202 | 163 | 139 |
| දෙවන කාර්තුව | 176 | 139 | 190 | 244 | 135 |
| තෙවන කාර්තුව | 226 | 187 | 95 | 189 | 126 |
| සිව්වන කාර්තුව | 108 | 214 | 277 | 277 | 127 |

(අ) තාවකාලික
(ආ) ගළපන ලද

මූලයන්: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරෙන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2016 වසරේ දී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම අඩු වීම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,319 ක් දක්වා සියයට 8.4 කින් පහළ ගියේය.** ප්‍රධාන වශයෙන් පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයනය අඩු වීම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 2,692 ක් දක්වා සියයට 12.8 කින් පහළ ගියේය. මෙම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ රජය මගින් රථවාහන සඳහා වන ආනයන බදු ඉහළ දැමීම සහ මහ බැංකුව මගින් බැංකුවලින් සහ මූල්‍ය ආයතන මගින් රථවාහන මිලදී ගැනීම සඳහා සපයනු ලබන ණය සහ අත්තිකාරම් සඳහා උපරිම ණය අනුපාතයක් පැනවීමට ගත් සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ගයන්ය. 2016 වසරේ දී රෙදිපිළි හා උපාංග, මුද්‍රිත ද්‍රව්‍ය හා ලිපිද්‍රව්‍ය සහ රබර් නිෂ්පාදිත ආනයන වියදම ද පහළ ගියේය. එයට වෙනස්ව යමින් බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම එ.ජ. ඩොලර්

5

මිලියන 526 ක් දක්වා සියයට 14.3 කින් ඉහළ ගියේය. ගෘහ උපකරණ සහ ගෘහ භාණ්ඩ හා දැව භාණ්ඩ ආනයන වියදම ද පිළිවෙළින් සියයට 22.5 කින් සහ සියයට 21.5 කින් ඉහළ ගියේය. ඒ අනුව, ආහාර හා පාන වර්ග හැර අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම, මුළු ආනයන වියදමෙන් සියයට 14 කට දායකත්වය දැක්වීය.


**2016 වසරේ ආහාර හා පාන වර්ග ආනයන වියදම 2015 වසරේ වාර්තා වූ මට්ටමෙන් බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි.** ප්‍රධාන වශයෙන්ම ආනයන පරිමාවට වඩා ආනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී සීනි ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 343 ක් දක්වා සියයට 35.6 කින් ඉහළ ගියේය. ආනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන් පාන වර්ග, කුළුබඩු, මුහුදු ආහාර සහ පලතුරු ආනයන වියදම ද ඉහළ ගියේය. මේ අතර, සහල් ආනයන පරිමාව අඩු වීම සහ එමගින් සහල් ආනයන වියදම අඩු වීම, ආනයන වියදම ඉහළ යෑමේ බලපෑම පියවා ගැනීමට විශාල ලෙස දායක විය. දේශීය වෙළඳපොළෙහි සහල් සැපයුම ඉහළ යෑම හේතුවෙන් සහල් ආනයනය අධෛර්යමත් කිරීමට 2015 වසරේ සහ 2016 වසරේ මුල් කාලයේ දී සහල් ආනයනය මත වූ බදු ඉහළ දැමීම හේතුවෙන් සහල් ආනයන පරිමාව 2015 වසරේ වාර්තා වූ මෙට්‍රික් ටොන් 285,604 ට සාපේක්ෂව 2016 වසරේ දී මෙට්‍රික් ටොන් 29,524 දක්වා පහළ ගියේය. කිරිපිටි ආනයන පරිමාව ඉහළ ගිය ද, කිරිපිටිවල සාමාන්‍ය ආනයන මිල සැලකිය යුතු ලෙස පහළ යෑම නිසා 2016 වසරේ දී කිරි ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 249 ක් දක්වා සියයට 0.6 කින් සුළු වශයෙන් අඩු විය. 2016 වසරේ දී ළූණු, පරිප්පු සහ අල සඳහා වූ ආනයන වියදම් ද පහළ ගියේය.

### 5.3.3 වෙළඳ ශේෂය

**2016 වසරේ පළමු මාස හතර තුළ දී සමුච්චිත වශයෙන් සැලකූ විට වෙළඳ හිඟයෙහි අඩු වීමක් දක්නට ලැබුණ ද ඉන් පසුව ප්‍රසාරණය වීම හේතුවෙන් 2016 වසරේ වෙළඳ හිඟය පුළුල් විය.** 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී අපනයන ආදායම අඩු වීම සහ විශේෂයෙන්ම 2016 වසරේ අවසාන කාර්තුව තුළ දී අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යෑම, 2016 වසරේ වෙළඳ හිඟය ඉහළ යෑමට හේතු විය. 2016 වසරේ දී වෙළඳ හිඟය, 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,388 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 9,090 දක්වා පුළුල් විය. 2015

**5.4 රූප සටහන**

**අපනයන, ආනයන සහ වෙළඳ ශේෂය**




මූලය: ශ්‍රී ලංකා රේගුව

වසරේ දී, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.4 ක් වූ වෙළඳ හිඟය 2016 වසරේ දී සියයට 11.2 ක් දක්වා ඉහළ ගියේය.


### 5.3.4 වෙළඳ මිල අනුපාතය

**2016 වසරේ දී වෙළඳ මිල අනුපාතය වර්ධනය විය.** අපනයන මිල දර්ශකයෙන් පෙන්නුම් කළ අඩු වීමට සාපේක්ෂව ආනයන මිල දර්ශකය කැපී පෙනෙන ලෙස අඩු වීම මත වෙළඳ මිල අනුපාතය සියයට 3.7 කින් වර්ධනය විය. මේ අනුව 2015 වසරේ දී දර්ශක අංක 100.3 ක් ව පැවැති වෙළඳ මිල අනුපාතය 2016 වසරේ දී දර්ශක අංක 104.0 ක් දක්වා වර්ධනය විය.

**සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවලට අදාළව මිල දර්ශක අඩු වීම හේතුවෙන් 2016 වසරේ දී සමස්ත අපනයන මිල දර්ශකය සියයට 1.5 කින් පහත වැටුණි.** විශේෂයෙන්ම, 2015 වසරට සාපේක්ෂව 2016

**5.5 රූප සටහන**

**වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.5 සංඛ්‍යා සටහන**

**වෙළඳ දර්ශක (අ)**

2010 = 100

| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 (ආ) | වර්ධනය % | 2015 | 2016 (ආ) | වර්ධනය % | 2015 | 2016 (ආ) | වර්ධනය % |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **107.6** | **100.9** | **-6.3** | **95.6** | **90.8** | **-5.0** | **112.6** | **111.2** | **-1.3** |
| තේ | 93.1 | 88.1 | -5.3 | 91.3 | 86.2 | -5.5 | 102.0 | 102.2 | 0.2 |
| රබර් | 15.1 | 18.9 | 25.0 | 21.0 | 27.2 | 29.3 | 71.8 | 69.4 | -3.3 |
| පොල් | 212.3 | 220.9 | 4.0 | 159.4 | 174.1 | 9.3 | 133.2 | 126.9 | -4.8 |
| කුළුබඩු | 182.2 | 153.0 | -16.0 | 118.3 | 100.3 | -15.2 | 154.0 | 152.6 | -0.9 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 224.6 | 159.7 | -28.9 | 205.3 | 149.6 | -27.1 | 109.4 | 106.8 | -2.4 |
| **කාර්මික අපනයන** | **131.6** (ඇ) | **130.3** | **-1.0** | **144.4** | **144.9** | **0.4** | **91.1** (ඇ) | **89.9** | **-1.3** |
| රෙදිපිළි හා ඇඟලුම් | 143.7 | 145.6 | 1.3 | 126.4 | 127.1 | 0.5 | 113.7 | 114.6 | 0.8 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 142.1 | 109.0 | -23.3 | 208.6 | 185.8 | -10.9 | 68.1 | 58.6 | -13.9 |
| රබර් නිෂ්පාදිත | 136.7 | 137.9 | 0.9 | 96.9 | 104.2 | 7.5 | 141.1 | 132.4 | -6.2 |
| **ඛනිජමය අපනයන** | **117.2** | **119.7** | **2.1** | **82.4** | **88.9** | **7.9** | **142.2** | **134.6** | **-5.4** |
| **මුළු අපනයන** | **122.3** (ඇ) | **119.6** | **-2.2** | **128.0** | **127.0** | **-0.7** | **95.6** (ඇ) | **94.1** | **-1.5** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **190.5** | **174.5** | **-8.4** | **177.9** | **156.5** | **-12.0** | **107.1** | **111.5** | **4.1** |
| ආහාර හා පාන වර්ග | 123.1 | 123.0 | … | 128.1 | 124.1 | -3.1 | 96.0 | 99.1 | 3.2 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 268.0 | 233.7 | -12.8 | 235.0 | 193.8 | -17.5 | 114.0 | 120.6 | 5.8 |
| **අන්තර් භාණ්ඩ** | **119.8** | **122.6** | **2.4** | **128.7** | **142.5** | **10.8** | **93.1** | **86.0** | **-7.6** |
| ඉන්ධන | 88.8 | 81.6 | -8.1 | 116.6 | 129.5 | 11.1 | 76.2 | 63.0 | -17.3 |
| පොහොර | 120.6 | 57.0 | -52.8 | 129.5 | 68.6 | -47.1 | 93.1 | 83.1 | -10.7 |
| රසායනික නිෂ්පාදිත | 167.4 | 164.7 | -1.6 | 155.6 | 163.4 | 5.1 | 107.6 | 100.8 | -6.3 |
| තිරිඟු සහ ඉරිඟු | 134.6 | 93.9 | -30.2 | 121.3 | 92.7 | -23.6 | 110.9 | 101.3 | -8.7 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 126.9 | 149.5 | 17.8 | 120.4 | 138.2 | 14.7 | 105.4 | 108.2 | 2.7 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 145.5 | 146.1 | 0.4 | 142.6 | 155.7 | 9.2 | 102.0 | 93.8 | -8.0 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 42.8 | 136.2 | 218.5 | 49.1 | 155.0 | 215.4 | 87.1 | 87.9 | 1.0 |
| **ආයෝජන භාණ්ඩ** | **165.8** | **188.7** | **13.8** | **179.7** | **215.6** | **20.0** | **92.2** | **87.5** | **-5.1** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 164.5 | 190.9 | 16.0 | 167.8 | 206.2 | 22.9 | 98.1 | 92.6 | -5.6 |
| ප්‍රවාහන උපකරණ | 157.1 | 148.5 | -5.5 | 156.5 | 142.0 | -9.2 | 100.4 | 104.6 | 4.2 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 170.3 | 204.9 | 20.3 | 197.3 | 253.9 | 28.7 | 86.3 | 80.7 | -6.5 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 178.4 | 253.9 | 42.3 | 184.6 | 262.0 | 41.9 | 96.7 | 96.9 | 0.3 |
| **මුළු ආනයන** | **141.2** | **144.7** | **2.5** | **148.2** | **159.9** | **7.9** | **95.3** | **90.5** | **-5.1** |
| **වෙළඳ මිල අනුපාතය** | | | | | | | **100.3** (ඇ) | **104.0** | **3.7** |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්: ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ලංකා අයි.ඕ.සී සමාගම
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5


වසරේ පළමු භාගය තුළ ජාත්‍යන්තර වෙළඳපොළෙහි පැවති පහළ මිල ගණන් හේතුවෙන් කෘෂිකාර්මික අපනයනවලට අදාළ මිල දර්ශකය 2016 වසරේ දී සියයට 1.3 කින් අඩු විය. වසරේ පළමු මාස හත තුළ තේ අපනයන මිල ගණන් පහළ මට්ටමක පැවතුණ ද 2016 අගෝස්තු මාසයේ සිට වාර්තා වූ ඉහළ මිල ගණන් හේතුවෙන් තේ සඳහා වූ අපනයන මිල දර්ශකය සියයට 0.2 කින් ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ රබර් සහ පොල් සඳහා වූ අපනයන මිල දර්ශක, පිළිවෙළින්, සියයට 3.3 කින් සහ සියයට 4.8 කින් පහළ ගියේය. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු ආහාර සඳහා වූ අපනයන මිල දර්ශක අඩු වූ අතර එළවළු සඳහා වන අපනයන මිල දර්ශකය ඉහළ ගියේය. බොහෝ උප කාණ්ඩ සඳහා වූ අපනයන මිල දර්ශක සැලකිය යුතු ලෙස අඩු වීමත් සමඟ කාර්මික අපනයන සඳහා වූ මිල දර්ශකය සියයට 1.3 කින් අඩු විය. 2016 වසරේ දී ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් පහළ අගයක පැවතීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ අපනයන මිල දර්ශකය සියයට 13.9 කින් අඩු විය. කෙසේ වුව ද, රෙදිපිළි හා ඇඟලුම්, පිඟන් මැටි නිෂ්පාදිත සහ සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සඳහා වන අපනයන මිල දර්ශක පිළිවෙළින් සියයට 0.8 කින්, සියයට 2.5 කින් සහ සියයට 1.0 කින් ඉහළ ගියේය.

**2016 වසර අග භාගයේ දී ලෝක වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් ක්‍රමයෙන් ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන්ම 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී ඛනිජ තෙල් මිල ගණන් පහළ අගයක පැවතීම හේතුවෙන් ආනයන සඳහා වන සමස්ත මිල දර්ශකය සියයට 5.1 කින් අඩු විය.** කෙසේ වුව ද, 2016 වසරේ දී ලෝක වෙළඳපොළෙහි කපු මිල ගණන් ඉහළ යෑම, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 2.7 කින් ඉහළ යෑම සඳහා තරමක් දුරට හේතු විය. මෙයට සමගාමීව ගෝලීය වෙළඳපොළෙහි රත්‍රන් මිල ගණන්වල ඉහළ යෑමක් පිළිබිඹු කරමින් දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ සඳහා වන ආනයන මිල දර්ශකය ඉහළ ගියේය. අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලු භාණ්ඩවල මිල දර්ශක අඩු විය. ආයෝජන භාණ්ඩ යටතේ වර්ග කර ඇති යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වන මිල දර්ශක අඩු වූ අතර, ප්‍රවාහන උපකරණ සඳහා වන මිල දර්ශකය ඉහළ ගියේය. අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා වූ මිල දර්ශකවලට වෙනස්ව යමින් ආහාර හා පාන වර්ග සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යන දෙකෙහිම මිල ගණන්වල ඉහළ යෑමක් පිළිබිඹු කරමින් පාරිභෝගික භාණ්ඩ සඳහා වන මිල දර්ශකය ඉහළ ගියේය. ආහාර හා පාන වර්ග යටතේ වර්ග කර ඇති සීනි, තෙල් සහ මේදය, පලතුරු සහ මුහුදු ආහාර සඳහා වන ආනයන මිල දර්ශක කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, වසර තුළ දී ධාන්‍ය වර්ග සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත ආනයනය සඳහා වූ මිල දර්ශකය පහළ ගියේය.

### 5.3.5 වෙළඳ දිශාව


**2015 වසරට සාපේක්ෂව 2016 වසර තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත සහ එම ගමනාන්ත සඳහා අපනයනය කරනු ලැබූ ප්‍රධාන අපනයන භාණ්ඩ වර්ග බොහෝ දුරට නොවෙනස්ව පැවති අතර, 2001 වසරේ සිට ප්‍රධාන ආනයන ප්‍රභවය වූ ඉන්දියාව අභිබවා යමින් චීනය ප්‍රධාන ආනයන ප්‍රභවය බවට පත් විය.** ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස අඛණ්ඩව පැවති අතර, 2016 වසරේ එම රටවල් වෙත සිදු කළ අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 37 ක් විය. චීනය මෙන්ම ඉන්දියාව සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 4 ඉක්මවමින් ද ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය

5.6 රූප සටහන
අපනයන වෙළඳ දිශාව



මූලය: ශ්‍රී ලංකා රේගුව

5.7 රූප සටහන
ආනයන වෙළඳ දිශාව



මූලය: ශ්‍රී ලංකා රේගුව

එ.ජ. ඩොලර් බිලියන 3 ඉක්මවමින් ද ඉන්දියාව, චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමස්ත විදේශීය වෙළඳාම සඳහා පිළිවෙළින් සියයට 14.9 කින්, සියයට 14.7 කින් සහ සියයට 11.3 කින් දායක වූ අතර, මෙම රටවල් ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවන් බවට පත් විය. මේ අතර, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව, ජපානය සහ එක්සත් රාජධානිය සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීය. ඉන්දියාව සහ ජපානය සමඟ සිදු කළ ආනයන මෙන්ම අපනයන වෙළඳාම පහළ යෑම හේතුවෙන් 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී එම රටවල් සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය සැලකිය යුතු ලෙස පහළ ගිය අතර චීනය, සිංගප්පූරුව, ජර්මනිය, ඉතාලිය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**මුළු අපනයන ආදායමෙන් සියයට 27.3 ක් වාර්තා කරමින් 2016 වසරේ දී ද ඇමෙරිකා එක්සත් ජනපදය විශාලතම අපනයන ගමනාන්තය ලෙස තවදුරටත් පැවතුණි.** ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ මුළු අපනයනවල වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 2,810 ක් වූ අතර එයින් සියයට 74.9 ක් ඇඟලුම් අපනයන ද, සියයට 8.7 ක් රබර් නිෂ්පාදිත අපනයන ද විය. 2016 වසරේ දී සමස්ත ඇඟලුම් අපනයන ආදායමෙන් සියයට 45.7 ක් වාර්තා කරමින් ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයන ආදායම බොහෝදුරට නොවෙනස්ව පැවතුණි. මුළු අපනයන ආදායමෙන් සියයට 10.1 ක් සහ යුරෝපා සංගමය වෙත සිදු කළ අපනයන ආදායමෙන් තුනෙන් එකක් වාර්තා කරමින් එක්සත් රාජධානිය දෙවැනි විශාලතම අපනයන ගමනාන්තය ලෙස 2016 වසරේ දී ද අඛණ්ඩව පැවතුණි. එක්සත් රාජධානිය වෙතින් ලද මුළු අපනයන ආදායමෙන් පිළිවෙළින් සියයට 79.1 කට සහ සියයට 2.8 කට දායක වෙමින් ඇඟලුම් සහ රබර් නිෂ්පාදිත, 2016 වසරේ දී එක්සත් රාජධානිය වෙත සිදු කළ ප්‍රධාන අපනයන ලෙස පැවතුණි. 2016 වසරේ දී යුරෝපා සංගමය වෙත සිදු කළ මුළු ඇඟලුම් අපනයනවලින් ලැබුණු ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,905 ක් වූ අතර, එය මුළු ඇඟලුම් අපනයන ආදායමෙන් සියයට 41.4 කි. යුරෝපා සංගමයට අයත් රටවල් අතුරෙන් එක්සත් රාජධානිය හැරුණු විට අනෙකුත් ප්‍රධාන අපනයන ගමනාන්ත වූයේ ජර්මනිය, ඉතාලිය, බෙල්ජියම, නෙදර්ලන්තය සහ ප්‍රංශයයි. ජර්මනිය සහ ඉතාලිය සිව්වන සහ පස්වැනි විශාලතම අපනයන ගමනාන්ත වූ අතර ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ සහ කුළුබඩු එම රටවල් වෙත සිදු කළ ප්‍රධාන අපනයන භාණ්ඩ විය. තෙවැනි විශාලතම අපනයන ගමනාන්තය වූ ඉන්දියාව වෙත සිදු කළ අපනයනවලින් ලද ආදායම 2015 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 643 සිට 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 554 දක්වා පහළ ගිය අතර, ඒ සඳහා තේ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, කුළුබඩු, ප්‍රවාහන උපකරණ සහ සත්ත්ව ආහාර අපනයන ආදායම අඩු වීම හේතු විය. 2016 වසරේ දී රුසියාව අභිබවා යමින් ඉරානය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම තේ ගැනුම්කරු බවට පත් විය. වෙනත් ප්‍රධාන තේ ගැනුම්කරුවන් වූයේ ඉරාකය, තුර්කිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයයි. 2016 වසරේ මුළු තේ අපනයන ආදායමෙන් සියයට 45.2 කට මෙම රටවල් දායක විය.

**මුළු ආනයන වියදමෙන් සියයට 21.7 කට දායක වෙමින් 2016 වසරේ දී චීනය, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවය බවට පත් විය.** රෙදිපිළි හා උපාංග, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රවාහන උපකරණ සහ රසායනික නිෂ්පාදිත ආනයන සඳහා වූ වියදම් ඉහළ යෑමත් සමඟ 2016 වසරේ දී චීනයෙන් ආනයනය කළ භාණ්ඩ සඳහා වූ වියදම එ.ජ. ඩොලර් මිලියන 4,215 ක් දක්වා සියයට 13.6 කින් ඉහළ ගියේය. මුළු ආනයන වියදමෙන් සියයට 19.7 ක් පමණක් වාර්තා කරමින් ඉන්දියාව දෙවැනි විශාලතම ආනයන ප්‍රභවය බවට පත් වූ අතර, 2016 වසරේ දී ඉන්දියාවෙන් ආනයනය කළ ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ත්‍රිරෝද රථ සහ මෝටර් රථ වැනි රථවාහන සඳහා වූ වියදම් අඩු වීම හේතුවෙන් ඉන්දියාව වෙතින් සිදු කළ මුළු ආනයන සියයට 10.6 කින් පහළ ගියේය. මුළු ආනයනවලින් සියයට 6.1 ක් වාර්තා කරමින් සිංගප්පූරුව තෙවැනි විශාලතම ආනයන ප්‍රභවය බවට පත් විය. ඛනිජ තෙල් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ දියමන්ති හා අගනා ගල් වර්ග සිංගප්පූරුව වෙතින් ආනයනය කළ ප්‍රධාන භාණ්ඩ විය. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සිව් වැනි විශාලතම ආනයන ප්‍රභවය බවට පත් වූ අතර ඛනිජ තෙල් නිෂ්පාදිත, දියමන්ති හා අගනා ගල් වර්ග සහ මූල ලෝහ එරටින් ගෙන් වූ ප්‍රධාන ආනයන අතර විය. පස්වැනි විශාලතම ආනයන ප්‍රභවය වූ ජපානය වෙතින් වාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය සඳහා දැරූ වියදම ඉහළ ගිය ද, රථ වාහන ආනයනය පහළ යෑම හේතුවෙන් ජපානයෙන් කළ ආනයන සඳහා වූ මුළු වියදම සියයට 31.6 කින් පහළ ගියේය.

## 5.4 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

### 5.4.1 සේවා වෙළඳාම

**වසර තුළ දී විදේශීය ජංගම ගිණුම ශක්තිමත් කිරීමට දායක වෙමින්, 2016 වසරේ දී ශ්‍රී ලංකාවේ සේවා අපනයන සතුටුදායක වර්ධනයක් වාර්තා කළේය.** සේවා අපනයන ඉපැයීම් 2015 වසරේ දී වාර්තා වූ

5

එ.ජ. ඩොලර් මිලියන 6,397 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,138 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය විය. සංචාරක ඉපැයීම්, සේවා වෙළඳාමෙහි වර්ධනයට මූලික වශයෙන් දායකත්වය සැපයූ අතර, ප්‍රවාහන සහ විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා අපනයන අංශයන් ද එම වර්ධනය සඳහා දායක විය. මේ අතර, විශේෂයෙන් සංචාරක අංශය ඇතුළු සේවා ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී සේවා ගිණුමෙහි ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 4,259 ක් දක්වා සියයට 4.6 කින් ඉහළ ගියේය. සමස්තයක් වශයෙන්, සේවා ගිණුමෙහි අතිරික්තය එ.ජ. ඩොලර් මිලියන 2,879 ක් වූ අතර, එය 2015 වසර හා සැසඳීමේ දී සියයට 23.8 ක වර්ධනයකි.

### ප්‍රවාහන සේවා

**ප්‍රවාහන සේවා අංශයෙහි වර්ධනය, 2016 වසරේ දී සේවා ගිණුම කෙරෙහි හිතකර ලෙස බලපෑවේය.** මගී ගාස්තු, නැව් කුලී, වරාය හා ගුවන්තොටුපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් සමන්විත ප්‍රවාහන සේවා වෙත වූ දළ ලැබීම් වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 2,250 ක් දක්වා සියයට 6.9 කින් වර්ධනය විය. මේ අතර, ආනයන ක්‍රියාකාරකම් පුළුල් වීම සහ විදේශ සංචාරයන්හි නිරත වන ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව ඉහළ යෑම සමඟ වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත සේවා ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන සේවා මත වූ ගෙවීම් 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,618 ක් දක්වා සියයට 2.5 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රවාහන අංශය මත වූ ශුද්ධ ලැබීම් 2015 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 526 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 632 ක් දක්වා වර්ධනය විය.

**2016 වසරේ දී මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් පෙර වසරට සාපේක්ෂව සියයට 7.6 ක වර්ධනයක් සමඟ, එ.ජ. ඩොලර් මිලියන 1,073 ක් දක්වා ඉහළ ගියේය.** ශ්‍රී ලංකාවට පැමිණි මගීන් සංඛ්‍යාව ඉහළ යෑම, මගී ගාස්තු මත වූ ලැබීම් ඉහළ යෑම සඳහා මූලිකවම හේතු විය. 2016 වසර තුළ දී, ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් සේවා සපයනු ලබන ගුවන් ගමනාන්ත සංඛ්‍යාව පුළුල් කරන ලදී. මෙම ගුවන් ගමනාන්ත අතරට මැද පෙරදිග, ඈත පෙරදිග සහ ආසියානු රටවල් කිහිපයක් ද ඇතුළත් විය. මෙම වසර තුළ මගී ගාස්තු ආශ්‍රිත ඉපැයීම් වර්ධනය වීම සඳහා මෙලෙස ගුවන් ගමනාන්ත සංඛ්‍යාව පුළුල් කිරීම ද දායක විය. මේ අතර, 2016 වසරේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් මිහින් ලංකා ගුවන් සමාගමෙහි මෙහෙයුම් කටයුතු අත්පත් කරගත් අතර, ඒ අනුව, කෙටි දුර ගුවන් මාර්ග නවයක් සහ ගුවන් යානා තුනක් සිය සමාගමට

**5.6 සංඛ්‍යා සටහන**

**ජංගම සහ ප්‍රාග්ධන ගිණුම**

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2015 (අ) | | | 2016 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **16,943** | **23,006** | **-6,063** | **17,448** | **23,659** | **-6,211** |
| **භාණ්ඩ** | **10,546** | **18,935** | **-8,388** | **10,310** | **19,400** | **-9,090** |
| වෙළඳ භාණ්ඩ | 10,546 | 18,892 | -8,346 | 10,310 | 19,026 | -8,716 |
| මූල්‍ය නොවන රත්‍රන් | - | 42 | -42 | - | 374 | -374 |
| **සේවා** | **6,397** | **4,072** | **2,325** | **7,138** | **4,259** | **2,879** |
| ප්‍රවාහන | 2,105 | 1,579 | 526 | 2,250 | 1,618 | 632 |
| මුහුදු ප්‍රවාහන | 997 | 762 | 234 | 1,059 | 779 | 281 |
| නැව් කුලී | 997 | 762 | 234 | 1,059 | 779 | 281 |
| ගුවන් ප්‍රවාහන | 1,108 | 816 | 292 | 1,191 | 840 | 351 |
| මගී ගාස්තු | 997 | 732 | 266 | 1,073 | 753 | 320 |
| ගුවන් කුලී | 111 | 85 | 26 | 118 | 87 | 31 |
| සංචාරක (ඇ) | 2,981 | 1,420 | 1,561 | 3,518 | 1,542 | 1,977 |
| ඉදිකිරීම් | 60 | 30 | 30 | 63 | 29 | 34 |
| රක්ෂණ සහ විශ්‍රාම වැටුප් | 119 | 92 | 27 | 121 | 89 | 32 |
| මූල්‍ය සේවා | 254 | 380 | -126 | 252 | 403 | -151 |
| විදුලි සන්දේශ සහ පරිගණක සේවා | 805 | 429 | 375 | 858 | 443 | 416 |
| විදුලි සන්දේශ | 128 | 102 | 26 | 134 | 105 | 29 |
| පරිගණක සේවා | 677 | 327 | 349 | 724 | 337 | 387 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 42 | 63 | -21 | 42 | 67 | -25 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 31 | 79 | -48 | 33 | 68 | -35 |
| **ප්‍රාථමික ආදායම්** | **127** | **2,140** | **-2,013** | **120** | **2,304** | **-2,184** |
| සේවක වැටුප් | 19 | 83 | -63 | 16 | 67 | -51 |
| ආයෝජන ආදායම් | 108 | 2,058 | -1,950 | 105 | 2,238 | -2,133 |
| සෘජු ආයෝජන | 17 | 787 | -771 | 12 | 953 | -941 |
| ලාභාංශ | 17 | 435 | -419 | 12 | 504 | -491 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | - | 352 | -352 | - | 450 | -450 |
| විවිධ ආයෝජන | - | 844 | -844 | - | 831 | -831 |
| හිමිකම් | - | 80 | -80 | - | 75 | -75 |
| පොලී ආදායම් | - | 764 | -764 | - | 756 | -756 |
| කෙටි කාලීන | - | 27 | -27 | - | 1 | -1 |
| දිගු කාලීන | - | 737 | -737 | - | 755 | -755 |
| අනෙකුත් ආයෝජන | 25 | 426 | -401 | 45 | 453 | -408 |
| සංචිත වත්කම් | 66 | - | 66 | 47 | - | 47 |
| **ද්විතීයික ආදායම්** | **7,007** | **814** | **6,193** | **7,260** | **807** | **6,453** |
| රජය | 27 | - | 27 | 19 | - | 19 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 6,980 | 814 | 6,167 | 7,242 | 807 | 6,434 |
| **ජංගම ගිණුම** | **24,078** | **25,960** | **-1,883** | **24,829** | **26,771** | **-1,942** |
| **ප්‍රාග්ධන ගිණුම** | **71** | **24** | **46** | **46** | **21** | **26** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 71 | 24 | 46 | 46 | 21 | 26 |
| රජය | 50 | - | 50 | 35 | - | 35 |
| සංස්ථා සහ කුටුම්බ | 21 | 24 | -3 | 11 | 21 | -10 |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **24,148** | **25,985** | **-1,836** | **24,875** | **26,792** | **-1,917** |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5

පවරා ගන්නා ලදී. කෙසේ වෙතත්, ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් ගුවන් ගමනාන්ත කිහිපයක් වෙත වූ ගුවන් ගමන් වාර නවතා දැමීම සහ 2016 වසර තුළ දී ගුවන් ගාස්තු පහළ දැමීම හේතුවෙන් මගී ගාස්තු මත වූ ආදායමෙහි වර්ධනය සීමා විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ධාවන පථය නැවත ඇතිරීමේ කටයුතු තුළින් ධාවන පථයේ ධාරිතාව වැඩි වනු ඇති අතර, එමගින්, මෙම අංශයෙහි දිගුකාලීන වර්ධන ශක්‍යතාව ළඟා කර ගැනීමට පිටිවහලක් ලැබෙනු ඇත.


**වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත කටයුතු පුළුල් වීම සමඟ නැව් කුලී සහ ගුවන් කුලී මගින් වූ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ලැබීම් 2016 වසරේ දී වර්ධනය විය.** ප්‍රධාන වශයෙන් කොළඹ වරායෙහි භාණ්ඩ, බහලුම් සහ ප්‍රතිනැව්ගත කිරීම් හැසිරවීම්වල පරිමාව ඉහළ යෑම, 2016 වසරේ දී මෙම සේවාවලින් වූ දළ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 1,177 ක් දක්වා සියයට 6.3 කින් ඉහළ යෑමට හේතු විය. කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තයෙහි පූර්ණ ධාරිතාවයෙන් මෙහෙයුම් කටයුතු ආරම්භ කර ගත වූ දෙවන වසරේ දී බහලු ඒකක මිලියන 2 හි කඩඉම පසු කිරීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, ශ්‍රී ලංකාවේ නාවික අංශයේ ශක්‍යතාවය ජාත්‍යන්තර වශයෙන් ඇගයීමට ලක් කරමින්, සිංගප්පූරුවේ ගෝලීය වරාය සංසදය (Global Ports Forum) විසින් 2017 වසරේ පෙබරවාරි මාසය තුළ දී දකුණු ආසියාවේ හොඳම පර්යන්තය ලෙස දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය සම්මානයට පාත්‍ර කරනු ලැබීය.

### විදේශ ගමන් සහ සංචාරක සේවා

**ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයක් වන සංචාරක කර්මාන්තය, 2016 වසර තුළ දී අඛණ්ඩව වර්ධනය විය.** ඉතිහාසයේ පළමු වරට මිලියන දෙකෙහි සන්ධිස්ථානය පසු කරමින් 2016 වසරේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 2,050,832 ක් දක්වා සියයට 14.0 ක කැපී පෙනෙන වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සහ ඒ සඳහා කළ ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ යෑම, නව ගුවන් සේවා හා මගී නෞකා සේවා ක්‍රියාත්මක වීමත් සමඟ සම්බන්ධතා වැඩිදියුණු වීම සහ විවිධ රටවලට අනන්‍ය වූ ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම, මෙම ආකර්ෂණීය වර්ධනය සඳහා දායක විය. ලෝකයේ ප්‍රධාන සංචාරක ගමනාන්තවල භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් වර්ධනය වීම ද ශ්‍රී ලංකාවට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා උපකාරී විය.

**5.8 රූප සටහන**

**රටවල් අනුව සංචාරක පැමිණීම් - 2016**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**2016 වසරේ දී, අප්‍රිකාව හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලකින් ම වූ සංචාරක පැමිණීම් වර්ධනය විය.** බටහිර යුරෝපය සංචාරක පැමිණීම්වලින් සියයට 31.4 ක් නියෝජනය කරමින් සංචාරක කලාප අතුරින් තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක ප්‍රභවය ලෙස පැවති අතර, මෙම කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 643,333 ක් දක්වා සියයට 16.5 කින් වර්ධනය විය. මුළු සංචාරක පැමිණීම්වලින් නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයින්ගේ ප්‍රතිශතය 2010 වසරේ සිට අඛණ්ඩව වර්ධනය වෙමින් 2010 වසරේ දී වාර්තා වූ සියයට 10.5 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 20.7 ක් දක්වා ඉහළ ගිය අතර, චීනයෙන් වූ සංචාරක පැමිණීම්හි අති විශාල වර්ධනය මේ සඳහා හේතු විය. 2016 වසරේ දී සංචාරක පැමිණීම් 356,729 ක් වාර්තා කරමින් ඉන්දියාව සංචාරකයින් පැමිණෙන රටවල් අතර ප්‍රථම ස්ථානයෙහි ද දෙවනුව චීනය ද අනතුරුව පිළිවෙළින් එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය ද විශාලතම සංචාරක ප්‍රභවයන් ලෙස පැවතුණි. 2016 වසරේ දී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින්ගෙන් සියයට 51.0 ක් ම මෙම රටවල් පහෙන් පැමිණ තිබුණු අතර, එමගින් සංචාරක වෙළඳපොළ කේන්ද්‍රගත වීම පිළිබිඹු විය. චීනයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 271,577 ක් ලෙස වාර්තා කරමින් ශ්‍රී ලංකාවේ සංචාරක පැමිණීම්හි


5

වර්ධනය සඳහා ඉහළම දායකත්වය චීනයෙන් ලබාදුන් අතර, ඉන්දියාව සහ එක්සත් රාජධානිය ඊට අනතුරුව ඉහළම දායකත්වයන් ලබාදුණි. සංචාරකයින් පැමිණීමේ අරමුණ සැලකීමේ දී බහුතරයක් (සියයට 83.4 ක්) විවේකය ගත කිරීම සඳහා මෙරටට පැමිණ ඇත. 2016 වසරේදී ව්‍යාපාර කටයුතු සඳහා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සියයට 1.8 ක් වූ අතර, ඥාති මිත්‍රාදීන් මුණ ගැසීම, ආගමික හා සංස්කෘතික කටයුතු, රාජකාරී, රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන (MICE), සෞඛ්‍ය, අධ්‍යාපනය හා ක්‍රීඩා කටයුතු වැනි අනෙකුත් අරමුණු සඳහා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරක පැමිණීම්වලින් ප්‍රතිශතයක් ලෙස සියයට 14.8 ක් විය.

**2016 වසරේ දී සංචාරක ඉපැයීම් අඛණ්ඩව වර්ධනය වූ අතර, එමගින් සේවා ගිණුම ශක්තිමත් විය.** සංචාරක පැමිණීම් ඉහළ යෑම සහ සංචාරකයෙකු මෙරට ගත කරන කාලය හා සිදුකරන වියදම් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් සංචාරක ඉපැයීම් 2015 වසරේ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 2,981 ට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,518 ක් දක්වා සියයට 18.0 කින් වර්ධනය විය. සංචාරකයින්ගේ වියදම් සහ සංචාරකයෙකු මෙරට ගත කරන කාලය පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද නවතම වාර්ෂික සමීක්ෂණයට අනුව, සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 164.1 සිට 2016 වසරේ දී එ.ජ. ඩොලර් 168.2 ක් දක්වා ඉහළ ගොස් ඇත. තවද, 2016 වසරේ දී සංචාරකයෙකු මෙරට ගත කළ සාමාන්‍ය කාලය දින 10.2 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2015 වසරේ දී වාර්තා වූ දින 10.1 ට සාපේක්ෂව සුළු වර්ධනයකි. සංචාරක ප්‍රවර්ධන කටයුතු පුළුල් වීම සහ යුධ ගැටුම් නිමා වීමෙන් පසු හෝටල් හා ඒ ආශ්‍රිත

**5.9 රූප සටහන**

**සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය වීම සංචාරක ඉපැයීම්වල හිතකර වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. ක්‍රමෝපායික අලෙවිකරණ වැඩසටහන් සහ රටේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම ඔස්සේ ශ්‍රී ලංකාවේ සන්නාම වටිනාකම ඉහළ නැංවීම සඳහා ගනු ලැබූ ප්‍රයත්නයන් සමග සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වයෙහි දක්නට ලැබෙන වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව ඉදිරි වසරවලදීත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. මේ අතර, 2016 වසරේ දී සංචාරක සේවා සඳහා වූ ගෙවීම් ද එ.ජ. ඩොලර් මිලියන 1,542 ක් දක්වා සියයට 8.6 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙම වර්ධනය ද සමග විදේශ ගමන් සහ සංචාරක සේවා උප අංශයෙහි එ.ජ. ඩොලර් මිලියන 1,977 ක අතිරික්තයක් වාර්තා විය.

**2016 වසරේ දී සංචාරක අංශයේ ආයෝජන තවදුරටත් පුළුල් විය.** 2015 වසරේ දී අනුමත වූ හෝටල් ව්‍යාපෘති 37 සමග සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 126 ක ආයෝජනයක් සහිත කාමර 1,526 කින් සමන්විත නව හෝටල් ව්‍යාපෘති 41 ක් සඳහා අනුමැතිය ලැබී ඇත. වසර තුළ දී සංචාරක ක්ෂේත්‍රයට කාමර 1,569 ක් එකතු කරමින් ෂැන්ග්‍රිලා, ආර් අයි යූ සහ බෙස්ට් වෙස්ටර්න් ඇතුළු ජාත්‍යන්තර හෝටල් කිහිපයක් සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කළ අතර, හයට්, ෂෙරටන්, අයි ටී සී සහ නෙක්ස්ට් වැනි ප්‍රධාන හෝටල් ව්‍යාපෘති කිහිපයක් සිය ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කළේය. තවද, 2016 වසරේ දී අති සුඛෝපභෝගී බංගලා, නිවාඩු නිකේතන, සංචාරක සත්කාර නිවාස, පෞරාණික නිවාස, බංගලා සහ කුලියට ගත් මහල් නිවාස ආදී වූ සංචාරක ක්ෂේත්‍රයේ අතිරේක ආයතන සංඛ්‍යාව 1,558 ක් දක්වා ආයතන 149 කින් ඉහළ ගිය අතර, කාමර ධාරිතාව 11,535 ක් දක්වා කාමර 833 කින් වර්ධනය විය. 2020 වන විට සංචාරක පැමිණීම් මිලියන 4.5 ක අවශ්‍යතා සපුරාලීම සඳහා කාමර 75,000 ක් ඉදි කිරීමේ රජයේ ඉලක්කය ළඟා කර ගැනීමට මෙම නව හෝටල් ව්‍යාපෘති උපකාරී වනු ඇත.

**රටෙහි නැගෙනහිර සහ උතුරු පළාත්වල සංචාරක කර්මාන්තයේ ඉහළ විභවතාවන් උකහා ගැනීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ අවධානය යොමු වීමත් සමග එම පළාත්වල සංචාරක කර්මාන්තය අඛණ්ඩව වර්ධනය විය.** මෙම වර්ධනය පිළිබිඹු කරමින්, ගැටුම්කාරී තත්ත්වයන් නිමා වීමෙන් අනතුරුව නැගෙනහිර හා උතුරු පළාත්වල විශේෂයෙන්ම පාසිකුඩා, නිලාවේලි සහ යාපනයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත නව ව්‍යාපෘති රැසක් නිම කර ඇත. මීට අමතරව, උතුර සහ නැගෙනහිරට

5

**5.7 සංඛ්‍යා සටහන**
**සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 (අ) | වාර්ෂික වෙනස්වීම (%) 2016 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (සංඛ්‍යාව) | 1,005,605 | 1,274,593 | 1,527,153 | 1,798,380 | 2,050,832 | 14.0 |
| පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන | | | | | | |
| විනෝදාස්වාදය | 748,436 | 915,208 | 1,037,644 | 1,198,240 | 1,710,027 | 42.7 |
| ව්‍යාපාර | 90,040 | 67,946 | 20,270 | 23,323 | 37,121 | 59.2 |
| වෙනත් | 167,129 | 291,439 | 469,239 | 576,817 | 303,684 | -47.4 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්) | 10,056 | 10,909 | 15,119 | 18,163 | 20,918 | 15.2 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 71.2 | 71.7 | 74.3 | 74.5 | 74.8 | 0.4 |
| දළ සංචාරක ලැබීම් (රු. මිලියන) | 132,427 | 221,720 | 317,479 | 405,492 | 512,373 | 26.4 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 131,688 | 173,954 | 207,889 | 225,476 | 249,837 | 10.8 |
| මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ආ) | 162,869 | 270,150 | 299,890 | 319,436 | 335,659 | 5.1 |
| සෘජු සේවා නියුක්තිය | 67,862 | 112,550 | 129,790 | 135,930 | 146,115 | 7.5 |
| වක්‍ර සේවා නියුක්තිය | 95,007 | 157,600 | 170,100 | 183,506 | 189,544 | 3.3 |

(අ) තාවකාලික
(ආ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

අයත් යාපනයේ සහ මන්නාරම අවට පිහිටි දූපත්වල සහ මුලතිව් හා කුච්චවේලි ප්‍රදේශවල නව සංචාරක ව්‍යාපෘති පිහිටුවීමට යෝජනා ඉදිරිපත් කර ඇත. තවද, කල්පිටියේ ඒකාබද්ධ සංචාරක නිකේතන ව්‍යාපෘති වැඩිදියුණු කිරීම, දේද්දුවේ සංචාරක නිකේතනයක් සහ විනෝදාස්වාදය සපයන ස්ථානයක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් යෝජනා ඉදිරිපත් කර ඇත.

**ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්න රැසක් ගෙන ඇත.** 1968 සහ 1999 වසරවල දී නිර්මාණය කළ පෙර වර්ගීකරණය වෙනුවට 2016 අප්‍රේල් මාසයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක හෝටල් සඳහා නව වර්ගීකරණයක් හඳුන්වා දෙන ලදී. නව වර්ගීකරණ අවශ්‍යතාවය යටතේ, ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන අධිකාරිය සමඟ ලියාපදිංචි වී ඇති සියලුම සංචාරක හෝටල් විසින් තරු වර්ගීකරණයක් ලබා ගත යුතු අතර, එය සෑම අවුරුදු තුනකට වරක් ම නැවත වර්ගීකරණය කළ යුතු ය. තවද, 2016 වසරේ අයවැය අනුව, සංචාරක සේවාව නියාමනය කිරීම සහ එහි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් සංචාරක කර්මාන්තයේ අවිධිමත් අංශය, විධිමත් අංශය තුළට අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා වැඩසටහනක් ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක සේවා හා හෝටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය අන්තර්ගත වන "ශ්‍රී ලංකා සංචාරක සේවාව" 2016 වසරේ මැයි මාසයේ දී සිය ස්වර්ණ ජයන්තිය සැමරූ අතර, මෙම අවස්ථාවට සමගාමීව වැඩසටහන් රාශියක් සංවිධානය කළේය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, අනෙකුත් සංචාරක ක්ෂේත්‍රයට අදාළ ආයතන සමඟ එක්ව නිවාඩුව ගත කිරීම සඳහා මෙරටට වැඩිම පිරිසක් පැමිණෙන 2016 දෙසැම්බර් මාසයේ දී ඔවුන්ට විනෝදය සැපයීම සඳහා සංස්කෘතික සංදර්ශන, කාලීන විශේෂාංග, ආහාර ප්‍රවර්ධන වැඩසටහන්, ප්‍රදර්ශන සහ විනෝද ක්‍රීඩා ඇතුළත් වූ සැණකෙළියක් සංවිධානය කළේය. සංචාරක කර්මාන්තයේ වර්ධන විභවතාවයන් හඳුනා ගෙන, 2017 වසර සඳහා වූ අයවැය මගින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනයක් අරමුණු කොටගෙන, ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තයේ ගුණාත්මකභාවය සහ සංචාරක ආකර්ෂණය වැඩිදියුණු කිරීමට රැස්වීම්, දිරිගැන්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන යන සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක් ගොඩනැගීමට සහ සංචාරක සංවිධාන සඳහා මූල්‍යමය සහාය යෝජනා ක්‍රමයක් ඇති කිරීමට යෝජනා කිහිපයක් හඳුන්වා දී ඇත.

**ලෝකයේ ප්‍රධානතම සහ වඩාත්ම ආකර්ෂණීය සංචාරක ගමනාන්තවලින් එකක් ලෙස ශ්‍රී ලංකාවට නමක් දිනා ගැනීමට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් ආරම්භ කළ ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් උපකාරී විය.** සංචාරක ප්‍රවර්ධනයේ වැදගත්කම හඳුනා ගනිමින්, 2016 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් රටට ආවේණික වූ ක්‍රමෝපායික අලෙවිකරණ සැලැස්ම අඛණ්ඩව සිදු කළ අතර, ප්‍රධාන වෙළඳපොළවල සංචාරක සල්පිල් සඳහා සහභාගි වීම, වෙළඳ සමුළු සහ ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් සිදු කළේය. එක්සත් රාජධානියේ උමං දුම්රිය පද්ධතිය තුළ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම වැනි ගෝලීය එළිමහන් ප්‍රවර්ධන කටයුතු ද නැෂනල් ජියෝග්‍රැෆික් (National Geographic) හා බීබීසී

5

වයිල්ඩ් ලයිෆ් (BBC Wild Life) වැනි පිළිගත් රූපවාහිනී වැඩසටහන් හරහා ප්‍රචාරණය කිරීම ද මෙයට ඇතුළත් වේ. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2016 වසරේ දී විශේෂයෙන්ම ඉහළ පෙළේ සංචාරකයින් ඉලක්ක කර ගනිමින් සංචාරක බ්ලොග් සටහන්කරුවන්ගේ වැඩසටහන්, මංගත ප්‍රචාරණ වැඩසටහන්, වෙබ් දැන්වීම්, ඉලක්කගත විද්‍යුත් තැපැල් හා සමාජ මාධ්‍ය ජාල වැඩසටහන් යනාදිය හරහා ඩිජිටල් ප්‍රචාරණය සිදු කරමින් අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රවර්ධන කටයුතු ඉහළ නැංවීය. ප්‍රධාන පෙළේ ස්වාධීන ව්‍යාපාර තක්සේරු සමාගමක් වන බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් ආයතනය විසින් ගණනය කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික සන්නාම වටිනාකම එ.ජ. ඩොලර් බිලියන 74 ක් දක්වා ඉහළ නංවමින් රටෙහි ශ්‍රේණිගත කිරීම 2015 වසරේ දී වූ 57 වන ස්ථානයේ සිට 2016 වසරේ දී 55 වන ස්ථානය දක්වා ගෙන ඒමට මෙම ප්‍රවර්ධන වැඩසටහන් උපකාරී විය. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් සිදු කළ ඵලදායී සහ අඛණ්ඩ ප්‍රවර්ධන කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස, සංචාරක කටයුතු හා සම්බන්ධ බොහෝ ආයතන විසින් 2016 හා 2017 වසරේ දී සංචාරය කිරීමට හොඳම ගමනාන්ත අතරට ශ්‍රී ලංකාව නම් කර ඇත.

**පසුගිය වසර කිහිපය තුළ සිදු කරන ලද ප්‍රබල ප්‍රවර්ධන වැඩසටහන් සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ගන්නා ලද පියවර මෙරටට විදේශ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වුව ද, ශ්‍රී ලංකාව තවමත් ගෝලීය වෙළඳපොළ තුළ තම පූර්ණ විභවතාව ළඟා කර ගෙන නොමැත.** 2016 වසර තුළ දී ශ්‍රී ලංකාව මිලියන 2 ක සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කරගත් අතර, සිංගප්පූරුව, තායිවානය සහ හොංකොං වැනි අග්නිදිග ආසියානු කලාපයේ රටවල් වෙත වසරකට මිලියන 10 කට වඩා වැඩි සංචාරක පැමිණීම් වාර්තා කර ඇත. ශ්‍රී ලංකාව දැනටමත් ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ උසස් තත්ත්වයේ පෞද්ගලික සෞඛ්‍ය පහසුකම් සැපයීම අතින් තරගකාරී මට්ටමක සිටින බැවින් වෛද්‍ය සංචාරක ව්‍යාපාරය සහ පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය වැනි අංශ තුළින් සිය විභවතාව වැඩිදියුණු කර ගැනීමට හැකියාව ඇත. සංචාරක කර්මාන්තයේ වර්ධන ප්‍රවණතාවට ශ්‍රම හිඟය මගින් නුදුරු අනාගතයේ බාධා එල්ල විය හැකි බැවින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයක් ලෙස සත්කාරක සේවා කර්මාන්තය සඳහා ශ්‍රමිකයින් පුහුණු කිරීමට නිසි යාන්ත්‍රණයක් නිර්මාණය කළ යුතුය. සත්කාරක කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා සීමාවාසික වැඩසටහන් සමඟ බද්ධ කරමින් ප්‍රාදේශීය මට්ටමින් ප්‍රවර්ධනය කළ යුතුය. තවද, කාමර ධාරිතාව වැඩිදියුණු කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග ද අඛණ්ඩව සිදු කළ යුතුය. අඩු වියදම් දැරීමට කැමති සංචාරකයින් අතර සංචාරක සත්කාර නිවාස ප්‍රචලිත වෙමින් පැවතීම හේතුවෙන් රටෙහි දිගු කාලීන තරගකාරිත්වය පවත්වා ගැනීමට උසස් ප්‍රමිතීන් අවශ්‍ය වන බැවින් අවිධිමත් අංශයේ නවාතැන් පහසුකම් ප්‍රමිතිකරණය කිරීම ඉතා වැදගත් වේ. මේ අතරම, ශ්‍රී ලංකාවේ පවතින සංචාරක ක්‍රියාකාරකම් විවිධාංගීකරණය කිරීමට ප්‍රතිපත්තිමය මූලාරම්භයක් අවශ්‍ය වන අතර, දැනට නොවෙනස්ව පවතින්නා වූ සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය රාත්‍රී ගණන වර්ධනය කර ගැනීමට විනෝදාස්වාදය සඳහා වන සංචාරක සේවා හා විනෝද ක්‍රීඩා සඳහා වන සංචාරක සේවා වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී ක්ෂේත්‍ර කෙරෙහි වඩා වැඩි අවධානයක් යොමු කළ යුතුය.

## විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා

**2016 වසරේ දී විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා අපනයන ඉපැයීම්වල වර්ධනයක් වාර්තා විය.** 2016 වසරේ දී විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා මත වූ දළ ලැබීම්, 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 805 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 858 ක් දක්වා සියයට 6.6 කින් වර්ධනය විය. වසර තුළ දී විදුලි සන්දේශ උප අංශයෙහි මුළු ඉපැයීම් ප්‍රමාණය 2015 වසරේ එ.ජ. ඩොලර් මිලියන 128 සිට 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 134 ක් දක්වා මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. අන්තර්ජාලය මත පදනම් වූ සන්නිවේදන සේවාවන් භාවිතය ඉහළ යෑම මෙම අංශයෙහි ඉපැයීම් ඉහළ යෑම සඳහා හේතු වූ නමුත්, ජාත්‍යන්තර සෘජු දුරකථන ඇමතුම් සේවාවන් භාවිතය අඩු වීම මෙම අංශයෙහි වර්ධනය සීමා කළේය. විදුලි සන්දේශ කර්මාන්තයෙහි ඩිජිටල්කරණය වැනි අංශවල අඛණ්ඩ තාක්ෂණික නවෝත්පාදන හේතුවෙන් 2016 වසරේ දී අධිවේගී අන්තර්ජාල පහසුකම් භාවිතය සහ චන්ද්‍රිකා සහ රැහැන් සහිත රූපවාහිනී පහසුකම් භාවිතය වැඩිදියුණු වූ අතර, එය මෙම අංශයෙහි ආදායම් උත්පාදනය ඉහළ නැංවීමට දායක විය. 2016 වසරේ දී විදුලි සන්දේශ අංශයෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් අග්නිදිග ආසියානු-මැදපෙරදිග-බටහිර යුරෝපා 5 (SEA-ME-WE 5) කේබල් පද්ධති මධ්‍යස්ථානය මාතර දී විවෘත විය[2]. මෙම ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලංකාවේ ගෝලීය සම්බන්ධතා පිළිබඳ විශ්වසනීයත්වය ඉහළ නැංවෙන අතර, එමගින් විදුලි සන්දේශ කර්මාන්තයෙහි මැදි හා දිගු කාලීන ක්‍රියාකාරිත්වය වැඩිදියුණු වනු ඇත.

**මේ අතර, 2016 වසරේ දී පරිගණක සහ තොරතුරු සේවා උප අංශයෙහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.** පරිගණක සහ තොරතුරු සේවාවල ඉපැයීම්

2 SEA - ME - WE 5 යනු, මහාද්වීප තුනක් පුරා රටවල් දහසයක් සම්බන්ධ කෙරෙන අති නවීන මුහුද යටින් දිවෙන රැහැන් පද්ධතියකි.

5

2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 724 ක් දක්වා සියයට 7.0 කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කර ගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) ඇතුළත් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවල (ITES) ශීඝ්‍ර වර්ධනයයි. ලෝක ආර්ථික සංසදය (World Economic Forum) විසින් ප්‍රකාශයට පත් කරනු ලබන, ආර්ථිකයන් විසින් තරගකාරිත්වය සහ සුභසාධනය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයන් විසින් ලබා දෙන අවස්ථාවන් ප්‍රයෝජනයට ගන්නා ආකාරය මනිනු ලබන දර්ශකයක් වන "Networked Readiness Index" නැමැති දර්ශකය අනුව, ශ්‍රී ලංකාව 2016 වසරේ දී රටවල් එකසිය තිස් නවයක් අතරින් හැට තුන් වන ස්ථානය හිමි කර ගෙන ඇත. මෙම අංශයෙහි වර්ධන ශක්‍යතාවය හඳුනා ගනිමින් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවලට අවශ්‍ය මූලිකාංගවලට අනුකූල වන ලෙස 2017 අයවැයෙන් යෝජනා කර ඇති පරිදි, නම්‍යශීලී සේවා කාලයන්, කොන්ත්‍රාත් පදනම මත වූ සේවා නියුක්ති අවස්ථාවන් සහ කාර්යසාධනය මත පදනම් වූ වේතන යනාදියට අදාළ කම්කරු නීති සංශෝධනය කිරීමට රජය බලාපොරොත්තු වේ. එමෙන්ම, ඉහළ නිපුණත්වයකින් යුතු ශ්‍රම බලකායක් ඇති කිරීම, පුළුල් වූ නියාමන රාමුවක් සැකසීම සහ නවීන යටිතල පහසුකම් ඇති කිරීම, මෙම අංශයෙහි පූර්ණ ශක්‍යතාවය ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

### 5.4.2 ප්‍රාථමික ආදායම

**2016 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් විය.** සංචිත වත්කම් ආයෝජනය තුළින් ලද ඉපැයීම් පහළ යෑම සමඟ පොලී ගෙවීම් සහ ප්‍රතිආයෝජන ඉපැයීම් හා ලාභාංශ ලෙස වූ ගෙවීම් ඉහළ යෑම ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් වීම සඳහා මූලික වශයෙන් හේතු විය. ඒ අනුව, 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,013 ක් වූ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2016 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 2,184 ක් දක්වා සියයට 8.5 කින් වර්ධනය විය. 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 127 ක් වූ ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම්, 2016 වර්ෂය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 120 ක් දක්වා පහළ ගියේය. වසර තුළ දී දළ නිල සංචිතවල පහළ යෑමත් සමඟ සංචිත වත්කම් ආයෝජනය තුළින් ලද ඉපැයීම් පහළ යෑම ප්‍රාථමික ආදායම් ගිණුමේ ලැබීම් අඩු වීමට හේතු විය. මේ අතර, 2015 දී එ.ජ. ඩොලර් මිලියන 2,140 ක් වූ ප්‍රාථමික ආදායම් ගිණුමේ මුළු ගෙවීම් 2016 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 2,304 ක් විය. පෙර වසර හා සැසඳීමේ දී 2016 වසර තුළ දී විදේශීය ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාර මත ඉපැයූ ලාභය මගින් ලාභාංශ ලෙස තම රට වෙත ප්‍රේෂණය කරන ලද සහ ප්‍රතිආයෝජනය කරන ලද ප්‍රමාණයන්හි සැලකිය යුතු ඉහළ යෑමක් දැකිය හැකි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 787 ක අගයක පැවති සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ ගෙවීම් සහ ප්‍රතිආයෝජන ඉපැයීම්, 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 953 ක් දක්වා වැඩි විය. මේ අතර, විදේශීය ආයෝජකයින් සතු නොපියවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය අඩු වූ බැවින් 2016 වසර තුළ දී විවිධ ආයෝජන මත වූ පොලී ගෙවීම් පහත වැටුණි. මේ අනුව, විවිධ ආයෝජන මත වූ පොලී ගෙවීම් 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 764 ක සිට 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 756 ක් දක්වා පහළ ගියේය. කෙසේ නමුත්, නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව හේතුවෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත වූ පොලී ගෙවීම් අඛණ්ඩව වර්ධනය විය. තවද, 2016 වසරේ දී, විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම්වලින් සමන්විත ප්‍රාථමික ගිණුමේ අනෙකුත් ආයෝජන ගෙවීම් සුළු වශයෙන් වර්ධනය විය. රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශ ණය වගකීම් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, එම ආයතන විසින් ලබා ගත් ණය සඳහා පොලී ගෙවීම් ක්‍රමයෙන් ඉහළ යෑම විදේශ ණය සඳහා වූ පොලී ගෙවීම් ඉහළ යෑම සඳහා හේතු විය. කෙසේ වෙතත්, රජයේ ව්‍යාපෘති ණය සඳහා වූ පොලී ගෙවීම් ආසන්න වශයෙන් පෙර වසරේ වාර්තා වූ මට්ටමේ ම නොවෙනස්ව පැවතුණි.

### 5.4.3 ද්විතීයික ආදායම

**2015 වසරේ දී සුළු අඩු වීමක් වාර්තා කළ, පෞද්ගලික හා රජයේ සංක්‍රාමවලින් සමන්විත, ද්විතීයික ආදායම් ගිණුම යම් ප්‍රමාණයකට යථා තත්ත්වයට පත් වෙමින් 2016 වසරේ දී මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.** ද්විතීයික ආදායම් ගිණුමේ ලැබීම්හි බහුතරයක් සඳහා දායකත්වය සපයන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2015 වසරේ දී වාර්තා කළ සියයට 0.5 ක අඩු වීමට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 7,242 ක් දක්වා සියයට 3.7 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, 2016 වසරේ දී රජයේ සංක්‍රාම ලැබීම් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ලැබීම්, පෙර වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 7,007 ට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,260 ක් දක්වා සියයට 3.6 කින් වර්ධනය විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සාපේක්ෂ අඩු වර්ධන වේගය සඳහා භූ-දේශපාලනික

අස්ථාවරත්වය සහ තෙල් මිල පහළ යෑම හේතුවෙන් මැද පෙරදිග රටවල්වල ආදායම් මට්ටම පහළ යෑම ප්‍රධාන වශයෙන් ඛායක වූ හේතු විය හැකිය. තවද, පුහුණු සහ ගෘහ සේවිකාවන් ද ඇතුළත් අර්ධ පුහුණු හා නුපුහුණු යනාදී කාණ්ඩ යටතේ වූ ශ්‍රම සංක්‍රමණ 2016 වසරේ දී සියයට 8.6 කින් පහළ යෑම ද විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මන්දගාමී වීමට හේතු විය. ගෘහ සේවිකාවන් ඇතුළු අර්ධ පුහුණු සහ නුපුහුණු කාණ්ඩ යටතේ ශ්‍රම සංක්‍රමණය පහළ යෑම කෙරෙහි අඩු පුහුණුවක් සහිත කාන්තා ශ්‍රම සංක්‍රමණය අධෛර්යමත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග හේතු විය. තව ද, විදේශ ශ්‍රම සංක්‍රමණ පහළ යෑම සඳහා, ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ප්‍රධාන ගමනාන්තයක් වන සෞදි අරාබියේ ශ්‍රම වෙළඳපොළ තුළ ස්වදේශිකයන්ගේ දායකත්වය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රතිපත්ති තුළින් පනවන ලද සීමා කිරීම් ද හේතු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නිකුත් කර ඇති දත්තවලට අනුව වෘත්තීයවේදීන්ගේ කාණ්ඩය යටතේ වන ශ්‍රම සංක්‍රමණය වසර තුළ දී සියයට 5.1 කින් වර්ධනය වී ඇති අතර, එය පසුගිය වසර කිහිපය තුළ පෙන්නුම් කළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සංයුතියෙහි වෙනස්වීම තවදුරටත් පවත්වා ගැනීමකි.

### 5.5 ජංගම ගිණුමේ ශේෂය

**සේවා සහ ද්විතීයික ආදායම් ගිණුම්වල අතිරික්තයන් හමුවේ වුව ද, වෙළඳ හා ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟයන් ඉහළ යෑම හේතුවෙන් 2016 වසරේ දී ජංගම ගිණුමේ හිඟය පුළුල් විය.** අපනයන ආදායම අඩු වීමත් සමඟ අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ මත වූ ආනයන වියදම ඉහළ යෑම වෙළඳ ගිණුමේ ශේෂය සැලකිය යුතු ලෙස පිරිහීමට හේතු විය. කෙසේ නමුත්, ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම්හි කැපී පෙනෙන ඉහළ යෑම හේතුවෙන් සේවා ගිණුම වෙත වූ ලැබීම් වැඩි වීම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවලින් සමන්විත වූ ද්විතීයික ආදායම් ගිණුමෙහි වූ අතිරික්තය, ජංගම ගිණුමේ වෙළඳ හා ප්‍රාථමික ආදායම් ගිණුම්වල ඇති වූ හිඟය යම් තරමකට පියවීමට දායක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2016 වසරේ දී ජංගම ගිණුමේ හිඟය, 2015 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,883 සමඟ සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,942 ක් දක්වා සුළු වශයෙන් පුළුල් විය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ දී සියයට 2.3 ක් වූ ජංගම ගිණුමේ හිඟය 2016 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.4 දක්වා සුළු වශයෙන් වැඩි විය.


### 5.6 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

**ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය, 2015 වසරේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 46 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 26 ක සුළු අතිරික්තයක් වාර්තා කළේය.** මෙය, 2016 වසරේ දී රජය වෙත ලැබුණු ප්‍රාග්ධන සංක්‍රාම අඩු වීමෙහි සහ පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන ගෙවීම් අඩු වීමෙහි සාමූහික ප්‍රතිඵලයකි.

### 5.7 මූල්‍ය ගිණුම

**2016 වසර තුළ දී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුමේ ශුද්ධ විදේශ වගකීම් වෙනස් වීම් මෙන්ම ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් ද අඩු මට්ටමක පැවතුණි.** ඒ අනුව, 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,223 ක ශුද්ධ වෙනස් වීමක් වාර්තා කළ විදේශීය වගකීම් 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,199 ක ශුද්ධ වෙනස් වීමක් වාර්තා කළේය. මේ අතර, 2016 වසරේ දී ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම්, 2015 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 911 සමඟ සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 82 ක් විය. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු මට්ටමක පැවතීම මගින් විදේශීය සෘජු ආයෝජන සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන වශයෙන් වූ ප්‍රාග්ධන ලැබීම් අඛණ්ඩව මධ්‍යස්ථ මට්ටමක පැවතීම පිළිබිඹු කළේය. ගෝලීය පොලී අනුපාත ඉහළ යෑමත්, එක්සත් ජනපද ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාවයත් හමුවේ, විශේෂයෙන්ම රජයේ රුපියල් සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ආයෝජන ඉවත් කර ගැනීම හේතුවෙන් 2016 වසර තුළ දී සැලකිය යුතු ප්‍රාග්ධන ගෙවීම් ප්‍රමාණයකට මුහුණදීමට ශ්‍රී ලංකාවට සිදු විය.

5.10 රූප සටහන
මූල්‍ය ගිණුම




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 5.8.අ සංඛ්‍යා සටහන
### මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2015 (අ) | | 2016 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| **මූල්‍ය ගිණුම** | **911** | **3,223** | **82** | **2,199** |
| **සෘජු ආයෝජන** | **53** | **680** | **237** | **898** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | 53 | 439 | 235 | 709 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 53 | 87 | 235 | 260 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 53 | 87 | 235 | 260 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 36 | - | 107 |
| අනෙකුත් සමාගම් | - | 51 | - | 153 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | - | 352 | - | 450 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 249 | - | 318 |
| අනෙකුත් සමාගම් | - | 103 | - | 131 |
| ණය උපකරණ | - | 241 | 2 | 189 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | - | 241 | 2 | 189 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 202 | - | 195 |
| කොටස් හිමියන්ගේ අත්තිකාරම් | - | 126 | - | 111 |
| අන්තර් සමාගම් ණය | - | 76 | - | 84 |
| අනෙකුත් සමාගම් | - | 145 | - | 81 |
| ණය ගෙවීම් | - | -107 | - | -87 |
| **විවිධ ආයෝජන** | **...** | **686** | **...** | **993** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | - | -60 | - | 24 |
| කොළඹ කොටස් වෙළඳපොළෙහි ලියාපදිංචි සමාගම් | - | -60 | - | 24 |
| ණය සුරැකුම්පත් | ... | 747 | ... | 969 |
| තැන්පතු භාරගන්නා ආයතන | ... | - | ... | - |
| දිගු කාලීන | ... | - | ... | - |
| රජය | - | 747 | - | 969 |
| කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | -392 | - | 36 |
| දිගු කාලීන | - | 1,139 | - | 932 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | -701 | - | -361 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | - | 190 | - | -207 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | 1,650 | - | 1,500 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **503** | **1,857** | **317** | **308** |
| මුදල් සහ තැන්පතු | 143 | 1,457 | 5 | -609 |
| මහ බැංකුව | - | 1,098 | - | -701 |
| කෙටි කාලීන | - | -2 | - | -1 |
| දිගු කාලීන | - | 1,100 | - | -700 |
| තැන්පතු භාරගන්නා ආයතන | 143 | 359 | 5 | 92 |
| කෙටි කාලීන | 152 | 359 | -4 | 92 |
| දිගු කාලීන | -9 | - | 9 | - |
| **පිටු අංක 181 හා සම්බන්ධයි...** | | | | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්** | | **4** | | **19** |
| සෘජු ආයෝජන | | 64 | | -5 |
| විවිධ ආයෝජන | | -60 | | 24 |
| **භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙත වූ ශුද්ධ ආයෝජන** | | **-1,093** | | **-325** |
| විදේශීය මිලදී ගැනීම් | | 1,211 | | 1,237 |
| විදේශීය විකුණුම් | | 2,304 | | 1,562 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2016 වසරේ දී ප්‍රාග්ධන ගලායෑම් අඛණ්ඩව සිදු වීම, ණය ආපසු ගෙවීම් ඉහළ මට්ටමක පැවතීම සහ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතීම හේතුවෙන් වසර තුළ දී විදේශීය මූල්‍යයන අවශ්‍යතාවක් ඇති විය.** ඒ අනුව, එ.ජ. ඩොලර් බිලියන 1.5 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, එ.ජ. ඩොලර් බිලියන 1.1 ක කල්පිරුණු විදේශ විනිමය හුවමාරු ගිවිසුම පියවීමෙන් අනතුරුව ඇති කරගත් එ.ජ. ඩොලර් මිලියන 400 ක නව විදේශ විනිමය හුවමාරු ගිවිසුම සහ එ.ජ. ඩොලර් මිලියන 700 ක කාලීන විදේශ විනිමය මූල්‍ය පහසුකම්, වසර තුළ දී මූල්‍ය ගිණුම ශක්තිමත් කළේය. එමෙන්ම, ගෙවුම් තුලනයට සහ රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදල සමඟ විස්තීර්ණ ණය පහසුකමක් වෙත යොමු විය. ඒ අනුව, 2016 වසර තුළ දී ශ්‍රී ලංකාව විස්තීර්ණ ණය පහසුකමෙහි වාරික දෙකක් ලබා ගත් අතර එහි වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 332 ක් විය. මෙම ක්‍රියාමාර්ග හමුවේ වුව ද, රජයේ රුපියල් සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම සමඟ වසර තුළ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. මෙම අසමතුලිතතා මධ්‍යයේ, නියමිත ණය වගකීම් පියවීමට කටයුතු කිරීම මෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළට ද්‍රවශීලතාවය සැපයීම හේතුවෙන් 2016 වසර තුළ දී දළ නිල සංචිත සැලකිය යුතු ලෙස අඩු විය.

### 5.7.1 සෘජු ආයෝජන

**2016 වසරේ දී විදේශීය සෘජු ආයෝජන ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,079 ක් වූ අතර ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබා ගත් ණය ඉවත් කළ පසු විදේශීය සෘජු ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 898 ක් විය. සංසන්දනාත්මක ලෙස, 2015 වසරේ විදේශීය ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 1,160 ක් වූ අතර, විදේශීය ණය රහිතව සෘජු ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 680 ක් විය. විදේශීය සෘජු ආයෝජන ලැබීම් අඩු මට්ටමක පැවතීම ශ්‍රී ලංකා ආර්ථිකය තුළ දිගින් දිගටම පවතින ගැටලුවක් වන අතර, එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දැමීම හමුවේ ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම වෙනස් වීම, 2016 වසරේ විදේශීය සෘජු ආයෝජන මන්දගාමී වීම කෙරෙහි බලපෑවේය. මීට අමතරව, කලාපයේ අනෙකුත් රටවල් සමඟ සැසඳීමේ දී වේතන සහ අනෙකුත් නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ යෑම, රට වෙත

විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අවාසිදායක බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇත. 2016 වසරේ මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් වලින් එ.ජ. ඩොලර් මිලියන 260 ක් හිමිකම් ප්‍රාග්ධන කොටස්වල ආයෝජන ද, එ.ජ. ඩොලර් මිලියන 450 ක් ප්‍රතිආයෝජනය කළ ඉපැයීම් ද, එ.ජ. ඩොලර් මිලියන 276 ක් කොටස් හිමියන්ගේ අත්තිකාරම් සහ අන්තර් සමාගම් ණය ද වූ අතර, 2016 වසර තුළ දී කොටස් හිමියන්ගේ අත්තිකාරම් සහ අන්තර් සමාගම් ණය පියවීම් එ.ජ. ඩොලර් මිලියන 87 ක් විය. 2016 වසර තුළ දී ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්, එම සමාගම් හා සම්බන්ධතාවයක් නොමැති පාර්ශ්වයන්ගෙන් එ.ජ. ඩොලර් මිලියන 181 ක විදේශීය ණය ලබා ගෙන ඇත.

**2016 වසරේ විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් යොමු වූයේ සංචාරක, විදුලි සන්දේශ සහ නිෂ්පාදන අංශ කෙරෙහි ය.** ආයෝජන සිදු කළ ආසන්නතම රට අනුව ගත් කල විදේශීය සෘජු ආයෝජන සිදු කළ ප්‍රධාන රටවල් පහ වූයේ මැලේසියාව, ඉන්දියාව, නෙදර්ලන්තය, චීනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයයි. මේ අතර, ශ්‍රී ලාංකික සමාගම් විදේශීය රටවල සිදු කළ ආයෝජන, 2015 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 53 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 237 ක් දක්වා වැඩි විය. විදේශයන්හි සිදු කළ මෙම විදේශීය සෘජු ආයොජනවල සැලකිය යුතු ඉහළ යෑම සඳහා ශ්‍රී ලාංකික ඇඟලුම් කර්මාන්තය විසින් සිදු කරන ලද විදේශ ආයෝජන හේතු විය. ශ්‍රී ලාංකික සමාගම් විසින් මූලික වශයෙන් විදේශීය ආයෝජන සිදු කරනු ලැබුවේ ඉන්දියාව, වියට්නාමය, බංගලාදේශය, ෆීජි සහ මාලදිවයින යන රටවල ය.

5

### 5.7.2 විවිධ ආයෝජන

#### හිමිකම්

**සෘජු ආයෝජන වශයෙන් වූ ලැබීම් හැරුණු විට කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ලැබීම් පිළිබිඹු කෙරෙන හිමිකම් කොටස් වෙත වූ විදේශීය ආයෝජන 2016 වසරේ දී පහළ මට්ටමක පැවතුණි.** විදේශීය සෘජු ආයෝජන සඳහා බලපෑ පරිදිම, නැගී එන ආර්ථිකයන්හි ප්‍රාග්ධන වෙළඳපොළවල් පිළිබඳව ආයෝජකයින් තුළ වූ අපේක්ෂාවන් පහළ මට්ටමක පැවතීම, හිමිකම් ආයෝජන සඳහා ද අඛණ්ඩව බලපෑ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 24 ක මධ්‍යස්ථ ශුද්ධ ලැබීමක් වාර්තා විය. කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ආයෝජන, ද්විතීයික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 10 ක ශුද්ධ ලැබීම් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 14 ක ලැබීම්වලින් සමන්විත විය. මෙය පසුගිය වසරේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මන්දගාමී ලැබීම් තවදුරටත් ඉදිරියට යෑමක් වන අතර, 2015 වසරේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 60 ක ආපසු ගෙවීම් වාර්තා විය.

#### ණය සුරැකුම්පත්

**ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් තුළින් අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළඳපොළ වෙතින් අරමුදල් රැස් කිරීම අඛණ්ඩව සිදු කළේය.** 2016 ජූලි මාසයේ දී ශ්‍රී ලංකාව එ.ජ. ඩොලර් බිලියන 1.5 ක වටිනාකමකින් යුතු ද්විත්ව කල්පිරීමේ කාලයක් සහිත, එනම් වසර 10 ක කල්පිරීමේ කාලයක් සහිත එ.ජ. ඩොලර් බිලියන 1 ක් සහ වසර පහමාරක කල්පිරීමේ කාලයක් සහිත එ.ජ. ඩොලර් මිලියන 500 ක් වශයෙන් වූ ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව නිකුත් කළේය. මෙය ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද දස වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව වන අතර, ජාත්‍යන්තර වෙළඳපොළෙහි ද්විත්ව කල් පිරීමේ කාලයක් සහිත බැඳුම්කර නිකුත් කළ පළමු අවස්ථාව විය. අභියෝගාත්මක ගෝලීය ආර්ථික පරිසරයක් තිබියදීත් ශ්‍රී ලංකාවේ මැදි කාලීන ඉදිරි දැක්ම කෙරෙහි විදේශීය ආයෝජකයින් තුළ ඇති අඛණ්ඩ විශ්වාසය පිළිබිඹු කරමින් කල් පිරීමේ කාල දෙක යටතේ ම නිකුත් කළ බැඳුම්කරවල පොලී අනුපාත, ඒවායේ මූලික පොලී අනුපාත නියාමනයන්ට වඩා අඩු අගයක් ගැනිණි. කෙසේ වෙතත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත වූ විදේශීය ආයෝජන 2016 වසර තුළ දී ශුද්ධ ගෙවීම් වාර්තා කළේය. ඒ අනුව, 2016 වසරේ දී භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙතින් වූ ශුද්ධ ගෙවීම් පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 361 ක් සහ එ.ජ. ඩොලර් මිලියන 207 ක් විය. මේ අතර, 2016 වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත් මත වූ විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 36 ක මධ්‍යස්ථ ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. එම හේතුවෙන්, සමුච්චිත පදනම මත, 2016 වසරේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හැරුණු විට රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 531 ක ශුද්ධ ගෙවීමක් වාර්තා වූ අතර, 2015 වසරේ දී එය එ.ජ. ඩොලර් මිලියන 903 ක ශුද්ධ ගෙවීමක් විය.

### 5.7.3 වෙනත් ආයෝජන

#### මුදල් සහ තැන්පතු

**2016 වසර තුළ දී, මුදල් සහ තැන්පතු ආශ්‍රිත වගකීම්හි ශුද්ධ වෙනස්වීම් සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළ අතර, මුදල් සහ තැන්පතු වත්කම්හි**

### 5.8.ආ සංඛ්‍යා සටහන
### මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2015 (අ) | | 2016 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 179 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | 759 | - | 753 |
| මහ බැංකුව | - | -507 | - | -123 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | -507 | - | -123 |
| සමීපස්ථ ණය පහසුකම | - | -507 | - | -455 |
| විස්තීර්ණ ණය පහසුකම | - | - | - | 332 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 787 | - | -507 |
| කෙටි කාලීන | - | 657 | - | -608 |
| දිගු කාලීන | - | 131 | - | 100 |
| රජය | - | 470 | - | 1,287 |
| දිගු කාලීන | - | 470 | - | 1,287 |
| අනෙකුත් අංශ (ඇ) | - | 9 | - | 96 |
| දිගු කාලීන | - | 9 | - | 96 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 116 | -401 | -67 | 109 |
| තැන්පතු භාරගන්නා ආයතන | -30 | - | -3 | - |
| කෙටි කාලීන | -30 | - | -3 | - |
| අනෙකුත් අංශ (ඈ) | 146 | -401 | -64 | 109 |
| කෙටි කාලීන | 146 | -401 | -64 | 109 |
| අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම් | 244 | 41 | 379 | 55 |
| මහ බැංකුව | - | 41 | - | 55 |
| කෙටි කාලීන (ඉ) | - | 41 | - | 55 |
| තැන්පතු භාරගන්නා ආයතන | 244 | - | 379 | - |
| කෙටි කාලීන | 244 | - | 379 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | | - | | - |
| **සංචිත වත්කම්** | **354** | | **-472** | |
| මූල්‍ය රත්‍රන් | -39 | | - | |
| විශේෂ ගැනුම් හිමිකම් | -2 | | -5 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | 395 | | -467 | |
| මුදල් සහ තැන්පතු | 116 | | -1,267 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 369 | | -1,365 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | -253 | | 98 | |
| සුරැකුම්පත් | 279 | | 800 | |
| ණය සුරැකුම්පත් | 279 | | 800 | |
| දිගු කාලීන | 279 | | 800 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,312** | | **-2,117** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **470** | | **1,287** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 1,268 | | 2,163 |
| ව්‍යාපෘති ණය | | 1,268 | | 1,278 |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | | - | | 700 |
| වැඩසටහන් ණය | | - | | 185 |
| ගෙවීම් | | 798 | | 876 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

**ශුද්ධ අත්කර ගැනීම් සුළු වශයෙන් ඉහළ ගියේය.** 2016 වසරේ ජූනි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 700 ක් වූ ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු ගිවිසුම පියවීමෙහි ප්‍රතිඵලයක් ලෙස මුදල් සහ තැන්පතු ආශ්‍රිත වගකීම් අඩු විය. එ.ජ. ඩොලර් මිලියන 400 ක් වූ විදේශ විනිමය හුවමාරු ගිවිසුම්හි ඉතිරි කොටස ද 2016 වසරේ දෙසැම්බර් මාසයේ දී කල්පිරුණු අතර, එම මාසය තුළදී ම එම වටිනාකමට සමාන නව විදේශ විනිමය හුවමාරු ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. මේ අතර, තැන්පතු භාර ගන්නා ආයතනයන්හි මුදල් සහ තැන්පතු ආශ්‍රිත වගකීම් ද 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 92 කින් වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුදල් හා තැන්පතු ආශ්‍රිත මුළු වගකීම්වල ශුද්ධ වෙනස්වීම් 2015 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 1,457 ක වැඩි වීමට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 609 කින් අඩු විය. එමෙන්ම, තැන්පතු භාර ගන්නා ආයතන විසින් පවත්වාගෙන යනු ලබන මුදල් සහ තැන්පතු වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්වලට අදාළ ගනුදෙනු 2015 වසරේ වූ එ.ජ. ඩොලර් මිලියන 143 ක වැඩි වීමට සාපේක්ෂව 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5 ක වැඩි වීමක් වාර්තා කළේය.

## විදේශීය ණය

**2016 වසරේ දී ශුද්ධ විදේශීය ණය ලැබීම් පසුගිය වසරේ ණය ලැබීම් හා සමාන මට්ටමක පැවතුණි.** වසර තුළ දී රජය වෙත වූ විදේශීය ණය ලැබීම් ඉහළ මට්ටමක පැවතිය ද, මහ බැංකුව, තැන්පතු භාර ගන්නා ආයතන සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් සිදු කරනු ලැබූ ණය ආපසු ගෙවීම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 759 ක් වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 753 ක් විය.

**විදේශීය ණය ලෙස රජය වෙත වූ ශුද්ධ ලැබීම් 2016 වසර තුළ දී කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය.** ඒ අනුව, 2016 වසරේ රජය වෙත වූ ශුද්ධ ලැබීම්, 2015 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 470 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,287 ක් විය. මෙය එ.ජ. ඩොලර් මිලියන 2,163 ක මුළු දිගුකාලීන ණය ලැබීම්වලින් සහ එ.ජ. ඩොලර් මිලියන 876 ක ණය ආපසු ගෙවීම්වලින් සමන්විත විය. මුළු ණය ලැබීම්වලින් එ.ජ. ඩොලර් මිලියන 1,278 ක් ව්‍යාපෘති ණයවලින් ද, එ.ජ. ඩොලර් මිලියන 700 ක් කාලීන විදේශ විනිමය මූල්‍ය පහසුකම් දෙකකින් සහ එ.ජ. ඩොලර් මිලියන 185 ක් වැඩසටහන් ණයවලින් සමන්විත විය. 2016 වසරේ දී රජයේ ව්‍යාපෘති සඳහා වූ ප්‍රධාන ණය ලැබීම් තුළ දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ

### 5.9 සංඛ්‍යා සටහන

### 2016 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්

| දායකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් මිලියන |
|---|---|
| **රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව** | **1,278** |
| එයින්; | |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **337** |
| එයින්; | |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 2 වන වාරිකය | 64 |
| පිවිතුරු බලශක්තිය සහ ප්‍රවේශය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 31 |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන | 31 |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 3 වන වාරිකය | 23 |
| රජයේ සංවර්ධන අංශ ව්‍යාපෘතිය | 17 |
| සුනිත්‍ය බලශක්ති අංශය සඳහා වන සහයෝගිතා ව්‍යාපෘතිය | 14 |
| **චීන අපනයන - ආනයන බැංකුව** | **320** |
| එයින්; | |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 1 කොටස - මාතර සිට බෙලිඅත්ත දක්වා | 97 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 2 කොටස - බෙලිඅත්ත සිට වැටිය දක්වා | 49 |
| හම්බන්තොට කේන්ද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 48 |
| පිටත වටරවුම් අධිවේගි මාර්ග ව්‍යාපෘතිය - III අදියර - කෙරවලපිටිය සිට කඩවත දක්වා | 48 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 4 කොටස - මත්තල සිට හම්බන්තොට දක්වා | 24 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **136** |
| එයින්; | |
| වේලි ආරක්ෂාව සහ ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අතිරේක මූල්‍යයනය | 24 |
| ද්විතියික සෞඛ්‍ය අංශය ප්‍රවර්ධන කිරීමේ ව්‍යාපෘතිය | 21 |
| උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතනවල සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන අතිරේක මූල්‍යයනය | 20 |
| දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම කළමනාකරණය | 17 |
| **ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ජාත්‍යන්තර බැංකුව** | **114** |
| කොළඹ නගරය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 102 |
| ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධන කිරීමේ ප්‍රතිපත්ති ණය | 12 |
| **ජපානය** | **67** |
| එයින්; | |
| ජාතික මාර්ග පද්ධතියෙහි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 15 |
| මහ කොළඹ සම්ප්‍රේෂණය කිරීමේ හා බෙදාහැරීමේ අලාභ අඩු කිරීමේ ව්‍යාපෘතිය | 13 |
| **නෙදර්ලන්ත රබෝ බැංකුව (Rabobank)** | **48** |
| ග්‍රාමීය පාලම් 463 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 48 |
| **ඉන්දියාව** | **44** |
| එයින්; | |
| මුහුදු තීරය ආරක්ෂා කිරීමේ නැව් දෙකක් ප්‍රසම්පාදනය කිරීම | 40 |
| **ඩොයිෂ් බැංකුව (Deutsche Bank AG)** | **36** |
| වානේ පාලම් 537 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 36 |
| **කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල** | **23** |
| එයින්; | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීමේ වැඩසටහන | 13 |
| **ස්පාඤ්ඤය** | **22** |
| ගණේමුල්ල, පොල්ගහවෙල සහ රාජගිරිය - ගුවන් පාලම් තුනක් සම්පාදනය කිරීම | 22 |
| **රජය සතු වාණිජ ව්‍යවසායයන්වල මුළු එකතුව** | **21** |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර | 21 |

මූලය: ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ව්‍යාපෘතියේ 1 සහ 2 අදියර, ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 2 වන වාරිකය, හම්බන්තොට කේන්ද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය සහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යනාදිය ඇතුළත් වේ. රජයට ලැබුණු වැඩසටහන් ණය, ජපන් රජය විසින් ලබා දෙන ලද එ.ජ. ඩොලර් මිලියන 85 ක සංවර්ධන ප්‍රතිපත්ති ණය පහසුකමකින් සහ ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ලබා දෙන ලද එ.ජ. ඩොලර් මිලියන 100 ක තරගකාරිත්වය, විනිවිදභාවය සහ මූල්‍ය ස්ථායීතාව සඳහා වූ සංවර්ධන ප්‍රතිපත්ති ණය පහසුකමකින් ද සමන්විත විය. මෙම වැඩසටහන් ණය, දේශීය ආයතන මගින් යෝජිත ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කොන්දේසියට යටත්ව ලබා දෙන ලදී.

**ජා.මූ. අරමුදලේ විධායක කමිටුව විසින් 2016 වසරේ ජූනි මාසයේ දී ශ්‍රී ලංකාව සඳහා වි.ගැ.හි. බිලියන 1.1 ක, ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5 ක, තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකමක් අනුමත කරන ලදී.** ජා.මූ. අරමුදලේ ශ්‍රී ලංකාවට අදාළ පංගුවෙන් සියයට 185 කට සමාන වන මෙම විස්තීර්ණ ණය පහසුකමෙහි අරමුණු වනුයේ ගෙවුම් තුලනයට සහ රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට සහාය දැක්වීමයි. විස්තීර්ණ ණය පහසුකම යටතේ වි.ගැ.හි. මිලියන 120 ක් (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 169 ක්) වූ පළමු ණය වාරිකය 2016 වසරේ ජූනි මාසයේ දී ශ්‍රී ලංකාවට ලබා දුන් අතර, ඒ හා සමාන වටිනාකමක් ඇති දෙවන ණය වාරිකය ද ජා.මූ. අරමුදල මගින් සිදු කරනු ලැබූ පළමු සමාලෝචනය සාර්ථකව නිම කිරීමෙන් පසුව 2016 නොවැම්බර් මාසයේ දී ලබා දෙන ලදී. තව ද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2009 වසරේ දී ලබා ගත් ජා.මූ. අරමුදලේ සම්පස්ථ ණය පහසුකමට අදාළ ණය වාරික අඛණ්ඩව ආපසු ගෙවන ලද අතර, ඒ යටතේ 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 455 ක ගෙවීමක් සිදු කරන ලදී. තව ද, ජා.මූ. අරමුදලේ සම්පස්ථ ණය පහසුකම 2017 වසරේ මැද භාගය වන විට සම්පූර්ණයෙන්ම ගෙවා නිම කිරීමට නියමිතය.

**2016 වසරේ දී තැන්පතු භාර ගන්නා ආයතන ශුද්ධ ණය ගෙවීමක් වාර්තා කළ අතර, පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ශුද්ධ ණය ලැබීමක් වාර්තා විය.** බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වලින් සමන්විත තැන්පතු භාර ගන්නා ආයතන ලබා ගත් ශුද්ධ විදේශීය ණය ප්‍රමාණය, 2015 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 787 ක ශුද්ධ ලැබීම් සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 507 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. පෙර වසරවල දී තම ව්‍යාපාර කටයුතු සඳහා බැංකු ක්ෂේත්‍රය වෙත අඛණ්ඩව විදේශ ණය ලැබුණු අතර, ඒ සමඟ සැසඳීමේ දී මෙය සැලකිය යුතු වෙනස් වීමකි. තවද, ගෙවුම්

තුලනයෙහි අනෙකුත් අංශය යටතේ වර්ගීකරණය කර ඇති පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත එ.ජ. ඩොලර් මිලියන 96 ක ශුද්ධ විදේශීය ණය ලැබීමක් වාර්තා විය. 2016 වසරේ අනෙකුත් අංශය සඳහා වූ ණය ලැබීම් පෞද්ගලික අංශය වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 637 ක සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 21 ක ණය ලැබීම්වලින් සමන්විත විය. මේ අතර, 2016 වසරේ දී විදේශීය ණය ගෙවීම්, පෞද්ගලික අංශය විසින් ගෙවන ලද එ.ජ. ඩොලර් මිලියන 362 කින් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ගෙවන ලද එ.ජ. ඩොලර් මිලියන 200 කින් සමන්විත විය. රජය සතු වාණිජ ව්‍යවසායයන් සිදු කළ ණය ගෙවීම්වලින් වැඩි ප්‍රමාණයක් පුත්තලම ගල්අඟුරු බලාගාරය, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සහ ශ්‍රීලංකන් ගුවන් සේවය යනාදිය සඳහා ලබා ගත් ණය ආපසු ගෙවීම් හා සම්බන්ධ විය.

### වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්

**2016 වසරේ දී නේවාසිකයින් ලබා ගත් වෙළඳ ණය හා අත්තිකාරම් ඉහළ ගිය අතර, අනේවාසිකයින්ට ලබා දුන් වෙළඳ ණය හා අත්තිකාරම් අඩු විය.** 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 401 කින් පහළ ගිය වෙළඳ ණය ලැබීම් 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 109 කින් ඉහළ ගියේය. වසර තුළ දී වෙළඳ ණය ලැබීම් හේතුවෙන් වූ වගකීම්වල ශුද්ධ වෙනස්වීම් තුළ ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 95 ක සහ පෞද්ගලික අංශය වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 14 ක වෙළඳ ණය අන්තර්ගත විය. මේ අතර, ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් තම වෙළඳ හවුල්කරුවන් වෙත ලබා දුන් සහ බැංකු අංශය විසින් ලබා දුන් වෙළඳ ණය අත්තිකාරම් වශයෙන් වූ ශුද්ධ වත්කම් අත්කර ගැනීම් 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 67 කින් අඩු විය. මෙය, පෞද්ගලික සහ බැංකු අංශ විසින් ලබා දෙන ලද වෙළඳ ණය අත්තිකාරම් පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 64 කින් සහ එ.ජ. ඩොලර් මිලියන 3 කින් අඩු වීමෙහි ප්‍රතිඵලයකි. තව ද, 2016 වසරේ දී මූලික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ (ACU) වගකීම් ඇතුළත් අනෙකුත් ගෙවිය යුතු ගිණුම්, එ.ජ. ඩොලර් මිලියන 55 ක ශුද්ධ වැඩි වීමක් වාර්තා කළ අතර, අනෙකුත් ලැබිය යුතු ගිණුම් වශයෙන් සැලකෙන බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 379 ක ශුද්ධ වැඩි වීමක් වාර්තා කළේය.

### 5.7.4 විදේශීය සංචිත වත්කම්

**වසර තුළ විදේශීය සංචිත වත්කම් තත්ත්වයෙහි සිදු වූ අඩු වීමට අනුකූලව, 2016 වසරේ දී විදේශීය සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු පහළ ගියේය.** සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු 2015 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 354 ක ශුද්ධ වැඩි වීම හා සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 472 ක ශුද්ධ අඩුවීමක් වාර්තා කළේය. මෙයට අමතරව, වසර තුළ දී මුදල් හා තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 1,267 කින් අඩු වීම, විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) එ.ජ. ඩොලර් මිලියන 5 කින් අඩු වීම සහ ණය සුරැකුම්පත් එ.ජ. ඩොලර් මිලියන 800 කින් වැඩි වීම විදේශීය සංචිත වත්කම් ආශ්‍රිත ගනුදෙනු තුළ අන්තර්ගත විය.

## 5.8 සමස්ත ශේෂය

**2016 වසරේ දී ශුද්ධ විදේශීය සංචිතවල වෙනස් වීම පිළිබිඹු කරන ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය මෙම කාලපරිච්ඡේදය තුළදී හිඟයක් වාර්තා කළේය.** 2015 වසරේ එ.ජ. ඩොලර් මිලියන 1,489 ක් වූ සමස්ත හිඟය සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී ගෙවුම් තුලනය එ.ජ. ඩොලර් මිලියන 500 ක සමස්ත හිඟයක් වාර්තා කළේය. සංචිත වත්කම් තත්ත්වය සහ සංචිත හා සම්බන්ධ වගකීම් තත්ත්වය වසර තුළ දී අඩු වීමත් සමඟ ශුද්ධ විදේශීය සංචිත, 2015 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 5,029 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 4,529 ක් දක්වා අඩු විය. සමස්ත ශේෂයේ හිඟය තුළින් 2016 වසරේ දී ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම, විදේශීය ණය පියවීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සැලකිය යුතු ලෙස දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත්වීම හේතුවෙන් විදේශීය සංචිතවල පහළ යෑම කෙරෙහි පැවති අඛණ්ඩ පීඩනය පිළිබිඹු විය.

## 5.9 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**2016 වසර අවසානයේ දී රටෙහි අන්තර්ජාතික ආයෝජන තත්ත්වය සැලකීමේ දී, විදේශීය වගකීම් තත්ත්වයෙහි ඉහළ යෑමක් ද, විදේශීය වත්කම් තත්ත්වයෙහි පහළ යෑමක් ද වාර්තා විය.** සෘජු ආයෝජන වත්කම් තත්ත්වය සහ අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය ඉහළ ගිය ද, ප්‍රධාන වශයෙන් සංචිත වත්කම් තත්ත්වය අඩු වීම හේතුවෙන් මුළු විදේශීය වත්කම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 10,086 ක් දක්වා අඩු විය. මේ අතර, 2016 වසර අවසානය වන විට මුළු විදේශීය වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 55,036 ක් දක්වා ඉහළ ගිය අතර එය 2015 වසර අවසානයේ දී පැවති මුළු වගකීම් තත්ත්වයට වඩා එ.ජ. ඩොලර් මිලියන 1,295 ක වැඩි වීමකි. නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය ඉහළ යෑම කෙරෙහි රජය විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම, රජය

5

### 5.10 සංඛ්‍යා සටහන
### අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2015 (අ) | | 2016 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **817** | **10,022** | **1,136** | **9,745** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 814 | 7,408 | 1,131 | 6,943 |
| ණය උපකරණ | 3 | 2,613 | 5 | 2,802 |
| **විවිධ ආයෝජන** | **0.1** | **12,331** | **0.1** | **13,772** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | | 1,492 | | 1,507 |
| අනෙකුත් අංශ | | 1,492 | | 1,507 |
| ණය සුරැකුම්පත් (ඈ) | 0.1 | 10,839 | 0.1 | 12,265 |
| තැන්පතු භාරගන්නා ආයතන | 0.1 | 2,140 | 0.1 | 2,190 |
| දිගු කාලීන | 0.1 | 2,140 | 0.1 | 2,190 |
| රජය | | 8,534 | | 9,903 |
| කෙටි කාලීන | | 33 | | 80 |
| දිගු කාලීන | | 8,501 | | 9,823 |
| අනෙකුත් අංශ | | 164 | | 172 |
| දිගු කාලීන | | 164 | | 172 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **2,614** | **31,387** | **2,931** | **31,519** |
| **මුදල් සහ තැන්පතු** | **701** | **3,051** | **706** | **2,442** |
| මහ බැංකුව | | 1,105 | | 403 |
| කෙටි කාලීන | | 5 | | 3 |
| දිගු කාලීන | | 1,100 | | 400 |
| තැන්පතු භාරගන්නා ආයතන | 701 | 1,946 | 706 | 2,039 |
| කෙටි කාලීන | 539 | 1,946 | 535 | 2,039 |
| දිගු කාලීන | 162 | | 171 | |
| **ණය** | | **25,936** | | **26,530** |
| මහ බැංකුව | | 692 | | 554 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | | 692 | | 554 |
| තැන්පතු භාරගන්නා ආයතන | | 5,070 | | 4,562 |
| කෙටි කාලීන | | 3,816 | | 3,209 |
| දිගු කාලීන | | 1,253 | | 1,354 |
| රජය | | 16,147 | | 17,295 |
| දිගු කාලීන | | 16,147 | | 17,295 |
| අනෙකුත් අංශ (ඉ) | | 4,028 | | 4,119 |
| දිගු කාලීන | | 4,028 | | 4,119 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **677** | **1,375** | **610** | **1,483** |
| තැන්පතු භාරගන්නා ආයතන | 96 | | 93 | |
| කෙටි කාලීන | 96 | | 93 | |
| අනෙකුත් අංශ (ඊ) | 581 | 1,375 | 517 | 1,483 |
| කෙටි කාලීන | 581 | 1,375 | 517 | 1,483 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **1,236** | **478** | **1,615** | **533** |
| මහ බැංකුව (උ) | | 478 | | 533 |
| කෙටි කාලීන | | 478 | | 533 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,236 | | 1,615 | |
| කෙටි කාලීන | 1,236 | | 1,615 | |
| **විශේෂ ගැනුම් හිමිකම්** | | **548** | | **532** |
| **සංචිත වත්කම්** | **7,304** | | **6,019** | |
| මූල්‍ය රත්‍රන් | 760 | | 830 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 7 | | 2 | |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | 66 | | 64 | |
| අනෙකුත් සංචිත වත්කම් | 6,470 | | 5,122 | |
| මුදල් සහ තැන්පතු | 3,911 | | 2,644 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 2,167 | | 802 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 1,745 | | 1,842 | |
| සුරැකුම්පත් | 2,559 | | 2,478 | |
| ණය සුරැකුම්පත් | 2,559 | | 2,478 | |
| **මුළු වත්කම්/වගකීම්** | **10,734** | **53,740** | **10,086** | **55,036** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | **-43,006** | | **-44,949** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය | 10,734 | 53,740 | 10,086 | 55,036 |
| කෙටි කාලීන | 7,190 | 9,146 | 6,299 | 8,853 |
| දිගු කාලීන | 3,544 | 44,595 | 3,788 | 46,182 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය එකතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙත ලැබුණු විදේශීය ණය, නේවාසිකයින් ලද වෙළඳ ණය සහ ආසියානු නිෂ්කාශන සංගමයේ වෙතැති ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් සුළු වශයෙන් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, වසර තුළ දී නොපියවා ඉතිරිව ඇති සෘජු ආයෝජන තත්ත්වය, ශ්‍රී ලංකා මහ බැංකුව සතු මුදල් සහ තැන්පතු සහ තැන්පතු භාර ගන්නා ආයතන හා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය පහළ ගියේය. විදේශීය වත්කම් තත්ත්වයෙහි අඩු වීම සහ විදේශීය වගකීම් තත්ත්වයෙහි ඉහළ යෑම පිළිබිඹු කරමින් අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි ශුද්ධ වගකීම් තත්ත්වය 2015 වසර අවසානයේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 43,006 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 44,949 ක් දක්වා ඉහළ ගියේය. සෘජු ආයෝජන ලැබීම් සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම සහ මූල්‍ය ගිණුම වෙත වන ණය නොවන වෙනත් ලැබීම් අඩු වීම හමුවේ ජංගම ගිණුමේ හිඟය මූල්‍යයනය කිරීමට විදේශීය ණය මූලාශ්‍ර වෙත වැඩි වශයෙන් යොමු වීම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකාවේ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය තවදුරටත් පිරිහීමට ලක්විය.

### 5.9.1 සෘජු ආයෝජන තත්ත්වය

**2016 වසරේ දී සෘජු ආයෝජන වත්කම් තත්ත්වය ඉහළ ගිය අතර, සෘජු ආයෝජන වගකීම් තත්ත්වය අඩු විය.** ශ්‍රී ලාංකික සමාගම් විදේශයන්හි සිදු කළ හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්වල ආයෝජන ඉහළ යෑම පිළිබිඹු කරමින් සෘජු ආයෝජන වත්කම් තත්ත්වය 2015 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 817 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,136 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2016 වසරේ දී ගෙවුම් තුලනයෙහි සෘජු ආයෝජන ශුද්ධ ලැබීමක් වාර්තා කළ ද, සෘජු ආයෝජන වගකීම් තත්ත්වය 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 9,745 ක් දක්වා පහළ ගියේය. 2016 වසරේ දී වෙළඳ මිල අඩු වීම හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම්හි, සෘජු ආයෝජන හිමිකම් කොටස්වල තත්ත්වය එ.ජ. ඩොලර් බිලියන 1.2 කින් පමණ පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම අඩු වීම ශ්‍රී ලංකාවේ මුළු සෘජු ආයෝජන තත්ත්වයෙන් සියයට 10 ක් පමණ වන අතර, එය වසර තුළ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි සියලු කොටස් මිල දර්ශකයෙහි අඩු වීමේ ප්‍රතිශතයට අනුරූප වේ. 2016 වසර අවසානයේ දී පැවති සෘජු ආයෝජන තත්ත්වය අනුව ප්‍රධාන ආයෝජන මූලාශ්‍ර පහ වූයේ නෙදර්ලන්තය, ඉන්දියාව, මැලේසියාව, චීනය සහ ස්විට්සර්ලන්තයයි. කෙසේ නමුත්, මෙම වසර තුළ දී සෘජු ආයෝජකයන්ගේ අත්තිකාරම් ඉහළ යෑම පිළිබිඹු කරමින් ණය සුරැකුම්පත්වල වගකීම් තත්ත්වය ඉහළ ගියේය.

### 5.9.2 විවිධ ආයෝජන තත්ත්වය

**ද්විත්ව කල්පිරීමක් සහිත ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් වූ ලැබීම් සමඟ විවිධ ආයෝජන වගකීම් තත්ත්වය ඉහළ ගිය අතර, 2016 වසරේ දී හිමිකම් කොටස් වෙත වූ ලැබීම් මන්දගාමී මට්ටමක පැවතුණි.** නොපියවා ඉතිරිව ඇති හිමිකම් සහ ණය සුරැකුම්පත්වලින් සමන්විත විවිධ ආයෝජන හා සම්බන්ධ වගකීම් තත්ත්වය, 2015 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 12,331 ක සිට 2016 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 13,772 ක් දක්වා වැඩි විය. වසර අවසානයේ දී විවිධ ආයෝජන හිමිකම් කොටස්වල ආයෝජන තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 1,507 ක් දක්වා ඉහළ ගිය අතර ණය සුරැකුම්පත් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 12,265 ක් දක්වා ඉහළ ගියේය. රජයේ නොපියවා ඉතිරිව ඇති ණය සුරැකුම්පත්වල තත්ත්වය, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම හේතුවෙන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ පොලී අනුපාතික ඉහළ යෑමේ අපේක්ෂාව සහ ඉන් අනතුරුව පොලී අනුපාතික ඉහළ යෑම හේතුවෙන් අනේවාසිකයින් සතු රුපියල් වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජනවල සැලකිය යුතු ගෙවීම් ප්‍රමාණයක් වාර්තා විය. මෙය, වසර අවසානය වන විට අනේවාසිකයින් සතු නොපියවා ඉතිරිව ඇති සමස්ත රාජ්‍ය ණය සුරැකුම්පත් තත්ත්වයෙහි ඉහළ යෑම අඩු මට්ටමක පැවතීමට හේතු විය. මේ අතර, වසර අවසන් වන විට තැන්පතු භාර ගන්නා ආයතනවල ණය සුරැකුම්පත් තත්ත්වය, ලංකා බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කරවල වෙළඳපොළ මිල වෙනස්වීම හේතුවෙන් සුළු වැඩිවීමක් වාර්තා කළේය.

### 5.9.3 අනෙකුත් ආයෝජන තත්ත්වය

#### මුදල් සහ තැන්පතු

**2016 වසර අවසානයේ දී මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය සුළු වශයෙන් ඉහළ ගිය අතර වගකීම් තත්ත්වය පහළ යෑමක් වාර්තා කළේය.** වසර තුළ දී මූලික වශයෙන් විදේශ විනිමය හුවමාරු ගිවිසුමෙහි එ.ජ. ඩොලර් මිලියන 700 ක් ගෙවීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් සහ තැන්පතු තත්ත්වය 2015 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 1,105 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 403 ක් දක්වා පහළ ගියේය. තැන්පතු භාර ගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු තත්ත්වය 2015 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,946 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 2,039 ක් දක්වා ඉහළ ගියේය. තැන්පතු භාර ගන්නා ආයතනවල වත්කම් තත්ත්වයෙන් සමන්විත වන මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 706 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය.

#### විදේශීය ණය

**2016 වසර අවසානය වන විට ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය තුළ විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ යෑමට රජයේ විදේශීය ණය තත්ත්වය වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු විය.** විදේශීය ණය වගකීම් තත්ත්වය 2015 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 25,936 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 26,530 ක් දක්වා ඉහළ ගියේය. වසර අවසානය වන විට රජයේ විදේශීය ණය වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 17,295 ක් දක්වා ඉහළ ගිය අතර, මේ සඳහා රජය විසින් ලබා ගන්නා ලද නව ව්‍යාපෘති ණය, කාලීන විදේශීය විනිමය මූල්‍ය පහසුකම් ද්විත්වය සහ වැඩසටහන් ණය පහසුකම් ද්විත්වය හේතු විය. බැංකු අංශය වෙත වූ ණය ලැබීම් අඩු මට්ටමක පැවතීමත්, ණය සේවාකරණය අඛණ්ඩව සිදු කිරීමත් හේතුවෙන් තැන්පතු භාර ගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති ණය තත්ත්වය වසර පහකට පසු පළමු වතාවට පහළ ගියේය. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පළමු වාරික දෙකෙහි ලැබීම් හමුවේ වුව ද, සමීපස්ථ ණය පහසුකම හා සම්බන්ධ පියවීම් හේතුවෙන් වූ ශුද්ධ බලපෑම මත ශ්‍රී ලංකා මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් තත්ත්වය අඩු විය. වසර තුළ දී ණය මුදාහැරීම් හා ගෙවීම් ඉහළ යෑම හමුවේ පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ණය වගකීම්වලින් සමන්විත අනෙකුත් අංශවල ණය වගකීම් තත්ත්වය සුළු වශයෙන් ඉහළ ගියේය.


#### වෙළඳ ණය සහ අත්තිකාරම්

**2016 වසරේ දී වෙළඳ ණය සහ අත්තිකාරම් වත්කම් තත්ත්වය අඩු වූ අතර වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** පෞද්ගලික අංශයේ වෙළඳ ණය සහ අත්තිකාරම්වලින් සමන්විත වන නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම් තත්ත්වය 2015 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 1,375 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,483 ක් දක්වා වැඩි විය. තැන්පතු භාර ගන්නා ආයතන සහ පෞද්ගලික අංශය ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්වලින් පිළිබිඹු කෙරෙන නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය සහ අත්තිකාරම් වත්කම් තත්ත්වය 2015 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 677 ක සිට 2016 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් මිලියන 610 ක් දක්වා පහළ ගියේය.

## අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම් සහ විශේෂ ගැනුම් හිමිකම්

**2016 වසරේ දී නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය මෙන්ම අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය ද ඉහළ ගියේය.** තැන්පතු භාර ගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය 2015 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 1,236 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,615 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආසියානු නිෂ්කාශන සංගමය වෙතැති වගකීම් වැඩි වීමත් සමඟ නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 533 ක් දක්වා වැඩි විය. තව ද, 2016 වසර අවසානය වන විට විශේෂ ගැනුම් හිමිකම් වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 532 ක් දක්වා සුළු වශයෙන් අඩු විය.

### 5.11 රූප සටහන
### කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### 5.9.4 විදේශීය සංචිත වත්කම් තත්ත්වය

**ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත තත්ත්වය 2015 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 7.3 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.0 ක් දක්වා අඩු විය.** 2016 වසර අවසානයේ දී පැවැති දළ නිල සංචිත, මාස 3.7 ක වෙළඳ භාණ්ඩ ආනයන හා සමාන වූ අතර, මාස 3.1 ක භාණ්ඩ සහ සේවා ආනයන හා සමාන විය. විදේශීය ණය සේවාකරණ ගෙවීම්, විදේශ විනිමය හුවමාරු ගිවිසුමේ කොටසක් පියවීම, ජා.මූ. අරමුදලෙන් ලබා ගත් සමීපස්ථ ණය පහසුකමෙහි ගෙවීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය ද්‍රවශීලතාවය සැපයීම සඳහා, දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත්වීම දළ නිල සංචිත අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. දළ නිල සංචිත සහ තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය

### 5.11 සංඛ්‍යා සටහන
### දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| | එ.ජ. ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | 2016 (අ) | 2012 | 2013 | 2014 | 2015 | 2016 (අ) |
| 1. රජයේ විදේශීය වත්කම් | 631 | 465 | 635 | 470 | 289 | 80,209 | 60,857 | 83,262 | 67,690 | 43,303 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 6,475 | 7,030 | 7,573 | 6,834 | 5,730 | 823,375 | 919,171 | 992,438 | 984,489 | 858,352 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 7,106 | 7,495 | 8,208 | 7,304 | 6,019 | 903,584 | 980,028 | 1,075,700 | 1,052,178 | 901,655 |
| 4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් | 1,481 | 1,078 | 1,676 | 2,033 | 2,414 | 188,195 | 141,008 | 219,641 | 292,916 | 361,601 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 8,587 | 8,573 | 9,884 | 9,337 | 8,433 | 1,091,779 | 1,121,036 | 1,295,342 | 1,345,095 | 1,263,252 |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 2,943 | 2,347 | 1,691 | 2,275 | 1,490 | 373,984 | 306,825 | 221,593 | 327,725 | 223,214 |
| 7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6) | 4,163 | 5,148 | 6,517 | 5,029 | 4,529 | 529,600 | 673,203 | 854,107 | 724,453 | 678,437 |
| 8. සමස්ත ශේෂය (ඈ) | 151 | 985 | 1,369 | -1,489 | -500 | 72,619 | 143,603 | 180,904 | -129,654 | -46,017 |
| 9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 9.1 වෙළඳ භාණ්ඩ | 4.4 | 5.0 | 5.1 | 4.6 | 3.7 | | | | | |
| 9.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 3.9 | 4.2 | 4.3 | 3.8 | 3.1 | | | | | |
| 10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 10.1 වෙළඳ භාණ්ඩ | 5.4 | 5.7 | 6.1 | 5.9 | 5.2 | | | | | |
| 10.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 4.7 | 4.8 | 5.1 | 4.9 | 4.3 | | | | | |

(අ) තාවකාලික

(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)

(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් තත්ත්වය 2015 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 9.3 ක සිට 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 8.4 ක් දක්වා පහළ ගියේය. තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වත්කම් ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී මුළු විදේශීය වත්කම් තත්ත්වයෙහි විශාල අඩු වීමක් යම්තාක් දුරට මගහරවා ගැනීමට හැකි විය. මුළු විදේශීය වත්කම් තත්ත්වය මාස 5.2 ක භාණ්ඩ ආනයන සහ මාස 4.3 ක භාණ්ඩ හා සේවා ආනයන හා සමාන විය.


## 5.10 විදේශීය ණය සහ ණය සේවාකරණය

### 5.10.1 විදේශීය ණය

**2016 වසර තුළ දී රටෙහි මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.7 කින් ඉහළ ගියේය.** එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වසර අග දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 44.8 ක මුළු විදේශීය ණය ප්‍රමාණය 2016 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 46.6 ක් දක්වා ඉහළ ගියේය. 2016 වසරේ දී විදේශීය ණය ප්‍රමාණය ඉහළ යෑම කෙරෙහි මූලිකවම හේතු වූයේ රජය ලබා ගත් විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 2.5 කින් ඉහළ යෑමයි. 2016 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම හමුවේ වුව ද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව, කාලීන විදේශීය විනිමය මූල්‍ය පහසුකම් ද්විත්වය සහ ව්‍යාපෘති හා වැඩසටහන් ණය ලබා ගැනීම හේතුවෙන් රජයේ විදේශීය ණය ප්‍රමාණය ඉහළ ගියේය. මේ අතර, විදේශ විනිමය හුවමාරු ගිවිසුමෙහි කොටසක් ආපසු ගෙවීම සහ ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමෙහි ආපසු ගෙවීම් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 801 කින් අඩු විය. තවද, 2016 වසරේ දී තැන්පතු භාර ගන්නා

**5.12 රූප සටහන**

**විදේශීය ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.12 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය**

එ.ජ. ඩොලර් මිලියන
*(වසර අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2015 (අ) | 2016 (ආ) |
|---|---|---|
| රජය | **24,681** | **27,197** |
| කෙටි කාලීන | **33** | **80** |
| ණය සුරැකුම්පත් | 33 | 80 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 33 | 80 |
| දිගු කාලීන | **24,647** | **27,118** |
| ණය සුරැකුම්පත් | 8,501 | 9,823 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 1,811 | 1,440 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ) | 265 | 58 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ) | 6,425 | 8,325 |
| ණය | 16,147 | 17,295 |
| මහ බැංකුව | **2,823** | **2,022** |
| කෙටි කාලීන | **483** | **536** |
| මුදල් සහ තැන්පතු | 5 | 3 |
| අනෙකුත් ගිණුම් ගෙවිය යුතු | 478 | 533 |
| ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 478 | 533 |
| දිගු කාලීන | **2,340** | **1,486** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 548 | 532 |
| මුදල් සහ තැන්පතු | 1,100 | 400 |
| ණය | 692 | 554 |
| ජා.මූ. අරමුදලේ ණය | 692 | 554 |
| සමීපස්ථ ණය පහසුකම | 692 | 232 |
| විස්තීර්ණ ණය පහසුකම | - | 322 |
| තැන්පතු භාරගන්නා ආයතන | **9,156** | **8,790** |
| කෙටි කාලීන | **5,762** | **5,247** |
| මුදල් සහ තැන්පතු (ඊ) | 1,946 | 2,039 |
| වාණිජ බැංකු | 1,946 | 2,039 |
| ණය | 3,816 | 3,209 |
| වාණිජ බැංකු | 3,816 | 3,209 |
| දිගු කාලීන | **3,393** | **3,543** |
| ණය සුරැකුම්පත් (ඉ) | 2,140 | 2,190 |
| වාණිජ බැංකු | 1,112 | 1,128 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 1,028 | 1,062 |
| ණය | 1,253 | 1,354 |
| වාණිජ බැංකු | 1,240 | 1,339 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 13 | 14 |
| අනෙකුත් අංශ (උ) | **5,567** | **5,774** |
| කෙටි කාලීන | **1,375** | **1,483** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ) | 1,375 | 1,483 |
| දිගු කාලීන | **4,192** | **4,291** |
| ණය සුරැකුම්පත් (ඉ) | 164 | 172 |
| ණය | 4,028 | 4,119 |
| පෞද්ගලික අංශය | 1,604 | 1,876 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා | 2,423 | 2,242 |
| සෘජු ආයෝජන : අන්තර් සමාගම් ණය (එ) | **2,613** | **2,802** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **44,839** | **46,586** |
| ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් | | |
| දළ විදේශීය ණය | 55.7 | 57.3 |
| කෙටි කාලීන ණය | 9.5 | 9.0 |
| දිගු කාලීන ණය | 46.2 | 48.3 |
| දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් | | |
| කෙටි කාලීන ණය | 17.1 | 15.8 |
| දිගු කාලීන ණය | 82.9 | 84.2 |
| **විශේෂිත අයිතමයන්** | | |
| ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය | **11,299** | **12,219** |
| රජය | 9,024 | 9,944 |
| භාණ්ඩාගාර බිල්පත් | 35 | 86 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 2,074 | 1,650 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 265 | 58 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 6,650 | 8,150 |
| මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන | 2,100 | 2,100 |
| වාණිජ බැංකු | 1,100 | 1,100 |
| ලියාපදිංචි විශේෂිත බැංකු | 1,000 | 1,000 |
| අනෙකුත් අංශ | 175 | 175 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආයතන, පෞද්ගලික අංශයේ ආයතන හා රජය සතු වාණිජ ව්‍යවසායයන්, සහ සෘජු ආයෝජන සමාගම්හි අන්තර් සමාගම් ණය හා සම්බන්ධ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණයන් පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 8,790 ක්, එ.ජ. ඩොලර් මිලියන 5,774 ක් සහ එ.ජ. ඩොලර් මිලියන 2,802 ක් විය.

**මූලික වශයෙන් රජයේ විදේශීය ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් 2015 වසර අවසානයේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 55.7 ක් වූ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 2016 වසර අවසානයේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 57.3 දක්වා වැඩි විය.** 2016 වසර අවසාන වන විට රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 58.4 ක් වූ අතර, එය 2015 වසර අවසාන වන විට සියයට 55.0 ක් විය. තවද, දීර්ඝකාලීන කල්පිරීම් සහිත ණය ලබා ගැනීමේ නැඹුරුව පිළිබිඹු කරමින් දිගුකාලීන ණය මුළු විදේශීය ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 82.9 හා සැසඳීමේ දී 2016 වසර අග වන විට සියයට 84.2 ක් දක්වා වැඩි විය. ගෝලීය පොලී අනුපාතික ඉහළ යෑමට වැඩි ඉඩකඩක් පවතින බැවින් විදේශීය ණය ගැනීමේ දී පිරිවැය ඉහළ යෑමට හැකියාවක් සහිත පසුබිමක් තුළ, ශ්‍රී ලංකාවේ විදේශීය ණය අඛණ්ඩව ඉහළ යෑම විදේශීය අංශය මුහුණපාන ප්‍රධාන ගැටලුවකි.

### 5.10.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**2016 වසරේ ශ්‍රී ලංකාවේ විදේශීය ණය වගකීම් මත වූ ණය වාරික ගෙවීම් අඩු වූ අතර පොලී ගෙවීම් වැඩි විය.** විදේශීය ණය වගකීම් මත වූ ණය වාරික

**5.13 සංඛ්‍යා සටහන**
**විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 (අ) | 2016 (ආ) | 2012 | 2013 | 2014 | 2015 (අ) | 2016 (ආ) |
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **2,675** | **4,040** | **3,479** | **4,626** | **4,366** | **341,382** | **521,626** | **454,248** | **628,641** | **585,628** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **1,795** | **2,982** | **2,323** | **3,435** | **3,157** | **229,049** | **384,942** | **303,347** | **467,546** | **410,937** |
| රජය | 1,490 | 1,555 | 1,296 | 1,976 | 1,040 | 190,088 | 200,705 | 169,150 | 265,662 | 151,236 |
| ව්‍යාපෘති ණය | 862 | 836 | 793 | 798 | 876 | 109,975 | 107,906 | 103,540 | 107,536 | 127,396 |
| ණය සුරැකුම්පත් | 628 | 719 | 503 | 1,178 | 164 | 80,114 | 92,799 | 65,610 | 158,126 | 23,840 |
| මහ බැංකුව | 57 | 653 | 719 | 907 | 1,555 | 7,268 | 84,285 | 93,917 | 125,686 | 177,396 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 57 | 453 | 719 | 507 | 455 | 7,268 | 58,463 | 93,917 | 68,775 | 17,234 |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | - | 200 | - | 400 | 1,100 | - | 25,822 | - | 56,911 | 160,162 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 248 | 774 | 309 | 553 | 562 | 31,692 | 99,952 | 40,280 | 76,199 | 82,304 |
| විදේශීය ණය | 248 | 774 | 309 | 553 | 562 | 31,692 | 99,952 | 40,280 | 76,199 | 82,304 |
| **1.2 පොලී ගෙවීම්** | **880** | **1,059** | **1,156** | **1,190** | **1,209** | **112,333** | **136,685** | **150,901** | **161,095** | **174,690** |
| රජය | 702 | 832 | 876 | 870 | 862 | 89,547 | 107,357 | 114,368 | 117,496 | 124,042 |
| ව්‍යාපෘති ණය | 294 | 255 | 260 | 266 | 264 | 37,464 | 32,982 | 33,883 | 36,024 | 38,440 |
| ණය සුරැකුම්පත් | 408 | 576 | 616 | 604 | 597 | 52,083 | 74,376 | 80,485 | 81,472 | 85,602 |
| මහ බැංකුව | 43 | 35 | 20 | 13 | 10 | 5,512 | 4,507 | 2,546 | 1,693 | 1,436 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 36 | 33 | 20 | 10 | 8 | 4,593 | 4,313 | 2,546 | 1,395 | 1,179 |
| අනෙකුත් | 7 | 2 | - | 2 | 2 | 919 | 194 | - | 298 | 257 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 135 | 192 | 260 | 307 | 338 | 17,274 | 24,820 | 33,986 | 41,907 | 49,212 |
| විදේශීය ණය | 135 | 145 | 118 | 148 | 179 | 17,274 | 18,663 | 15,470 | 20,128 | 26,026 |
| ණය සුරැකුම්පත් | - | 48 | 142 | 159 | 159 | - | 6,157 | 18,517 | 21,779 | 23,186 |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **13,573** | **15,079** | **16,735** | **16,943** | **17,448** | | | | | |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **19,754** | **21,639** | **23,936** | **24,078** | **24,829** | | | | | |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | | | | | | | | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 19.7 | 26.8 | 20.8 | 27.3 | 25.0 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 19.0 | 23.6 | 16.4 | 24.2 | 22.4 | | | | | |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 13.5 | 18.7 | 14.5 | 19.2 | 17.6 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 13.1 | 16.4 | 11.4 | 17.1 | 15.7 | | | | | |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 2,191 | 2,386 | 2,172 | 2,846 | 1,901 | | | | | |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 81.9 | 59.1 | 62.4 | 61.5 | 43.5 | | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගෙවීම් 2015 දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,435 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 3,157 ක් විය. 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ගෙවීම, රාජ්‍ය සුරැකුම්පත් ආපසු ගෙවීම් තුළ අන්තර්ගත වීම හේතුවෙන්, එම වසර සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී රාජ්‍ය සුරැකුම්පත්වල ණය වාරික ගෙවීම්හි සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුවත්, 2016 දී ජා.මූ. අරමුදලේ සම්පස්ථ ණය පහසුකමට අදාළ ණය වාරික ගෙවීම් සහ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් පියවීම සමඟ මහ බැංකුවේ ණය ගෙවීම් වැඩි විය. නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම් මත වූ පොලී ගෙවීම් 2015 දී එ.ජ. ඩොලර් මිලියන 1,190 ක සිට 2016 දී එ.ජ. ඩොලර් මිලියන 1,209 ක් දක්වා වැඩි විය. පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන ලබා ගත් ණය මත වූ පොලී ගෙවීම් වැඩි වීම, සමස්ත පොලී ගෙවීම් වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය.

**වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් විට සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2016 වසරේ දී පහත වැටුණි.** භාණ්ඩ හා සේවා අපනයන ආදායම ඉහළ යෑම සහ සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස, භාණ්ඩ හා සේවා අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස ණය සේවාකරණ ගෙවීම්, 2015 වසරේ පැවති සියයට 27.3 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී සියයට 25.0 ක් දක්වා පහත වැටුණි. එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දැමීම සමඟ ගෝලීය පොලී අනුපාතිකයන් ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, මේ හේතුවෙන් ඉදිරි වසරවල දී විදේශීය මූලාශ්‍රයන්ගෙන් ලබා ගන්නා ණය සඳහා දැරීමට වන පිරිවැය ඉහළ යනු ඇත.


## 5.11 විනිමය අනුපාතිකයේ වෙනස්වීම්

**ශ්‍රී ලංකා රුපියලේ විදේශීය අගය 2016 වසර තුළ දී තවදුරටත් අවප්‍රමාණය විය.** වසරේ පළමු භාගය තුළ දී සියයට 0.82 කින් අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, වසරේ දෙවන භාගය තුළ සියයට 3.04 ක ඉහළ වේගයකින් අවප්‍රමාණය විය. වසරේ පළමු භාගය තුළ ශ්‍රී ලංකා රුපියලෙහි අගය සාපේක්ෂ වශයෙන් සුළු ප්‍රමාණයකින් අවප්‍රමාණය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 1,093 ක විදේශීය විනිමය ද්‍රවශීලතාවයක් සැපයීම හේතු විය. කෙසේ වුවත්, වසරේ දෙවන භාගය තුළ දී එ.ජ. ඩොලර් මිලියන 325 ක ශුද්ධ අවශෝෂණයක් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාවය සැපයීම සීමා කිරීම හේතුවෙන් රුපියල වැඩි වේගයකින් අවප්‍රමාණය විය. වසරේ දෙවන භාගය තුළ වෙළඳපොළ වෙත සපයන ලද විදේශීය විනිමය ප්‍රමාණයෙන් සැලකිය යුතු කොටසක් විශේෂයෙන්ම, වසරේ අවසාන කාර්තුවේ දී විදේශීය ආයෝජකයින් විසින් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සිය ආයෝජන ඉවත් කර ගනු ලැබීම හේතුවෙන් ඇති වූ බලපෑම යම් ප්‍රමාණයකට අඩු කිරීම සඳහා යොමු විය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාතික ඉහළ දමනු ඇතැයි වූ අපේක්ෂාව සහ ඉන් අනතුරුව පොලී අනුපාත ඉහළ දැමීම, විදේශීය ආයෝජකයින් රාජ්‍ය



**5.13 රූප සටහන**

**විනිමය අනුපාතිකයේ වෙනස්වීම්**




(අ) කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය 2013 ට යාවත්කාලීන වීම සමඟ මූ.ස.වි.අ. නැවත ගණනය කර ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ආයෝජන ඉවත් කර ගැනීම සඳහා හේතු විය. මෙම ප්‍රවණතා හේතුවෙන්, 2016 වසර අවසාන වන විට සමස්තයක් ලෙස, ශ්‍රී ලංකා රුපියල එ.ජ.ඩොලරයට සාපේක්ෂව 2015 වසර අවසානයේ වාර්තා වූ රුපියල් 144.06 සිට රුපියල් 149.80 දක්වා සියයට 3.83 කින් අවප්‍රමාණය විය. තව ද, එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය 2016 වසරේ දී රුපියල් 145.60 දක්වා සියයට 6.64 කින් අවප්‍රමාණය විය. මෙම අවප්‍රමාණය වීමේ ප්‍රවණතාවය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන්ට අනුකූලව වූ අතර, භාණ්ඩ අපනයන අඩු වීමත්, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් මන්දගාමී වීමත් සමඟ මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ විදේශ විනිමය ලැබීම්, ආනයනවල වැඩි වීම සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් මගින් ඇති වූ ඉල්ලුම ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවීය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත විදේශ විනිමය සැපයීම විදේශීය සංචිත පහළ යෑමට හේතු විය. එබැවින්, බාහිර කම්පන මගින් රටට ඇති විය හැකි අවදානම් තත්ත්වයන් අවම කිරීම සඳහා විදේශීය සංචිත මට්ටම නැවත වර්ධනය කර ගැනීම බෙහෙවින් වැදගත් වේ.

**එක්සත් රාජධානිය යුරෝපා හවුලෙන් ඉවත් වීම සඳහා 2016 වසරේ ජූනි මස 23 දින පැවති ජනමත විචාරණයෙන් අනතුරුව විශාල වශයෙන් අවප්‍රමාණය වූ ස්ටර්ලින් පවුමට සාපේක්ෂව හැරුණු විට, 2016 වසර තුළ දී, අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය.** ඒ අනුව, ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එ.ජ.ඩොලරයට සාපේක්ෂව අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා රුපියල යුරෝවලට සාපේක්ෂව සියයට 0.32 කින් ද, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 1.72 කින් ද, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 7.05 කින් ද අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 16.04 කින් අතිප්‍රමාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රුපියල 2016 වසරේ දී වි.ගැ.හි.වලට සාපේක්ෂව සියයට 0.87 කින් අවප්‍රමාණය විය.

### 5.11.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**2016 වසරේ දී ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා රුපියලෙහි තරගකාරිත්වය පහළ යෑම පිළිබිඹු කරමින් මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක (2010 = 100) අතිප්‍රමාණය විය.**

**5.14 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍ය | |
| | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| යුරෝ | 159.42 | 157.37 | 157.87 | 173.47 | 150.84 | 161.16 | 1.30 | -0.32 | 15.00 | -6.40 |
| ඉන්දියානු රුපියල් | 2.07 | 2.17 | 2.21 | 2.14 | 2.12 | 2.17 | -4.62 | -1.72 | 1.12 | -2.25 |
| ජපන් යෙන් | 1.10 | 1.20 | 1.29 | 1.24 | 1.12 | 1.34 | -8.20 | -7.05 | 10.08 | -16.48 |
| බ්‍රිතාන්‍ය පවුම් | 204.04 | 213.57 | 184.04 | 215.16 | 207.99 | 197.15 | -4.46 | 16.04 | 3.45 | 5.50 |
| එක්සත් ජනපද ඩොලර් | 131.05 | 144.06 | 149.80 | 130.56 | 135.94 | 145.60 | -9.03 | -3.83 | -3.96 | -6.64 |
| විශේෂ ගැනුම් හිමිකම් | 189.86 | 199.63 | 201.38 | 198.35 | 190.16 | 202.39 | -4.89 | -0.87 | 4.31 | -6.04 |
| සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2010 = 100) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍ය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍ය දර්ශකය | |
| | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 96.44 | 93.53 | 92.64 | 91.99 | 96.61 | 92.46 | -3.02 | -0.95 | 5.02 | -4.29 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව (ඈ) | 107.87 | 107.28 | 110.18 | 103.77 | 109.50 | 106.94 | -0.55 | 2.70 | 5.52 | -2.34 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට එරෙහිව අඩු වීම පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම හෝ පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

(ඈ) කොළඹ පරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය 2013 ට යාවත්කාලීන වීම සමඟ මූ.ස.වි.අ. නැවත ගණනය කර ඇත.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නාමික විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම්වලට අමතරව රටවල් අතර උද්ධමන වෙනස්වීම් සැලකිල්ලට ගැනෙන මූර්ත සඵල විනිමය අනුපාතිකය, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය යාවත්කාලීන වීමට අනුකූලව (2013 = 100) නැවත ගණනය කරන ලදී. ඒ අනුව, මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක වසර අවසාන වන විට පිළිවෙළින් සියයට 2.83 කින් සහ සියයට 2.70 කින් අතිප්‍රමාණය විය. 2016 වසර තුළ, වෙළඳ හවුල්කාර සහ තරගකාරී රටවල්වලට සාපේක්ෂව ඉහළ දේශීය උද්ධමනයක් පැවතීම මූර්ත සඵල විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීමට හේතු විය. මේ අතර, වසර තුළ දී මුදල් වර්ග 5 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය සියයට 0.23 කින් සුළු වශයෙන් අතිප්‍රමාණය වූ අතර මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය සියයට 0.95 කින් සුළු වශයෙන් අවප්‍රමාණය විය.

### 5.11.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

**2016 වසරේ දී දේශීය විදේශීය විනිමය වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය ඉහළ ගියේය.** ඒ අනුව, 2016 වසරේ දී අන්තර් බැංකු මුළු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 13,600 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 14,780 ක් දක්වා වර්ධනය විය. 2015 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,867 ක් වූ එතැන් වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය, 2016 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,072 ක් (මුළු ගනුදෙනුවලින් සියයට 41.1) දක්වා අඩු වුව ද, 2016 වසරේ දී වූ ඉදිරි වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 6,732 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 8,709 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. මේ අතර, 2016 වසර තුළ දී විදේශ විනිමය සඳහා ඉල්ලුම සහ සැපයුම අතර වූ නොගැළපීම හමුවේ විදේශ විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණය වීම පාලනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වූ අතර, එහිදී ශුද්ධ පදනම මත සපයන ලද විදේශ විනිමය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 768 ක් විය. මෙය, එ.ජ. ඩොලර් මිලියන 1,132 ක් වෙළඳපොළෙන් අවශෝෂණය කර ගැනීමකින් සහ එ.ජ. ඩොලර් මිලියන 1,900 ක් වෙළඳපොළට සැපයීමකින් සමන්විත විය. කෙසේ වුවත්, 2015 වසර තුළ එ.ජ. ඩොලර් මිලියන 3,429 ක සැපයීමකින් සහ එ.ජ. ඩොලර් මිලියන 179 ක අවශෝෂණය කර ගැනීමකින් දේශීය විදේශ

**5.14 රූප සටහන**
**කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්**




විනිමය වෙළඳපොළට වූ මැදිහත් වීමට සාපේක්ෂව, 2016 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත් වීම අඩු මට්ටමක පැවතුණි. වසරේ දෙවන භාගය තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ආයෝජනය කළ අනේවාසික විදේශීය ආයෝජකයින් වෙතින් ඇති වූ ඉල්ලුමෙන් කොටසක් සැපිරීමට පමණක් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මැදිහත්වීම සීමා කිරීම, 2016 වසර තුළ දී ශුද්ධ පදනම මත විදේශ විනිමය සැපයීම අඩු වීමට හේතු විය.

**2016 වසර තුළ කෙටිකාලීනව විනිමය අනුපාතිකය අවප්‍රමාණය වනු ඇතැයි යන වෙළඳපොළ අපේක්ෂාව, ඉදිරි විනිමය ගනුදෙනුවල අධි මිල වෙනස් වීම සහ වාණිජ බැංකුවල ශුද්ධ අනාවරණ තත්ත්වය මගින් පිළිබිඹු විය.** ඒ අනුව, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වනු ඇතැයි යන වෙළඳපොළ අපේක්ෂාව පිළිබිඹු කරමින්, 2016 වසරේ දී මාසයක් සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි මිල සාමාන්‍ය පොලී අනුපාතික අන්තරයට වඩා ඉහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවත්, ඉදිරි කාලයේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත වන විදේශ විනිමය ලැබීම් ඉහළ යනු ඇතැයි යන අපේක්ෂාව පිළිබිඹු කරමින්, මාස තුන සහ මාස හය සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධි මිල සාමාන්‍ය පොලී අනුපාතික අන්තරයට වඩා පහළ මට්ටමක පැවතුණි. මේ අතර, වසර තුළ දී සමස්තයක් ලෙස ධන මට්ටමක පවත්වා ගනු ලැබූ වාණිජ බැංකුවල ශුද්ධ අනාවරණ තත්ත්වය මගින් ද කෙටි කාලීනව එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වනු ඇතැයි යන අපේක්ෂාව පිළිබිඹු කෙරිණි.

5

විශේෂ සටහන 8

## විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් ශ්‍රී ලාංකික පරිචය - විනිමය පාලනයන්හි විකාශනය, ලිහිල්කරණයන් සහ ඉදිරි දැක්ම

### 1. හැඳින්වීම

ස්වයංපෝෂිතවීම සඳහා බොහෝ රටවලට ශක්‍යතාවයක් නොමැති වන්නාසේම එය ප්‍රායෝගික නොවන්නක්ද බැවින් යම් රටක් ගෝලීය ආර්ථිකයට විවෘත කිරීම එනම් කොතරම් දුරට විදේශ විනිමය ප්‍රවාහයන් නිදහසේ ගලායාමට ඉඩ දෙනවාද යන්න සුවිශේෂී සාර්ව ආර්ථික ප්‍රතිපත්තියකි. ඒ අනුව, නේවාසිකයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම/විකිණීම හෝ අනේවාසිකයන් විසින් දේශීය මුදල් මිලදී ගැනීම/විකිණීම කොතරම් දුරට සිදු කරන්නේද යන්න, තම රටේ මුදල් ඒකකය සහ බාහිර සංචිත ආරක්ෂා කර ගැනීමේ අරමුණ පෙරදැරිව රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් තීරණය කරනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ විනිමය පාලනය කිරීම හෝ ලිහිල් කිරීම සිදුවේ.

### 2. ශ්‍රී ලාංකික පරිචය

ශ්‍රී ලංකාව 1944 දී විනිමය පාලනයන් හඳුන්වා දෙන ලදී. දෙවන ලෝක යුධ සමයේදී විනිමය පාලන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එවකට පැවති අවශ්‍යතාවයන්ට අනුව, එය නොයෙකුත් වෙනස්කම්වලට භාජනය විය. අවස්ථා දෙකකදී එහි මෙහෙයුම්, ආනයන හා අපනයන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ කර, දෙපාර්තමේන්තු දෙකෙහිම වගකීම් එක් නිලධාරියෙකු වෙත පවරන ලදී. මහ බැංකුව පිහිටුවන අවස්ථාවේදී, විනිමය පාලනය මහජනතාවගේ පෞද්ගලිකත්වය කෙරෙහි සෘජුවම හා පුළුල්ව බලපාන බැවින් එය අවසාන වශයෙන් රජයේ වගකීමක් ලෙස පැවතීම වඩා යෝග්‍ය බව සැළකිණි. එබැවින්, මුදල් අමාත්‍යංශය යටතේ එවකට පැවති විනිමය පාලන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව භාරගත යුතු බව මුදල් අමාත්‍යවරයාට නිර්දේශ කරන ලදී. ඒ අනුව, 1950 දී මහ බැංකුව පිහිටුවන අවස්ථාවේදී විනිමය පාලන දෙපාර්තමේන්තුව මහ බැංකුව යටතට ගෙනෙන ලදී. විනිමය පාලනයේ වර්මාන නීතිය වන 1953 අංක 24 දරන විනිමය පාලන පනත 1953 අගෝස්තු 15 වන දින නීතිගත කරන ලදී. විනිමය පාලන පනතේ මූලික විධිවිධානයන් පහත පරිදි වේ.

අ. මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන විධානයන් යටතේ විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමෙහිලා රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වගකීමට බැඳේ.

ආ. විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත. ඒ අනුව, විනිමය පාලන පනතේ ඕනෑම ප්‍රතිපාදනයක් මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම අවශ්‍ය යැයි නියම කෙරෙන්නා වූ හෝ අධිකාරිය ලබා දෙනු ලැබූ ඕනෑම බලයන්, රාජකාරීන් සහ කාර්යයන්, අධිපතිතුමාගේ විධානයන් හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් විනිමය පාලක හෝ ඔහු වෙනුවෙන් වෙනත් බලයලත් නිලධාරියෙකු වෙත බලය පැවරේ.

ඇ. විනිමය පාලන පනත යටතේ එවැනි අවසරයන් ලබාදීමේ අධිකාරිය අදාළ විධානයන් නිකුත් කිරීම හරහා බලයලත් වෙළෙන්දෙකු හට පැවරීමට විනිමය පාලකට හැකියාව ඇත. බලයලත් වෙළෙන්දෙකු ලෙස කටයුතු කිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් ඕනෑම වාණිජ බැංකුවක් සඳහා අධිකාරිත්වය ලබා දිය හැක.

ඈ. ශ්‍රී ලංකාවේ නේවාසිකයන් හා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් අතර සිදු වන ගනුදෙනු සහ ශ්‍රී ලංකාව තුළ හා ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන විදේශ විනිමය හා සම්බන්ධ ගනුදෙනු සඳහා පූර්ව අවසරය ලබාගත යුතුය. එවැනි අවසරයන් මගින් රත්‍රන්, මුදල් නෝට්ටු, සුරැකුම්පත්, ණය ගෙවීම්, දේපළ සහ ආනයන/අපනයන පැවරීම් ආදිය ආවරණය වේ.

ඉ. බොහෝ අවස්ථාවන්හිදී එකී අවසරයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදිය යුතු අතර ඇතැම් අවස්ථාවකදී, මුදල් අමාත්‍යවරයා විසින් අවසරය ලබාදිය යුතු වේ.

ඊ. විනිමය පාලන පනත යටතේ ප්‍රදානය කෙරෙන ඕනෑම අවසරයක්, අනුමැතියක් හෝ අධිකාරියක්, පොදු හෝ විශේෂ, නියත හෝ කොන්දේසිගත, අවලංගු කිරීම හෝ වෙනස් කිරීම හෝ නැවත අලුත් කිරීම නොකරන්නේනම් නියත කල් පිරීමේ දිනයකින් සමන්විත විය හැකිය.

උ. ඕනෑම විදේශ වත්කම් රඳවා ගැනීමක්/අත්පත් කර ගැනීමක්/බැහැර කිරීමක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කළ යුතුය.

ඌ. විනිමය පාලන පනතේ විෂයපථය යටතට ගැනෙන කාරණා සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටීමට සහ පරිශ්‍රයන් සෝදිසි කිරීමට විනිමය පාලකට හැකිය.

එ. විනිමය පාලන පනතේ විධිවිධානයන් උල්ලංඝනය කිරීමක් පිළිබඳ විමර්ශනය කිරීමට හා එවැනි වරදකරුවන්ට එරෙහිව දඩ මුදල් පැනවීමට හෝ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකිය.

ඒ. මුදල් අමාත්‍යවරයා විසින් පනතේ මූලධර්ම හා ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි රෙගුලාසි සැකසීම කළ හැකිවේ.

ඔ. මහ බැංකුවේ තීරණයක් පිළිබඳ සෑහීමකට පත් නොවන ඕනෑම අයෙකුට අමාත්‍යවරයා වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

## 3. ශ්‍රී ලංකාවේ විනිමය පාලනයන් ලිහිල් කිරීමේ ප්‍රධාන සංධිස්ථානයන්

3.1. ගෙවුම් ශේෂය හා සම්බන්ධ ගැටළුවලට විසඳුම් සෙවීමේ අරමුණින්, 1961 දී දැඩි විනිමය පාලන ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ආනයන හා අපනයන පාලක විසින් විනිමය අවසරපත් ලෙස භාවිතයට ගැණුනු බලපත්‍ර නිකුත් කරන ලදී. සියලු ආනයන හා අපනයන නිශ්චිත රෙගුලාසිවලට යටත් විය. අත්‍යාවශ්‍ය අයිතම ලෙස වර්ග කරන ලද භාණ්ඩ පමණක් ආනයනය සඳහා අවසර ලබා දී තිබුණි.

3.2. 1970 සිට 1977 දක්වා, විනිමය හා ආනයන පාලනයන්ට අමතරව ද්විත්ව විනිමය අනුපාත ක්‍රමයක් පැවතුණි. මෙම ක්‍රමය යටතේ, අත්‍යාවශ්‍ය අයිතම නිල විනිමය අනුපාතයක් යටතේ ආනයනය කිරීමට ඉඩ ලබාදුන් අතර අනෙකුත් ආනයනයන් ඉහළ විනිමය අනුපාතයන් යටතේ සිදු කළයුතු විය.

3.3. 1977 නොවැම්බර් මාසයේදී, විවෘත ආර්ථික ප්‍රතිපත්ති යටතේ හඳුන්වාදුන්, නව රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණවල කොටසක් ලෙස විනිමය අනුපාත ක්‍රමය ලිහිල් කරන ලදී. මෙම අවස්ථාව, ජංගම ගිණුම ලිහිල් කිරීමේ මූලාරම්භය ලෙස සැළකේ.

3.4. ජංගම ගිණුම ලිහිල් කිරීමේ කටයුතු 1993 දී වඩාත් වේගවත් වූ අතර, 1994 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම්ගත කොන්දේසින්හි (සම්මුතීන්) VIII වන ඡේදය පිළිගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 1994 දී සියලුම ජංගම ගිණුම් ගනුදෙනු ලිහිල් කරන ලදී. ඒ අනුව, කිසිදු විනිමය බාධාවකින් තොරව එවන් ගනුදෙනු සඳහා විදේශ විනිමය නිදහස් කිරීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු (එනම් විදේශ විනිමය සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන්) හට අවසර ලබා දෙන ලදී.

3.5. ජංගම ගිණුම ලිහිල් කිරීමෙන් අනතුරුව, ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සිදු කිරීමේ දී ඉහළ කාර්යක්ෂමතාවයක් ළඟා කර ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනු ද ක්‍රමිකව ලිහිල් කර ඇත.

## 4. විනිමය පාලන පනත යටතේ මේ වන විට සිදු කර ඇති ලිහිල්කරණයන්[1]

4.1. ඉල්ලීම්වල සද්භාවය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව, සියලු ජංගම (ප්‍රාග්ධන නොවන) ගනුදෙනු සඳහා බාධාවකින් තොරව විදේශ විනිමය නිදහස් කිරීම පිණිස බලයලත් වෙළෙඳුන් එනම්, බලපත්‍රලාභී වාණිජ බැංකු හට අවසර ඇත. ජංගම ගිණුම් ගනුදෙනු යන්නට, වෙළෙඳ භාණ්ඩ ආනයනය හා අපනයනය සඳහා කරන ගෙවීම්, අධ්‍යාපන සහ වෛද්‍ය ප්‍රතිකාර ඇතුළු ඕනෑම අරමුණක් වෙනුවෙන් කරනු ලබන පිටරට සංචාර සහ සේවා වෙනුවෙන් කරන ගෙවීම්, පිටරට පදිංචි යැපෙන්නන් වෙනුවෙන් කරනු ලබන ප්‍රේෂණ, ලාභ, ලාභාංශ, පොළී, කුලී ආදායම් ආදිය ප්‍රේෂණය කිරීම, නැව් සේවා, ගුවන් සේවා හා ගැල්කුලී හා සම්බන්ධ ගෙවීම් ආදිය ඇතුළත් වේ.

4.2. සංචාරක අරමුණු සඳහා ලබාගෙන ප්‍රයෝජනයට නොගෙන ලංකාවට රැගෙන ආ විදේශ ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකාවෙන් පිටතදී ලද විදේශ ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකු හට සපයන ලද සේවා වෙනුවෙන් ලද විදේශ ව්‍යවහාර මුදල් හෝ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් විසින් එම ගිණුම්වලින් ආපසු ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල්, එ.ජ. ඩොලර් 10,000 ක් දක්වා තමා සන්තකයේ රඳවා ගත හැක.

4.3. අනේවාසිකයන්ට සපයන ලද භාණ්ඩ හා සේවා වෙනුවෙන් ගෙවීම් වශයෙන් ලැබෙන විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීමට නේවාසිකයන් හට අවසර ඇත. එසේ භාර ගන්නා ලද මුදල්, විකිණීමේ දින සිට දින 7ක් දක්වා තමා සන්තකයේ රඳවා ගත හැකි අතර ඉන්පසුව විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමකට බැර කිරීම හෝ බලයලත් වෙළෙන්දෙකු හට විකිණීම සිදු කළ යුතුය.

4.4. විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පවත්වාගෙන යනු ලබන පුද්ගලයන් හට ඕනෑම අරමුණක් වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදලින් ණය ගැනීමට අවසර ඇති අතර, අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යනු ලබන සංක්‍රමණික සේවකයින්, ද්විත්ව පුරවැසියන් හා වෙනත් රටක ස්ථිර නේවාසික වීසා හිමි පුද්ගලයන් හට නිවාස අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ණය ලබාගත හැක. අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමි සංක්‍රමණික සේවකයන් හට ඕනෑම අරමුණක් වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල්වලින් ද ණය ලබාගත හැක.

4.5. විදේශ ව්‍යවහාර මුදල් ඕනෑම ප්‍රමාණයක් ලංකාවට රැගෙන ඒමට ඕනෑම පුද්ගලයෙකු හට අවසර ඇති අතර එහි සමස්ත වටිනාකම එ.ජ. ඩොලර් 15,000 ඉක්මවන්නේ නම් හෝ එම පුද්ගලයා විසින් එ.ජ. ඩොලර් 5,000 ට වැඩි ප්‍රමාණයක් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් ආපසු රැගෙන යාමට අදහස් කරන්නේ නම් එම වටිනාකම ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කළ යුතුය.

4.6. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු විසින් විදේශ ව්‍යවහාර මුදල් ඕනෑම ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යාහැකි අතර එහි සමස්ත

1 මෙම ලිහිල්කරණයන් පිළිබඳව සම්පූර්ණ විස්තර සහ අදාළ වගන්ති හා කොන්දේසි සවිස්තරව දැනගැනීම පිණිස අදාළ මෙහෙයුම් උපදෙස්/විධානයන්/චක්‍රලේඛයන් කියවා බැලිය යුතුය.

වටිනාකම එ.ජ. ඩොලර් 10,000 ඉක්මවන්නේ නම් හෝ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් සමන්විත වන ප්‍රමාණය එ.ජ. ඩොලර් 5,000 ඉක්මවන්නේ නම් ඒ පිළිබඳ ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කළ යුතුය.

4.7. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු හට රු. 20,000 දක්වා ශ්‍රී ලංකා රුපියල් අපනයනය කිරීමට හා ආනයනය කිරීමට අවසර ඇත.

4.8. පහත පුද්ගලයන් හට ශ්‍රී ලංකාවෙන් පිටත බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට හැක.

අ. ව්‍යාපාර, අධ්‍යයන හෝ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැර වූ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙක්

ආ. ශ්‍රී ලංකාවෙන් පිටතට වෘත්තීමය සේවාවන් සපයන තැනැත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක්/ආයතනයක්

ඇ. ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් අවසර ලබාදුන් තැනැත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගමක්/ආයතනයක්

ඈ. වෙළෙඳ භාණ්ඩ අපනයනකරුවෙක්

ඉ. වෙනත් රටක වලංගු නිත්‍ය නේවාසික බලපත්‍රයක් ලබාගෙන ඇති තැනැත්තෙක්

ඊ. ද්විත්ව පුරවැසියෙක්

උ. අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටකට යාමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු හට එකී රටේ වීසා අනුමත කරන අධිකාරිය විසින් ශිෂ්‍ය වීසා ලබා ගැනීමේ අරමුණ වෙනුවෙන් එම රටේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම අවශ්‍ය යැයි නියම කරන අවස්ථාවකදී එවන් පුද්ගලයෙක්

4.9. අනේවාසිකයන් සමග ශ්‍රී ලංකාව තුළදී පහත සඳහන් ගනුදෙනු කිරීමට නේවාසිකයන් හට අවසර ඇත.

අ. කොටස් නිකුත් කිරීම හා පැවරීම සම්බන්ධයෙන් අනේවාසිකයන් හට ගෙවීම් කිරීමට හා ඔවුන්ගේ ගෙවීම් ලැබීමට

ආ. අවසරලත් පුද්ගලයන් විසින් ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද බැඳුම්කර මිලදී ගැනීමට, පැවරීමට හා ඒවාට අදාල ගනුදෙනු සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට

ඇ. රුපියල්වලින් නාමනය කරන ලද භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් විදේශ පුරවැසියන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාපිත ආයතනවලට හා විදේශීය ආයතනික ආයෝජකයන් හට ගෙවීම් කිරීමට

ඈ. අවසරලත් පුද්ගලයන් විසින්, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට, පැවරීමට හා ඒ සම්බන්ධ ගෙවීම් කිරීමට

ඉ. ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක් මත ක්‍රියාත්මක වන ඒකක භාරයක ඒකක, ගැසට් නිවේදනයේ සඳහන් කර ඇති තැනැත්තන් හට නිකුත් කිරීමට, පැවරීමට සහ ඒ සම්බන්ධ ගෙවීම් කිරීමට

ඊ. ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත අනුව විශේෂයෙන් සඳහන් කරන ලද ව්‍යාපාර ආයතනයක් ලෙස වර්ගීකරණය කර ඇති සමාගමක ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කර ඇති, ගෙවා නිදහස් කළහැකි වරණීය කොටස්, ගැසට් නිවේදනයේ සඳහන් කර ඇති ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට නිකුත් කිරීමට හා පැවරීමට

උ. ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කර ඇති ලැයිස්තුගත හා ලැයිස්තුගත නොකළ ණයකර අනේවාසික ආයෝජකයන්ට නිකුත් කිරීමට හා පැවරීමට

ඌ. නිශ්චල දේපළ සම්බන්ධයෙන් අනේවාසිකයන්ට ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් කිරීමට

එ. අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් විසින් ඕනෑම අරමුණක් වෙනුවෙන්, එනම්, සුරැකුම්පත් අත්කර ගැනීමට හා වෙනත් ඕනෑම ප්‍රාග්ධන හා ජංගම ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙවීම් කිරීමට

4.10. ණය/හර කාඩ්පත් භාවිතා කරමින් පෞද්ගලික භාවිතය වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්ට විදේශ විනිමයෙන් ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ නේවාසිකයින්ට අවසර ඇත.

4.11. බැහැර කිරීම් හා සීමා කිරීම්වලට යටත්ව ශ්‍රී ලංකාව තුළ ඇතැම් ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල නියැලීමට විදේශ සමාගම් හට අවසර ඇත.

4.12. ශ්‍රී ලංකාවෙන් පිටත වාසිකයන්ගෙන් ණය ලබා ගැනීම සඳහා දේශීයව සංස්ථාපිත සමාගම් හට අවසර ඇත.

4.13. පනවා ඇති සීමා කිරීම්වලට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත අවසරලත් ක්ෂේත්‍රයන්හි ආයෝජනය කිරීම සඳහා නේවාසිකයන්ට අවසර ඇත.

4.14. විදේශ කාර්යාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අරමුදල් ප්‍රේෂණය කිරීමට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් සහ හවුල් ව්‍යාපාර සඳහා අවසර ඇත.

4.15. ආවෘත ගිණුම්වල පවත්නා අරමුදල් ප්‍රේෂණය කිරීම

- වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය ලබාගෙන ඇති ශ්‍රී ලාංකිකයෙකුට:
  - මූලික සංක්‍රමණික දීමනාව ලෙස එ.ජ. ඩොලර් 150,000 ක් ද, ඉන්පසුව වාර්ෂික

දීමනාව ලෙස එ.ජ. ඩොලර් 20,000 ක් ද ප්‍රේෂණය කළහැක.

- සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල්, පාරිතෝෂික දීමනා ඇතුළු අනෙකුත් සියලුම විශ්‍රාමික ප්‍රතිලාභ සහ වර්තන ආදායම් ආවෘත ගිණුමක් හරහා නිදහසේ ප්‍රේෂණය කළ හැක.

- විජාතිකයන් විසින් වාර්ෂිකව එ.ජ. ඩොලර් 20,000 ක් දක්වා මුදලින් ප්‍රේෂණය කළහැක.

4.16. ශ්‍රී ලංකාව තුළ රත්‍රන් මිලදී ගැනීමට හා විකිණීමටත් ශ්‍රීලංකාවෙන්රත්‍රන්අපනයනයකිරීමටහාශ්‍රීලංකාවට රත්‍රන් ආනයනය කිරීමටත් ශ්‍රී ලංකාවේ සිටින ඕනෑම පුද්ගලයෙකුට අවසර ඇත. කෙසේවෙතත්, එවැනි ආනයන/අපනයනවල ප්‍රමාණය, වටිනාකම සහ අරමුණ ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ වෙත ප්‍රකාශ කළ යුතුය.

4.17. අධ්‍යාපනික අරමුණු සඳහා විදේශගත වී සිටින ශ්‍රී ලාංකිකයන් හට විදේශ රටවල බැංකු, මූල්‍ය ආයතන, විශ්වවිද්‍යාල හෝ අධ්‍යාපනික ආයතනවලින් ණය ලබා ගැනීමටත් බලයලත් වෙළෙන්දෙකු හරහා ශ්‍රී ලංකාවෙන් අරමුදල් ප්‍රේෂණය කිරීමෙන් එම ණය ආපසු ගෙවීමටත් අවසර ඇත.

4.18. ශ්‍රී ලංකාවේ සේවා නියුක්ත විජාතිකයන් හට වැටුප්, වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ ඇතුළුව ඔවුනට කරනු ලබන ගෙවීම් ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන අවසරලත් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට බැර කිරීමට අවසර ඇත.

**5. ඉදිරි ගමන්මග**

1970 අග භාගයේ සිට ආර්ථික සහ වෙළෙඳ ප්‍රතිපත්ති ලිහිල් කිරීමට අනුගාමීව, ඉහත විස්තර කළ පරිදි දේශාන්තරික ප්‍රාග්ධන ප්‍රවාහයන් සඳහා ක්‍රමිකව අවස්ථාවන් සලසා දී ඇත. ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ සමග ඒකාබද්ධවීමට අවස්ථාවන් සම්පාදනය කරන අතරතුර රට තුළට ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහයන්, විශේෂයෙන්ම දේශීය ආයෝජනයන් සඳහා වන අරමුදල් සම්පාදනය ඉහළ නංවන ලදී. විදේශ ආයෝජන සඳහා වඩාත් යෝග්‍ය කේන්ද්‍රස්ථානයක් ලෙස රටක ආකර්ෂණීයත්වය අනෙකුත් කරුණු අතරින් ප්‍රධාන වශයෙන්ම රඳා පවතිනුයේ එරටේ ප්‍රාග්ධන ගිණුම කොතරම්දුරට විවෘතව පවතින්නේද යන්න මතයි. එබැවින්, පූර්ව අනුමැතීන්, දුෂ්කරතාවයන්, කල්ගත වන ක්‍රියාපටිපාටීන් හා සීමා කිරීම්වලින් තොරව රටින් පිටතට හා රට තුළට අරමුදල් ප්‍රේෂණය කිරීමට ඇති හැකියාව, විදේශ ආයෝජන ප්‍රවර්ධනය සහ ආකර්ෂණය කිරීමෙහිලා වැදගත් සාධකයක් වේ.

ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සිදු කිරීමේදී ඉහළ කාර්යක්ෂමතාවයක් ලබා ගැනීමේ සහ ආර්ථික ක්‍රියාකාරකම්වලට තවදුරටත් පහසුකම් සැලසීමේ අරමුණින් ඉහත සාරාංශගත කළ ආකාරයට ප්‍රාග්ධන ගිණුම සම්බන්ධ විදේශ විනිමය රෙගුලාසි ක්‍රමිකව ලිහිල් කර ඇත. කෙසේවෙතත් රට තුළට ගලා එන ප්‍රාග්ධන ප්‍රවාහයන් හා රටින් පිටතට ගලා යන ප්‍රාග්ධන ප්‍රවාහයන් තවදුරටත් තරමක් බාධාකාරී බවට පොදු මතයක් පවතී. මෙම තත්ත්වයට පිළියම් යෙදීමක් වශයෙන් නව පනතක් හඳුන්වා දෙන බවට පසුගිය අයවැය නිවේදනයන්හිදී රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව, නව විදේශ විනිමය කළමනාකරණ රාමුවක් හඳුන්වාදීම සඳහා වන මූලික කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර, නව විදේශ විනිමය කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට පෙර රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

මූලාශ්‍ර:


ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

1953 අංක 24 දරන විනිමය පාලන පනත

Kumari Jayawardena & Jennifer Moragoda (2008). N.U. Jayawardena "The First Five Decades"

Samarasiri, P. (2008). Exchange Control Liberalization, Measures and Their Economic Impact on the Economy

Sessional Paper XIV – 1949, November 1949 Report on the Establishment of a Central Bank for Ceylon

5